

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ශ්‍රී ලංකා

වාර්ෂික වාර්තාව

2016

GSMB

වාර්ෂික වාර්තාව
2016

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.
දු.ක : 011 2886289 / 0112886290
ෆැක්ස් : 001 2886273
විද්‍යුත් තැපෑල : info@gsmb.gov.lk
වෙබ් අඩවිය : www.gsmb.gov.lk

ආයතනික තොරතුරු

පොදු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ යන ස්ථානයේ පිහිටා ඇත. මාතර, නුවර, කුරුණෑගල, රත්නපුරය, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොනරාගල, අම්පාර, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්තලේ, මඩකලපුව, යාපනය, කළුතර සහ ගම්පහ යන නගරවල ප්‍රාදේශීය කාර්යාල 14ක් පිහිටා ඇත.

දැක්ම හා මෙහෙවර

දැක්ම

භූ විද්‍යාත්මක තොරතුරු ගවේෂණය සහ ව්‍යාප්තිය සිදු කරන බොහෝ සෙයින් කල් පවත්නා ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් කැනීම් ක්‍රියාවලිය නියාමනය කරනු ලබන ප්‍රධාන ජාතික භූ විද්‍යා නියෝජිතායතනය වශයෙන් කටයුතු කිරීම.

මෙහෙවර

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මෙහෙවර වන්නේ ප්‍රතිපත්ති සකස් කරන්නන්ට සහ ජනතාවට භූ විද්‍යා තොරතුරු උපදෙස් හා සේවා සැපයීම සහ අකණ්ඩතාවය පවත්වාගැනීමට වග බලා ගනිමින් ආර්ථික සංවර්ධනය වෙනුවෙන් රටේ ඛනිජ සම්පත් කළමනාකරණය සහ ප්‍රවර්ධනය කිරීමයි. ඛනිජ ගවේෂණය, නිස්සාරණය, වටිනාකම එකතු කිරීම, ප්‍රවාහනය සහ වෙළඳාම නියාමනය කිරීමද එය සිදු කරයි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්යයන්

- ශ්‍රී ලංකාවෙහි ක්‍රමවත් භූ විද්‍යා සිතියම් සැකසීම භාර ගැනීම සහ භූ විද්‍යා සිතියම් සකස් කිරීම.

- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීම.

- ඛනිජ සඳහා පතල් කැනීමේ වාණිජමය ස්වශක්තිතාව පිළිබඳව ඇගයීම සහ ඛනිජ සකස් කිරීම හා අපනයනය කිරීම.ආනයන කරන ඛනිජ සඳහා වාණිජමය ස්වශක්තිතාවය ඇගයීම.

- ඛනිජ ගවේශණ කිරීම,පතල් කැනීම, ගබඩා කිරීම සහ ඒ ඛනිජ සකස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, වෙළඳාම හා අපනයනය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් නිගමය කිරීම.

- ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ෂණය කිරීම,වටිනාකම් එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛණිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම.ඛනිජ නිස්සාරණය හා නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව වාණිජමය පදනමින් උපදෙස් ලබාදීම.

- පනතේ (අ),(ආ) සහ (ඇ) ඡේද යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේදී ලබා ගත් තොරතුරු සහ දත්ත උචිත මාධ්‍ය මගින් පතල කිරීම.

- භූ තාක්ෂණ ඉන්ජිනේරු විෂයන් සම්බන්ධ ව්‍යාපෘති භාර ගැනීම සහ භූ විද්‍යාත්මක ආපදා සහ ව්‍යසන සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් ගතයුතු පියවර පිළිබඳව උපදෙස් ලබාදීම.

පටුන

	පිටු අංක
සභාපතිතුමාගේ පණිවිඩය	07
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	09
කළමනාකාරිත්ව මණ්ඩලය	11
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	11
කාර්යාංශය ගැන	12
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු	14
ඓතිහාසික පසුබිම	15
ආංශයික කාර්යසාධනය	16
භූ විද්‍යා අංශය	**16**
කැනීම් අංශය	**34**
මූල්‍ය සමාලෝචනය	43
නීති අංශය	44
මානව සම්පත් පිළිබඳ සමාලෝචනය	46
ආයතනික පාලනය	47
මූල්‍ය වාර්තා	50
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	56
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	58
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	60
විගණකාධිපති වාර්තාව	78
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	106
විගණන කමිටු වාර්තාව	120
ආයතනික සමාජ වගකීම්	122

සභාපතිතුමාගේ පණිවුඩය

2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් මෙම කෙටි පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම මා හට ඉමහත් සතුටකි. 2016 වර්ෂය තුලදී ලබා ගන්නා ලදසුවිශේෂී ජයග්‍රහණ සිහිපත් කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

2016 වර්ෂය සුවිශාල වෙනස්කම්සිදුවූ වර්ෂයකි. කෙසේවුවද, ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ වුවද සිය ඉතිහාසය තුළ ඉහළම පිරිවැටුම ලබා ගැනීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හැකි වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම තුළ ඇති වූ වර්ධනය රු. 567,703,967.00කි. ඒ අනුව සිය කාර්යයන් තුලින් රු. 2,283,508,758.00 ක මුදලක් කාර්යාංශය විසින් උපයා ගන්නා ලද අතර භාණ්ඩාගාරයටද රු. මිලියන 1010ක මුදලක් ලබා දීමට හැකිවිය.

ශ්‍රී ලංකාවේ කැනීම් හා සැකසීම් කටයුතු හා සම්බන්ධ පාරිසරික හා සමාජ විද්‍යාත්මක ගැටළු සඳහා විසඳුම් ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ බනිජ සම්පත් කැනීම හා සැකසීම වඩාත් තිරසාර ආකාරයකින් නියාමනය කරනු ලබන සහ භූ විද්‍යාත්මක තොරතුරු සපයා දෙන සහ ඒවා ප්‍රචාරණය කරනු ලබන ප්‍රමුඛතම ජාතික භූ විද්‍යා ආයතනය බවට පත්වීම අපගේ දැක්මවේ.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ ඇති වී ඇති වර්ධනය අද බොහෝ විට කථාබහට ලක් වී ඇති කරුණකි. නිවාස සඳහා ඇති ඉල්ලුම ඉහළයාම සහ අළුත් නිවාස ව්‍යාපෘති සඳහා රජය විසින් සහන ලබාදීම හේතු කොටගෙන විශේෂයෙන්ම නිවාස ඉදිකිරීම් අංශය ශීඝ්‍ර වර්ධනයක් ලබාගෙන ඇත. කාර්යාල සඳහා ඇති ඉඩකඩ පහසුකම් අඩුවීම හේතුවෙන් අහස සිප ගන්නා ගොඩනැගිලි සෑදීම හතු පිපෙන්නාක් මෙන් වර්ධනය වී ඇත. ඒ අනුව ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය ගංගා වැලි හා ගල් සහ අනිකුත් අමුද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම සුවිශාල ලෙස ඉහළ ගොස් ඇත. ගංගාවල වැලි කැනීම හේතුවෙන්, ගංගා ඉවුරු බාදනය වීම, ගංගා පතුල හායනයට ලක් වීම, ගංගා ආරක්ෂක කලාප තුළ මිනිසුන් ක්‍රියාකාරකම් ඇතිවීම, ගංගා ජලයේ ගුණාත්මක භාවය විනාශවීම, භූගත ජලය හානියට ලක් වීම, මුහුදු ජලය ගංගා තුළට ඇතුළුවීම සහ ගංගා ජලයේ ලවණතාවය ඉහළ යෑම වැනි ගැටළු ඇතිවන අතර එමගින් ජාතික ජල සැපයුම් පද්ධතියටද සංග්‍රාම බලපෑමක් ඇතිවේ.

සිමෙන්ති නිෂ්පාදනය හා අනෙකුත් කර්මාන්ත සඳහා හුණුගල් නිස්සාරණය කිරීම ශ්‍රී ලංකාවට ආර්ථික වශයෙන් වැදගත් වන අතර මෙය දිගු කාලයක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ පැවති ඇත. කෙසේවුවද එමගින් ආර්ථික සංවර්ධනය කෙරෙහි සුවිශේෂී දායකත්වයක් ලබාදුන්නද, නිසි සැලසුමකින් තොරව සහ නවීන තාක්ෂණය හා විද්‍යාත්මක ක්‍රම යොදා ගනිමින් හුණුගල් නිස්සාරණය කිරීම තුලින් හුණු කුඩු පරිසරයට එකතු වීම, වැසිකාලය තුළදී පතල් වලවල් තුළ ජලය එක්රැස් වීම තුලින් මදුරුවන් බෝවීම වැනි අහිතකර බලපෑම් සහ ශ්වසන පද්ධතියෙහි ඇතිවන උග්‍ර ආසාදයනයන්, ඇස් හා කන්වල ආසාදනයන් සහ කැස්ස හා නියුමෝනියා වැනි වෙනත් සෞඛ්‍ය ගැටලු ඇති වී ඇත.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ඇති අවශ්‍යතාවය සපුරාදීම සඳහා ගල් කැඩීම සිදු කිරීමද ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශ තුළ සුලභව දක්නට ලැබේ. කෙසේ වුවද ගල් කැඩීම හේතුවෙන් බරපතල පාරිසරික හානියක් සහ සමාජ ආර්ථික ගැටලු මතු වේ. භූමියේ හැඩය වෙනස්වීම, ප්‍රදේශයේ පෙව විවිධත්වයට බලපෑමක් ඇති වන ලෙස කඳු කැපීම, නිෂ්ඵල නිසරුබිම් නිර්මාණය වීම, දූවිලි ඇතිවීම, ශබ්ද දූෂණය, නීතිවිරෝධී ලෙස භූමියෙන් ගල් ඉවත් කිරීම, හදිසිඅනතුරු සිදුවීම, සමහර ප්‍රදේශ තුළ ජල චක්‍රය පහතට වැටීම සහ දූවිලි හා අධික ශබ්දය ඇතිවීම ආදිය මෙමගින් ඇතිවන ප්‍රධානතම පාරිසරික හා සමාජ ආර්ථික ගැටළු කිහිපයකි.

කෙසේ වුවද, ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමට අදාල එකී ගල් කැඩීම් සහ කැනීම් කටයුතු සියල්ල තහනම් කිරීම අපහසුවන අතර දැනට පවතින පාරිසරික හා සමාජ විද්‍යාත්මක ගැටළු සැලකිල්ලට ගෙන තිරසාර කැනීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අද දවසේ අවශ්‍යතාවයකි.

2016 වර්ෂය තුලදී පතල්කැනීම් සහ කළුගල් කැඩීම් යන කර්මාන්ත අංශය විසින් ජාතික ආර්ථිකයට 3% වැඩි දායකත්වයක් ලබාදෙන ලද අතර එමගින් 12%ට වැඩි වර්ධන අනුපාතයක් සනිටුහන් කරනු ලැබේ. බනිජ අපනයන අංශය ද ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබාදුන්නේය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සමග අනුබද්ධ කිරීම, ශ්‍රී ලංකාවේ පරිසරය හා සියළු ජීවිත ආරක්ෂා කරමින් වඩාත් තිරසාර ලෙස පතල්කැනීම් අංශය දියුණුකිරීම සඳහා ඇති ඉහළ අපේක්ෂාවන් ඔස්සේ සිදුකරන ලද්දකි.

පසුගිය වර්ෂය තුළදී නිමකරන ලද 1: 100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් මත පදනම්ව 1:250,000 පරිමාණයේ භූ විද්‍යාපාදස්ථ සිතියම් හතරක් පළකිරීමට මෙම වර්ෂයේදී භූ විද්‍යා අංශයට හැකිවිය.

මෙම සිතියම් හතර මගින් මුළු දිවයිනම ආවරණය කරනු ලබන අතර අවසානයේදී සමස්ත දිවයිනෙහිම 1:50,000 පරිමාණයේ තනි සිතියමක් ලෙස මෙම සිතියම් යාවත්කාලීන කරනු ඇත. 1:50,000 පරිමාණය චාතුර්ථික සිතියම් 03ක් සහ භූ විද්‍යා අංශය විසින් සකස් කරන ලද එක් පළාත් සිතියමක්ද මෙම වර්ෂයේදී පළකරන ලදී.

2016 වර්ෂය තුළදී රු. 1,564,027,187.46 ක වියදමට පසු ආදායමක් කාර්යාංශය විසින් ලබා ගන්නා ලද අතරකැනීම් අංශය මගින් රු. 2,124,708,452.46 ක් ද භූ විද්‍යා අංශය මගින් රු. 37,994,551.29 ක් ද ආදායම ලෙස ලැබූ අතර ලැබූ අනිකුත් ආදායම රු. 120,805,754.00 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේ ලාභය 50.8% කින් එනම් රු. 1,564,027,187.46 දක්වා වර්ධනය විය. සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයේ ආදායම 33.08%කින් එනම් රු. 2,283,508,758.00දක්වා වර්ධනය විය. (2015 : රු. 1,715,804,791.00) මහා භාණ්ඩාගාරයට රු. මිලියන 1010 ක මුදලක් ලබා දීමටද අපට හැකිවූ බව මා විසින් සඳහන් කරනු ලබනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

කර්මාන්ත හා ඉදිකිරීම් අංශය තුළ තිරසාර ඉලක්කයන් සපුරාගැනීමට දරන ලද අප්‍රතිහත ධෛර්යය වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කළමනාකාරිත්ව මණ්ඩලය හා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මාගේ අතිශය කෘතවේදීභාවය පළකරමි.

ස්තුතියි,
ආචාර්ය කිත්සිරි දිසානායක

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවුඩය

රටෙහි කැනිමි කටයුතු නියාමනය කිරීම සහ විවිධ වර්ගවල භූ විද්‍යාත්මක ලෙස වැදගත් සිතියම් පිළියෙලකිරීම සහ ප්‍රසිද්ධ කිරීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කටයුතු අතරට අයත් වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආයතනික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වන වාර්ෂික ක්‍රියාකාරීසැලැස්ම භූ විද්‍යා අංශය හා කැනීම් අංශය සහ ආයතනයෙහි ප්‍රධාන අංශ දෙක හරහා ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රධාන කාර්යාලය හරහා තම සේවාවන් ලබා දෙනු ලබන ප්‍රාදේශීය කාර්යාල දහසයක් යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. ස්ථානීය පරීක්ෂා කිරීම්, පරීක්ෂණ පිපිරවීම් සිදුකිරීම, මහජන පැමිණිලි විමර්ශනය කිරීම, බනිජ කැනීම.ගවේෂණය හා ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම වැනි කැනීම් ආශ්‍රිත කටයුතු නියාමනය කිරීම පිළිබඳ ප්‍රධානතම වගකීම මෙම ආයතනය වෙත පැවරී ඇත.

2016 වර්ෂය තුළ දී කාර්යාංශය විසින් ශිල්පීය කැනීම් බලපත්‍ර 4037 ක් ද, කාර්මික කැනීම් බලපත්‍ර 2757 ක් ද, ප්‍රවාහන බලපත්‍ර 758,733 පමණද සහ වෙළඳ බලපත්‍ර 269 ක් ද නිකුත් කරන ලදී. සමාජ හා පාරිසරික ගැටළු සහ නීති විරෝධී කැනීම් කටයුතු යන අභියෝගවලට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මුහුණ දෙන ලදී.

2016 වර්ෂය භූ විද්‍යා අංශයට විශේෂ වසරක් වුයේ භූ විද්‍යා සිතියම් (04), චාතුර්ථික සිතියම් (3) සහ පළාත් බනිජ සිතියම් (01) ආදී ලෙස සිතියම් 08 ක් පළ කිරීමට එම වර්ෂය තුළදි හැකියාව ලැබුණු බැවිනි.

සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන භූ විද්‍යා සිතියම් පළ කිරීම කාර්යාංශයේ ප්‍රධානතම කටයුතුවලින් එකක් වේ. භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු භූ විද්‍යා සිතියම් වල අන්තර්ගත වන අතර බනිජ හා භූගත ජලය ගවේෂණය කිරීම, ප්‍රධාන ඉදිකිරිම් හා සිවිල් ඉංජිනේරු කටයුතු සහ නායයෑම් උවදුරු සිතියම් පිලියෙල කිරීම ආදී කටයුතු ගණනාවක් සඳහා මෙම සිතියම් භාවිතාකරනු ලැබේ. සමස්ත දිවයිනම ආවරණය කරමින් 1 : 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් 04 ක් පළ කිරීමට භූ විද්‍යා අංශයට හැකි විය.

වෙරළ අවසාදිතයන්, දියඵ තැන්පතු හා පස් සැකසීම් ඇතුළුව චාතුර්ථික තැන්පතු පිළිබඳ තොරතුරු චාතුර්ථික සිතියම් තුළ අන්තර්ගත වේ. ආර්ථිකමය ලෙස වැදගත් මැටි හා වැලි තැන්පතු, කොරල් තැන්පතු, සශ්‍රික පස් ආවරණයක් සහ භූ ගතජල මූලාශ්‍ර පිලිබඳ විස්තර ඇතුලත් හෙයින් මෙම තොරතුරු අතිශයින්ම සුවිශේෂී වේ. මෙම වර්ෂය තුළදී මධ්‍යම පලාත පිලිබඳ වාර්ෂික බණිජ සිතියම පළ කරන ලදී.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන මගින් පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කරනු ලැබේ. බනිජ ගවේෂණය, පාරිසරික අධික්ෂණය, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. මෙම වැඩසටහන යටතේ ශ්‍රීලංකා භූ රසායනික සිතියමෙහි පළමු වෙළුම සම්පූර්ණ කරන ලදී.

මූල්‍යමය ලෙස සලකා බලන විට දළ වශයෙන් රු. මිලියන 2284 ක සම්පූර්ණ ආදායමක් (කැනීම් අංශය වෙතින් 93%, භූ විද්‍යා අංශය වෙතින් 2% සහ වෙනත් අංශ වලින් 5%) කාර්යාංශය විසින් උපයාගෙන ඇති අතර එම ආදායමෙන් රු. මිලියන 1010 මහා භාණ්ඩාගාරයට ලබා දෙන ලදී.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ආරම්භ කරන ලද දින සිට ඉතිහාසය තුළ වාර්තා කරන ලද ඉහළම පිරිවැටුම මෙය වූ අතර පසුගිය මුල්‍ය වර්ෂය තුළදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් උපයන ලද ආදායමට වඩා රුපියල් මිලියන 600 ක මුල්‍ය වර්ධනයක් ලෙස මෙය දැක්විය හැකිය. ඒ අනුව රු. බිලියන 1.5 ක බදුවලට පසු ලාභයක් කාර්යාංශය විසින් උපයාගෙන ඇත.

නීතිවිරෝධී කැනීම් කටයුතු පිලිබඳ විමර්ශනය කිරීමට සහ ඒවා නතර කිරීමට විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවීම සහ අපගේ නිල වෙබ් අඩවියෙහි අඩංගු කොටු සැලසුම් තුළ පෙන්වනු ලබන සිතියම් සැකසීම සඳහා තම තාක්ෂණය නවීකරණය කිරීම මගින් සේවාදායකයන් හට නිදහස් හා කඩිනම් සේවයක් ලබා දීම සඳහා කාර්යාංශය විසින් දරන ලද උත්සාහයන් හේතු කොට ගෙන මෙලෙස කාර්යාංශයේ ආදායම ඉහළ ගියේය. තම නිෂ්පාදන සහ සේවාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තම තාක්ෂණය තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට කාර්යාංශය අදහස් කරයි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 2016 වර්ෂය තුළදී සුවිශාල ප්‍රගතියක් ලබා ගෙන ඇති බව සඳහන් කිරීමට මම කැමති වෙමි. එලෙසම පසුගිය වර්ෂය තුළදී අප විසින් ලබා ගනු ලැබූ අත්දැකීම් තවදුරටත් ප්‍රගතිය කරා ගමන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට අපට මගක් පෙන්වනු ඇත යන්න මාගේ විශ්වාසයයි. අපගේ ශක්තිය තුළින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආයතනික ඉලක්ක සපුරා ගැනීමට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු.

ඉංජිනේරු ඩී. සප්පන ද සිල්වා
බී එස් සී (ඉංජිනේරු), සිවිල් ඉංජිනේරු විශේෂඥ (ශ්‍රී.ල)
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)



කළමනාකාරිත්ව මණ්ඩලය

සභාපති	: ආචාර්ය කිත්සිරි දිසානායක
සාමාජිකයන්	: ඉංජිනේරු ඩී.සප්පන ද සිල්වා
	: පී.අල්ගම මහතා
	: එන්.කේ.පී.කේ.නැම්මවත්ත මහතා
	: කොල්මන් පී.පෙරේරා මහතා
	: රොහාන් ජයතිලක මහතා
මණ්ඩලයේ ලේකම් / නීති නිලධාරිනි	: එම්.එස්.කේ.ප්‍රනාන්දු මහත්මිය



ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

සභාපති	: ආචාර්ය කිත්සිරි දිසානායක
අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන)	: ඉංජිනේරු ඩී.සප්පන ද සිල්වා
සාමාන්‍යාධිකාරි	: එම්.ඩබ්ලිව්.ජයමාන්න මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ විද්‍යා)	: ආචාර්ය සී.එච්. ඊ.ආර්.සිරිවර්ධන
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පතල්)	: ඉංජිනේරු ඩී.සප්පන ද සිල්වා

කාර්යාංශය ගැන
ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත සඳහා මඟ පෙන්වන්නෝ අපි වෙමු.

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ සේවා සැපයීම සඳහා පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඛනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය වන අතර ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ වගකීම මෙමගින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඛනිජ සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මේ දක්වා ඛනිජ ගවේෂණ කටයුතු සිදු කර ඇති ආයතනය වන අතර එතුළින් රට වෙත ප්‍රතිලාභ සලසා දී ඇත.

ශ්‍රී ලංකාව කුඩා රටක් වන හෙයින් එහි උප පෘෂ්ටි ඛනිජ සම්පත ද කුඩා මට්ටමක පවති. එහෙයින් කාර්යාංශය විසින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම දිරිගන්වන අතරම ඛනිජ අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීම අවධාරණය කරයි. එලෙසම ඛනිජ යනු පුනර්ජනනීය නොවන භාණ්ඩයක් වන හෙයින් එය අපතේ යැවීමට එරෙහිව අනතුරු ඇඟවීම් ද සිදු කරනු ලැබේ.

ජාතියට භූ විද්‍යාත්මක ශක්‍යතාවයන් ලබා දෙන ප්‍රමුඛතමයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පෘථිවියේ ඇති සම්පත් හා ඒ ආශ්‍රිත ගැටළු හා ප්‍රශ්න පිලිබඳව අවබෝධයක් ලබා දෙයි. බහුවිධ වූ විද්‍යාත්මක විශේෂඥ දැනුම මගින් බහු විෂයික ගවේෂණ සිදු කිරීමට අප හට හැකියාව ලබා දෙනු ලබන අතර සම්පත් කළමනාකරුවන්, සැලසුම්කරුවන් සහ අනිකුත් පාරිභෝගිකයින් වෙත භූ විද්‍යා සිතියම් මාලාවක් ඇතුළු භූ විද්‍යා තොරතුරු අපක්ෂපාතී ලෙස ලබා දෙනු ලැබේ.පෘථිවිය පිලිබඳ තොරතුරු ලබා ගැනීම සහ අවබෝධ කර ගැනීම, ස්වාභාවික ආපදා වලින් ජීවිත වලට සහ දේපලවලට සිදුවන හානි අවම කර ගැනීම, භූ විද්‍යාමය බලශක්ති සහ ඛනිජ සම්පත් කළමනාකරණය කිරීම සහ අපගේ ජීවිතවල ගුණාත්මකබව ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ජාතිය වෙත සේවය සලසාලනු ලැබේ.

මූලික මෙහෙයුම් කටයුතු 4 ක් කාර්යාංශය සතුව ඇත.භූ විද්‍යා සිතියම් සැකසීම - ඛනිජ ගවේෂණය, කැනීම් නිමිකම් සහ කැනීම් රෙගුලාසි (ප්‍රධාන කාර්යය) සේවාදායකයන් අරමුණු කරගත් කටයුතු (ඛනිජ සම්පත් ගවේෂණ, විද්‍යාගාර සේවා, භූ භෞතික හා කැනීම් කටයුතු පිළිබඳ එකඟතාවයන්) සහ භූ විද්‍යාත්මක තොරතුරු ලබා දීම (පළ කරන ලද හෝ පළ නොකරන ලද වාර්තා සඳහා ප්‍රවේශය සහ සිය පුස්තකාලය තුළ ඇති සිතියම් හා වෙනත් ලේඛන) එම කාර්යයන් වේ.

නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ සහ පොලොන්නරුව දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 15 ක් සහ හසලක සහ කන්තලේ පිහිටි උප කාර්යාල 2 ක් සහිතව කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ.මෙම ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධාන කටයුතු වන්නේ අදාල පළාත් තුළ විවිධ කැනීම් කර්මාන්තවල නිරත පාරිභෝගික ජනතාව වෙත වඩාත් හොඳ සේවාවක් ලබා දීමත් නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීමත් ය.


භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සිය සේවා රට පුරා ව්‍යාප්ත කරයි.
60000
160000
260000
450000
350000
250000
150000
N
W
E
S
Jaffna
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
කන්තලේ
පොලොන්නරුව
මඩකලපුව
කුරුණෑගල
අම්පාර
මහනුවර
ගම්පහ
බදුල්ල
මොනරාගල
කොළඹ
රත්නපුරය
අනුරාධපුරය
හම්බන්තොට
මාතර
25 12.5 0 25
Kilometers
Digital Cartography by Paditha Priyanga Maddumage (GSMB- Cartography Division)

කාර්යාංශය සමග සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු

අපගේ කාර්යාල	ලිපිනය	කාර්යාල ප්‍රධානී	දුරකථනය
ප්‍රධාන කාර්යාලය	අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ	අධ්‍යක්ෂ ජනරාල්	+94-11-2886289 +94-11-2886290
අම්පාර	අංක 669, නව නගරය, අම්පාර	ඉංජිනේරු එම්.ආර්.එම්. ෆාරිස්	+94-63-2223385
අනුරාධපුරය	අංක 569/69,බණ්ඩාරනායක මාවතල අනුරාධපුරය	ඉංජිනේරු කේ. එන්. ඩබ්. කේ. විමලසේන	+94-25-2224388
බදුල්ල	අංක 52/ඒ,රත්වත්ත මාවත, බදුල්ල	ඉංජිනේරු ඩබ්.කේ.ඒ. එස්. රූපවංශ	055-2225210 +94-55-2222787
මඩකලපුව	අංක 239, බාර් මාවත, මඩකලපුව	ඉංජිනේරු එච්.ඒ.සී.කේ.ඩබ්. බණ්ඩාර	+94-65-2222266
කොළඹ	අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ	ඉංජිනේරු යු.එන්.දිලන්ති	+94-11-2869478 +94-11-2869479
හම්බන්තොට	අංක 26, ටෙරස් වීදිය, හම්බන්තොට	ඉංජිනේරු යූ.එච්.ඒ.ප්‍රියන්ත	+94-47-2222477
ගම්පහ	අංක 6, වෙරළවත්ත, යක්කල	ඉංජිනේරු සී.වී. ලංකා	+94-33-2231430
යාපනය	අංක 170, කොලොම්පුතුරෙයි මාවත, යාපනය	ඉංජිනේරු පි.කේ. කරුණානන්ද	+94-21-2224595
කළුතර	අංක 9 එ, පල්ලිය පාර, වෙන්තුමාකඩ, කළුතර දකුණ	ආචාර්ය තිළිණි ඉලංකෝන්	+94-34-2225580
නුවර	ජනසවිගම පල්ලෙකැලේ නුවර	ඉංජිනේරු එස්.ඒ.අයි.පේ. රුද්‍රිගු	+94-81-2421294 +94-81-2421474
කුරුණෑගල	අංක 15/බී, මීගමුව පාර, මල්කඩුව, කුරුණෑගල	ඉංජිනේරු පි.ඩී. ප්‍රසාද්	+94-37-2230858 +94-37-2232542
මාතර	අංක 7, ජයසූරිය මාවත, නූපේ, මාතර	ඉංජිනේරු කේ.වී. ජගත්	+94-41-2236765
මොනරාගල	අංක 19/6, වැල්ලවාය පාර, මොනරාගල	ඉංජිනේරු ටී.එම්. ඩබ්ලිව්. බණ්ඩාර	+94-055-2277392 +94-055-2276882
රත්නපුරය	අංක 66, ශ්‍රී සරණංකර මාවත, හිදැල්ලන, රත්නපුරය	ඉංජිනේරු ඒ.එම්.එච්.ඩි. අධිකාරි	+94-45-2228117
ත්‍රිකුණාමලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල	පී.ඒ.එස්. කුමාරසිංහ මහතා	+94-26-3202411
පොලොන්නරුව	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල නවනගරය පොලොන්නරුව	පී.ඒ.එස්. කුමාරසිංහ මහතා	027- 2226366

ඓතිහාසික පසුබිම



1903 වර්ෂයේදී ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාගේ මූලිකත්වය යටතේ ආරම්භ කරන ලද ලංකා බනිජ සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට ශත වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ පැවතුණ භූ විද්‍යා දෙපාර්තමේන්තු මාලාවක සාඩම්බර අනුප්‍රාප්තිකයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය.රටේ බනිජ සම්පත් පිලිබඳව තොරතුරු අනාවරණය කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තු විසින් ඉතිහාසය පුරාම සුවිශේෂී වාර්තාවක් තබා ඇති අතර එකී කාර්යය වෙනුවෙන් රට තුළ දැනට ක්‍රියාත්මක වන සියළුම බනිජ කර්මාන්ත ණයගැති වේ.

1939 දී බණිජ ගවේෂණ දෙපාර්තමේන්තුව බනිජ විද්‍යා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලද අතර 1962 දී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස එය නැවත නම් කරන ලදී. 1992 අංක 33 දරන පතල් හා බනිජ පනත ප්‍රකාරව 1993 මාර්තු මස 18 වැනි දින කාර්යාංශය පිහිටුවන ලද අතර එතුලින් භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සමඟ නූතන පතල් දෙපාර්තමේන්තුවක් සතු නව වගකීම් ද ඒකාබද්ධ කරන ලදී.

බනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය ලෙස කාර්යාංශය පිහිටුවීම තුළින් බනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු වගකීම් ඉටු කිරීම අවධාරණය කරනු ලැබේ.මිල අධික ආනයන සඳහා ආදේශක සැපයීම, ගොඩනැගිලි සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාණ්ඩ ලබා දීම සහ අපනයන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා දීම තුළින් රට තුළ රැකියා නිර්මාණය කිරීම සහ රටට ආදායම උත්පාදනය කිරීම සඳහා බනිජ දායක වෙයි.ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වා ගැනීම සහ මෙම තොරතුරු මහජනතාවට ලබා දෙන බවට වගබලා ගැනීම උදෙසා ද කාර්යාංශය වගකීම දරයි.

ආංශයික කාර්යසාධනය

භූ විද්‍යා අංශය

භූ විද්‍යාව ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ සේවා ලබා දීම සම්බන්ධයෙන් පුළුල් අත්දැකීමක් සහිත වෘත්තිය භූ විද්‍යාඥයින්,භූ භෞතික විද්‍යාඥයින් සහ රසඥයන්ගෙන් භූ විද්‍යා සමීක්ෂණ අංශයෙහි කාර්ය මණ්ඩලය සමන්විත වේ.මෙම අංශයෙහි කටයුතු සඳහා තාක්ෂණික ශිල්පීන්, පර්යේෂණ සහායකයන් සහ සිතියම් ශිල්පීන් විසින් තම සහයෝගය ලබා දෙනු ලැබේ.මෙම අංශයෙහි ප්‍රධාන කටයුතු වන්නේ භූ විද්‍යා, භූ රසායනික සහ චාතුර්ථික සිතියම් පිළියෙල කිරීම හා පළ කිරීම, භූ කම්පන නිරීක්ෂණ කටයුතු සහ සුනාමි අනතුරු ඇඟවීම් සිදු කිරීම සඳහා සහාය ලබා දීමයි.

භූ විද්‍යා අංශයෙහි සේවාවන්

බනිජ ගවේෂණය, භූ ඉංජිනේරු විද්‍යාව, පාරිසරික භූ විද්‍යාව සහ බනිජ ආශ්‍රිත කර්මාන්ත සඳහා විවිධ භූ විද්‍යා උපදේශක සේවා ලබා දීම.

විද්‍යාගාර :

පාෂාණ, බනිජ, පස් විශ්ලේෂණයන් සහ ජලය යොදාගනිමින් සිදු කරනු ලබන නවීනතම විශ්ලේෂණ ක්‍රමෝපායන් විශ්ලේෂණ විද්‍යාගාරය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.භෞතික, ප්‍රකාශ, විද්‍යුත්, චුම්බක සහ විකිරණ ලක්ෂණ යොදාගනිමින් පාෂාණ හා බණිජ හඳුනාගැනීම සහ වර්ගීකරණය මගින් පාෂාණ විද්‍යා තොරතුරු ලබාදීම පාෂාණ විද්‍යාගාරය විසින් සිදු කරනු ලැබේ.

භූ භෞතික අංශය :

බනිජ පවතින ස්ථාන, භූගත ජල සම්පත්, පුරා විද්‍යාත්මක ස්ථාන සහ උප පෘෂ්ඨීය තත්ත්වයන් ගවේෂණය කිරීම සඳහා විද්‍යුත්, චුම්බක, පොළව විනිවිද යන රේඩාර් සහ භූ කම්පන ශිල්ප ක්‍රම යොදා ගැනීමේ හැකියාව භූ භෞතික අංශය සතුව ඇත.

විදුම් අංශය :

බනිජ ගවේෂණය සහ භූ තාක්ෂණික ගවේෂණය සඳහා විදුම් සේවා ලබා දෙනු ලැබේ.මීටර් 300 ක ගැඹුරට ළඟා විය හැකි සහ උප විදුම් පස් ප්‍රමාණයක් ලබා දිය හැකි ත්‍රිත්ව නල විදුම් බැරල් යොදා ගනු ලබන එක් වයර් ලයින් විදුම් යන්ත්‍රයක් ඇතුළු විදුම් යන්ත්‍ර 4 ක් මෙම අංශය සතුව ඇත.

භූ කම්පන දත්ත විශ්ලේෂණය සහ සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය :

මෙම මධ්‍යස්ථානයෙහි ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුළ සහ අවට ඇතිවන භූ කම්පන නිරීක්ෂණය කිරීම සහ සුනාමි අනතුරු ඇඟවීම් සිදු කිරීමට අදාල බලධාරින්ට සහාය වීමයි. පල්ලෙකැලේ (PALK), මහකන්දරාව (MALK) සහ හක්මන (HACK) පිහිටි දේශීය භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුනක් වෙතින් සහ කලාපය තුළ පිහිටි විදේශීය භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන වෙතින් නිසි කලට භූ කම්පන දත්ත මෙම මධ්‍යස්ථානය වෙත ලැබේ.

බනිජ තොරතුරු ඒකකය (MIU) :

බනිජ ගවේෂණය සිදු කිරීම සහ බනිජ සඳහා අගය එකතු කිරීම සඳහා කාර්යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ඇගයීමට ලක් කිරීම බනිජ බුද්ධි ඒකකය විසින් සිදු කරනු ලැබේ. අපනයනය සඳහා පූර්ව අවශ්‍යතාවයක් ලෙස නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා බනිජ ආයෝජන ගිවිසුම් සැකසීමද බනිජ බුද්ධි ඒකකය විසින් සිදු කරනු ලැබේ.

පුස්තකාලය :

භූ විද්‍යාව, කැනීම් සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ පෙළපොත් සහ සඟරා සුවිශාල එකතුවක් සහ 1903 සිට සිදු කරන ලද ගවේෂණ වල තාක්ෂණික වාර්තා පුස්තකාලය සතුව ඇත. මේවා නොමිලේ පරිශීලනය කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇති අතර නවතම පර්යේෂණ සොයාගැනීම් භූ විද්‍යාව සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයන් වෙත ලබා දෙනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ අංශයේ ප්‍රගතිය - 2016

ක්‍රියාකාරී සැලසුම් කටයුතු (භූ.ස.ප.කා.ප්‍රතිපාදන)

භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම:

මුළු ශ්‍රී ලංකාවම ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් පලකිරීම කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. බහිජ හා භූගත ජලය ගවේෂණය, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කාර්යයන් සහ නායයෑම් උවදුරු සිතියම් පිලියෙල කිරීම ආදී කාර්යයන් ගණනාවක් සඳහා භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු ඇතුලත් භූ විද්‍යා සිතියම් යොදා ගනු ලැබේ. මුළු රටම ආවරණය වන පරිදි භූ විද්‍යා සිතියම් (1: 100,000 පරිමාණයේ) 21ක මුද්‍රණ කටයුතු 2014 වර්ෂයේදී නිම කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමත් වූ අතර දැනටමත් නිම කර ඇති 1:100,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් මත පදනම්ව 1:500,000 පරිමාණය සහ 1:250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් ද නිර්මාණය කිරීමට සැලසුම් කරන ලදී.

1: 250,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් 04 ක් 2016 වර්ෂයේදී පිලියෙල කරන ලද අතර 2016 දෙසැම්බර් මාසයේදී එම සිතියම් පළ කරන ලදී.



Fig.1: 1:250 000 Geological Maps

චාතුර්ථික සිතියම් (වෙරළ බඩ කලාපීය) වැඩසටහන

භූ විද්‍යා කාල පරිමාණයට අයත් චාතුර්ථික කාල පරිච්ඡේදය මීට අවුරුදු මිලියන 2කට පෙර කාලයක සිට වර්තමානය දක්වා දිව එයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික සැකසීම් වෙරළබඩ අවසාදිතයන්ට හා ජලගැලිම් ඇති වන තැනිතලා ප්‍රදේශවල දියඇළමය අවසාදිතයන්ට සීමා වන අතර පස් සැකසීම් ඒ තුළට ඇතුළත් වේ.එහෙත් මෙම සැකසීම් තුළ ආර්ථිකමය වටිනාකමින් යුතු මැටි හා වැලි නිධි, කොරල් තැන්පතු, සශ්‍රික පස් ආවරණ සහ භූගත ජල ප්‍රභව අන්තර්ගත වන හෙයින් ඒවා අතිශයින්ම සුවිශේෂී වේ."චාතුර්ථික භූ විද්‍යා සිතියම් සැකසීම"නම් ව්‍යාපෘතිය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

චාතුර්ථික සිතියම් වැඩසටහනෙහි සිතියම් මුද්‍රණ කටයුතු

මාතර, කළුතර සහ අම්බලන්ගොඩ කලාපවල සිතියම් ඇතුලත් 1:50,000 පරිමාණයේ චාතුර්ථික සිතියම්වල ක්ෂේත්‍ර කටයුතු සහ සිතියම් සැකසීමේ කටයුතු පසුගිය වර්ෂවලදී නිම කරන ලද අතර මෙම සිතියම් 03 හි මුද්‍රණ කටයුතු 2016 වර්ෂයේ අගභාගය වන විට නිම කරන ලදී. එම සිතියම් මේ වන විට මහජනතාවට පරිශීලනය කළ හැකිය.

පුත්තලම, කල්පිටිය, හම්බන්තොට - තංගල්ල සහ තිස්සමහාරාමය යන කලාපවල දත්ත සැකසීමේ කටයුතු නිම කර ඇත. සිතියම් සැලසුම් සැකසීම 2017 වර්ෂයේ ප්‍රථම භාගය තුළදී සිදු කරනු ඇත.

චාතුර්ථික සිතියම් වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු

අවසාදිත අනුක්‍රමයන් පිළිබඳ අමතර තොරතුරු ලබා ගැනීම සඳහා සිදුරු කිහිපයක් විදීමේ කාර්යය චාතුර්ථික සිතියම් වැඩසටහනට 2016 වර්ෂය තුළදී අළුතින් හඳුන්වා දෙන ලදි. පුත්තලම සිට සිලාවතුර දක්වා ප්‍රදේශය ආවරණය වන පරිදි විදුම් කටයුතු සිදු කිරීම සඳහා ස්ථාන අටක් තෝරා ගන්නා ලදි. පුත්තලම අවට අට්ටවිල්ලුව සහ සිරම්බිඅඩිය යන ප්‍රදේශවල විදුම් සිදුරු දෙකක් සකසන ලදී.2016 ජූනි 30 සිට 2016 අගෝස්තු 26 දක්වා කාලය තුළ ක්ෂේත්‍ර කටයුතු සිදු කරන ලදී.විදුම් යන්ත්‍රය වෙනත් ව්‍යාපෘතියක් සඳහා ඉල්ලා සිටින ලද හෙයින් ක්ෂේත්‍ර කටයුතු අවසන් කරන ලදී.(25% සම්පූර්ණ කළ පසුව)

පාංශු භූ රසායනික සිතියම් සැකසීමේ වැඩසටහන

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන ආරම්භ කරන ලදී. බනිජ ගවේෂණය, පාරිසරික අධීක්ෂණ කටයුතු, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ-සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1:50000 පරිමාණයේ පාදස්ථ සිතියම් යොදාගෙන භූ රසායනික සිතියම් සැකසීම් කටයුතු සිදු කරනු ලැබේ. සෑම වර්ග කිලෝමීටර් 4කටම එක් වර්ග කිලෝමීටරයක ඒකකයක් තුළ භූමියෙහි මතුපිටින් සහ මීටර් 2 ක ගැඹුරු ප්‍රදේශයකින් පස් නියැදි දෙකක් ලබා ගනු ලැබේ. පරමාණුක ආයෝජන වර්ණාවලි දීප්තිමානය (AAS) සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලි දීප්තිමානය (ICP-OES) යොදා ගෙන මෙම නිදර්ශකවල රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන යටතේ සිතියම් සැකසීම හා මුද්‍රණය කිරීම

නිඹොල්කැටිය, මාතර, රක්වාන, තංගල්ල, මොරවක සහ හම්බන්තොට යන 1:50,000 පරිමාණයේ කලාප හයක දත්ත භාවිතා කරමින් භූ රසායනික සිතියම් කලාප අංක 20 (රක්වාන - තංගල්ල) පිළියෙල කර මුද්‍රණ කටයුතු සඳහා භාර දෙන ලදී.

පාංශු භූ රසායනික වැඩසටහෙනහි විද්‍යාගාර වැඩකටයුතු

සිතියම් කලාප අංක 08 - අනුරාධපුරය - පොළොන්නරුව (1:100,000) ට අදාල විද්‍යාගාර විශ්ලේෂණ කටයුතු 2016 වර්ෂය තුළදී සිදු කරන ලද අතර පහත සඳහන් ආකාරයට නියැදි විශ්ලේෂණ කටයුතු සිදු කරන ලදී.

1:50,000 කලාපයේ නම	නියැදි සංඛ්‍යාව	විශ්ලේෂණය කරන ලද මූලද්‍රව්‍ය	ඒකකයක මිල (රු.)	විශ්ලේෂණයෙහි මුළු වටිනාකම (රු.)
අනුරාධපුරය	විශ්ලේෂණ කටයුතු 2015 වර්ෂය තුළදී නිම කරන ලදී.			
පොළොන්නරුව	250	මූලද්‍රව්‍ය 15 ක් පහත සඳහන් ආකාරයට	14,000.00	රු. 3,500,000.00
කවුඩුල්ල	250	මූලද්‍රව්‍ය 15 ක් පහත සඳහන් ආකාරයට	14,000.00	රු. 3,500,000.00
කැකිරාව	නියැදි පිළියෙල කිරීම සහ විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබමින් පවතී			
භූ රසායනික සිතියම් සැකසීම සඳහා 2016 වර්ෂය තුළදී සිදු කරන ලද විශ්ලේෂණ කටයුතුවල මුළු වටිනාකම				රු. 7,000,000.00

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි ක්ෂේත්‍ර කටයුතු

කැකිරාව කලාපයේ (1:50,000 පරිමාණය) ක්ෂේත්‍ර කටයුතු 2016 වර්ෂයේ දෙවන කාර්තුව වන විට නිම කරන ලදී.

වාර්ෂික බණිජ ග්‍රන්ථය - 2015 සහ වාර්ෂික බනිජ ග්‍රන්ථය - 2016

'2015 වාර්ෂික බනිජ ග්‍රන්ථය' සඳහා දත්ත එක්රැස් කිරීම 2015 වර්ෂය තුළදී සිදු කරන ලද අතර 2016 වර්ෂය නිම වන විට එම ග්‍රන්ථයෙහි සම්පාදන කටයුතු අවසන් කරන ලදී. 2016 වාර්ෂික බනිජ ග්‍රන්ථය සඳහා දත්ත එකරැස් කිරීම සහ විශ්ලේෂණ කටයුතු 2016 වර්ෂයේ දෙවන අර්ධය තුළදී සිදු කරනු ලැබ ඇත.

පළාත් බනිජ සමීක්ෂණ සහ පළාත් බනිජ සිතියම්

පළාත් බනිජ සිතියම් මුද්‍රණ කිරීම.

දැනට පවතින දත්ත උපයෝගී කරගනිමින් මධ්‍යම සහ ඌව පළාත්වල බනිජ සිතියම් සම්පාදනය කිරීමේ කටයුතු 2015 වර්ෂය තුළදී බොහෝ දුරට නිම කරන ලද අතර ඉතිරි කටයුතු 2016 වර්ෂය තුළදී නිම කරන ලදී. අවසානයේදී මධ්‍යම පළාත් බනිජ සිතියම 2016 වර්ෂය අගභාගය වන විට මුද්‍රණය කරන ලදී.

ක්ෂේත්‍ර කටයුතු සහ පළාත් බණිජ සිතියම් සම්පාදනය කිරීම.

සබරගමුව පළාතේ බනිජ ගවේෂණ කටයුතු 2015 වර්ෂයේ තුන්වන කාර්තුව තුළදී ආරම්භ කරන ලද අතර 2016 වර්ෂයේ පළමු කාර්තුව තුළදී සම්පූර්ණ කරන ලදී. දත්ත පදනම සැකසීම සහ වාර්තාව පිළියෙල කිරීම නිම කර ඇති අතර සිතියම් සම්පාදනය කිරීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ අනුග්‍රහය යටතේ සිදු කරනු ලබන න්‍යෂ්ඨික අමුද්‍රව්‍ය සමීක්ෂණය සහ ආනුෂාංගික කටයුතු.

මාතලේ, දඹුල්ල, ඇලහැර, පල්ලෙගම, නුවර, ගම්පොල, මහියංගනය සහ හඟුරන්කෙත 1:50,000 පරිමාණයේ භූ විද්‍යා කලාපවල ක්ෂේත්‍ර කටයුතු 2016 වර්ෂයේ තුන්වන කාර්තුව තුළදී නිම කරන ලදී. නිදර්ශකවල විශ්ලේෂණ කටයුතු විද්‍යාගාර තුළ සිදු කරනු ලබමින් පවතින අතර අන්තර්වාර වාර්තා ඉදිරිපත් කරනු ලැබ ඇත. රත්නපුර, බඹරකොටුව ප්‍රදේශයේ තෝරියම් සහ යුරේනියම් පවතින ස්ථාන පිළිබඳව ගවේෂණය කිරීම සඳහා ආරම්භක ක්ෂේත්‍ර චාරිකා සිදු කරන ලදී. කාබන් ගැමා කිරණ පරීක්ෂාව තුළදී හඳුනාගනු ලැබූ නාවුල ප්‍රදේශයේ තෝරියම් විෂමතාවය පිළිබඳ සවිස්තරාත්මක භූ විද්‍යාත්මක ගවේෂණ කටයුතු තුන්වන කාර්තුව තුළදී ආරම්භ කරන ලදී. 2016 වර්ෂයේ අවසාන භාගයේදී ආරම්භ කරන ලද තලෙයිමන්නාරම සිට ගාල්ල දක්වා වෙරළ තීරයෙහි න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණ කටයුතු 2017 වර්ෂය තුලදී ද සිදු කරන ලදී. තලෙයිමන්නාරමේ සිට විල්පත්තු අභය භූමිය දක්වා ක්ෂේත්‍ර කටයුතු නිම කරනු ලැබ ඇත.

භූ කම්පන දත්ත සහ සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය සම්බන්ධයෙන් කරන ලද වැඩි දියුණු කිරීම් සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන නඩත්තු කිරීම.

වෙනත් ආධාර ආයතනවලද සහයෝගය ඇතුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ස්ථාපිත කරන ලද භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන තුන සුළු සුළු අවහිරතා මධ්‍යයේ වුවද ඉතා හොඳින් ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම මධ්‍යස්ථානවලින් ලබා ගනු ලබන දත්ත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි දත්ත මධ්‍යස්ථානය වෙත සම්ප්‍රේෂණය කරනු ලැබේ. භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන දෙක තුළ දත්ත ලබා ගැනීමේ හැකියාව 98% ක් වන සාර්ථක මට්ටමක පවතී. භූ චලන, භූමි ස්පන්දන සහ ඉන්දියන් සාගරයේ ඇතිවන භූමිකම්පා සම්බන්ධයෙන් මහජනයා වෙතින් ලැබෙන විමසීම් සම්බන්ධව

දත්ත මධ්‍යස්ථානය විසින් සාර්ථකව ප්‍රතිචාර දක්වා ඇත. (PALK) මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ අකුණු ආරක්ෂණ පද්ධතියක් ස්ථාපනය කර තිබුණද එම ස්ථානය බෙහෙවින්ම අකුණුවල බලපෑමට ලක් වේ. එහෙයින් විස්තීරණ න්‍යෂ්ඨික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානයේ සහ කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතිව පල්ක් හි දැනට පවතින අකුණු ආරක්ෂක පද්ධතිය නවීකරණය කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සැලසුම් කර ඇත.මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කිරීම සඳහා IDA ව්‍යාපෘතියෙහි ප්‍රධාන ඉංජිනේරුවරයා, විස්තීරණ න්‍යෂ්ඨික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානයෙහි උපදේශක ඉංජිනේරුවරයෙකු සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ නිලධාරීන් විසින් 2016 ඔක්තෝබර් මාසයේදී ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී. මෙම නවීකරණ කටයුතු 2017 වර්ෂය මුල්භාගයේදී සිදු කරනු ඇත. GFZ (MALK සහ HALK) භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානවල ගැටලු නිරාකරණ කටයුතුවලට පහත සඳහන් කාර්යයන් අයත් විය.

(1) MALK භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි විදුලිබල පද්ධතියෙහි ගැටළුවක්

(2) GFZ මධ්‍යස්ථාන දෙකෙහිම VSAT චන්ද්‍රිකා සන්නිවේදන පද්ධතියෙහි සහ MALK භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි පුළුල් කලාප ගෝලීය ප්‍රදේශ ජාලයෙහි (BGAN) සන්නිවේදන ගැටළුව

GFZ හි සහයෝගය (උපකරණ හා තාක්ෂණික සහයෝගය) ඇතිව මෙකී සන්නිවේදන ගැටළු සඳහා විසඳුම් ලබා දෙන ලදි. භූ කම්පන නිරීක්ෂණ කටයුතු වලට අමතරව, භූ කම්පන දත්ත සහ සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කැනිම් කටයුතුවලට අදාල මහජන පැමිණිලි භාර ගන්නා මධ්‍යස්ථානය ලෙසද ක්‍රියා කරනු ලැබේ. මෙහි නවතම ක්ෂණික ඇමතුම් අංකය 0112862862 වන අතර මෙම මධ්‍යස්ථානයෙහි කාර්යයේ නියුක්ත නිලධාරීන් විසින් පැමිණිලි සටහන් කර ගැනීමෙන් අනතුරුව ඒවා කැනිම් අංශය වෙත යොමු කරනු ලැබේ.

අබලන් වූ විදුම් පෙට්ටි අනාවරණය කරගැනීම සහ ගබඩා කිරීම.

යක්කල පරිශ්‍රය තුළ දිරා ගිය ලී පෙට්ටි තුළ ගබඩා කර තිබූ පාෂාණ හර විදුම් නිදර්ශක යලි සකස් කිරීමට සැලසුම් කරන ලදී.විදුම් පෙට්ටි අබලන් වූ තත්ත්වයක පැවති අතර නිසි තොරතුරු අනුව යලි සකස් කර ගත හැකි වූයේ නිදර්ශක වලින් 60% ක් පමණි. සකස් කරන ලද නිදර්ශක ගැල්වනයිස් කරන ලද විදුම් පෙට්ටි 900කට වැඩි සංඛ්‍යාවක් 2013, 2014 සහ 2015 වර්ෂවලදී ගබඩා කරන ලදී.2015 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතිය බොහෝ දුරට අවසන් කරන ලද අතර අවසාන සංවිධාන කටයුතු සහ නිමැවුම් කටයුතු 2016 වර්ෂයේ පළමු අර්ධය තුළදී නිම කරන ලදී.

වයඹ පළාතට අයත් ප්‍රදේශ තුළ ගඩොල් හා උළු පර්යේෂණ කටයුතු

මාඔය සහ දැදුරු ඔය ඔස්සේ පර්යේෂණ කටයුතු සිදු කරන ලද අතර ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදී. එකතු කරන ලද නියැදි වැඩිදුර විශ්ලේෂණ කටයුතු සඳහා යක්කල ගබඩා පරිශ්‍රයේ කරන ලදී.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පුස්තකාලය නවීකරණය කිරීම

(අ) සඟරා සඳහා දායකත්වය

සඟරා වර්ග 11 ක් මිලදී ගැනීම සඳහා පුස්තකාල කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලදී. එලෙසම සඟරා නාම ලේඛනය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ද ඉදිරිපත් කරන ලදී. Geological Magazine, Gems and Gemo logy, Bulletin of Seismological Society of America, Journal of the Geological Society of India,Geophysical Prospecting, Journal of me.. Geology , Geophysies, The leading Edge, National Geographie, New Scientist හා Economic Geology එම සඟරාවන් වේ.

(ආ) පුස්තකාලය සඳහා පෙළපොත් මිලදී ගැනීම 2016

2015 වර්ෂය තුළදී මිලදී ගැනීම සඳහා පෙළපොත් 33 ක් පුස්තකාල කමිටුව විසින් තෝරාගෙන ඇත. 2015.10.21 දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද ඉල්ලීම් සලකා බලා ඔවුන් විසින් ඉල්ලා සිටින ලද පොත් අටක් තෝරා ගන්නා ලදී. ඇස්තමේන්තුගත මුළු වියදම රු. 5,611,18.00 ක් වූ අතර මෙම පොත් 2016 වර්ෂයේදී ලැබුණි.

(ඇ) කෞතුකාගාර සංවර්ධනය

කෞතුකාගාර සංවර්ධනය කිරීම පිළිබඳ යෝජනාව නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ විද්‍යා) මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කරන ලදී. කුඩා ප්‍රදර්ශන කුටි සහ ප්‍රදර්ශන රැඳවුම් නිර්මාණය කිරීමට අදාල ලේඛන ඉල්ලා සිටිනලදුව ඒවා මිලදී ගැනීමේ අංශය වෙත ලබා දෙන ලදී. මෙම කටයුතු දැනට සිදුකරගෙන යමින් පවතී.

(ඈ) අනිකුත් කටයුතු

2.1. පුස්තකාල අංකිතකරණ ව්‍යාපෘතිය

අංකිත පුස්තකාල ව්‍යාපෘති දෙවන අදියර යටතේ ජාතික විද්‍යා පදනමේ අනුග්‍රහය යටතේ 2016 වර්ෂය අගභාගයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පුස්තකාලය ආරම්භ කරන ලදී.

2 වන අදියර : 1 කොටස

1. පිටු 20,000 ක් පරිලෝකනය කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
2. ඉහත පිටු 20,000 සඳහා හඳුනාගැනීමේ සංකේත ක්‍රමයක් නිර්මාණය කරන ලදී.
3. ලේඛන ප්‍රභේදය : තාක්ෂණික වාර්තා සහ අනිකුත් වාර්තා, පුවත්පත් වලින් අවශ්‍ය කොටස් වෙන්කර ගැනීම

2 වන අදියර : 2 කොටස

1. ලේඛන පරිලෝකනය නිවැරදිද යන බව නැවත පරීක්ෂා කරන ලදී.

2 වන අදියර : 3 කොටස

- ඉහත මෘදුකාංගයට දත්ත ඇතුලත් කරන ලදී.
- අංකිතකරණ ව්‍යාපෘති 2 අදියර 100% දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය
- පුවත්පත් කියවා බලා අවශ්‍ය කොටස් වෙන් කර ගන්නා ලදී.
- විද්‍යුත් තැපෑල (නිල විද්‍යුත් තැපෑල) පරීක්ෂා කරන ලදී.
- පුස්තකාලය වෙත පෙළපොත් 32 ක් ලැබුණු අතර ඒවා පරිග්‍රහණ ලේඛනයට ඇතුලත් කරන ලදී.ඩිවේ.දශම වර්ගීකරණ ක්‍රමයට අනුව පෙළපොත් 32 වර්ගීකරණය කිරීම සහ දත්ත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ස්වයංක්‍රිය අන්තර්ජාල පුස්තකාල පද්ධතියට ඇතුලත් කිරීම.
- පෙළපොත් 32 සඳහා තීරු සංකේත නිර්මාණය කොට ඒවා පෙළපොත්වල යෙදීම

- ජායා පිටපත් සේවාවන් ලබා දීම
- සඟරා 1088 ක් පිළිබඳ වාර්තා පරිගුහණ ලේඛනයට ඇතුළත් කරන ලද අතර ඒවා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ අන්තර්ජාල පරිගුහණ ලැයිස්තුවටද ඇතුලත් කරන ලදී. තිර සංකේත 1088 ක් නිර්මාණය කර ඒවා සඟරා 1088 ක ඇතුලත් කරන ලදී.
- 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා පුවත්පත්වලින් වෙන් කර ගත් කොටස්වල ප්‍රවකයක් සකස් කරන ලදී.

පුස්තකාල කමිටුව

වර්ෂය තුළ තුන් වතාවක් පුස්තකාල කමිටුව රැස් විය.

පුස්තකාලයේ ආදායම

2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සිතියම්, ප්‍රකාශන, ප්‍රසිද්ධ නොකරන ලද වාර්තා, බනිජ පෙට්ටි සහ වෙනත් දෑ අලෙවිය තුලින් රු. 400,014/- ක ආදායමක් පුස්තකාලය විසින් උපයා ගන්නා ලදී.

පාෂාණවිද්‍යා විද්‍යාගාරය

(අ) බාහිර ආයතනවලින් ලැබුණු නිදර්ශක (ගාස්තුවක් අය කර විශ්ලේෂණය කරන ලදී.)

	උපයන ලද මුදල (රු)
1. වැලි නිදර්ශනවල බනිජ විද්‍යාත්මක විශ්ලේෂණයන් (160)	- 671,600.00
2. තුනී කඩ සැකසීම සහ පාෂාණ විද්‍යාත්මක විශ්ලේෂණය	- 15,000.00
3. වෙනත් (බනිජ හඳුනා ගැනීම :අංශු ප්‍රධාන විශ්ලේෂකය)	- 74,600.00
මුළු මුදල	**- 761,200.00**

(ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ විද්‍යාඥයින් විසින් සිදු කරන ලද භූ විද්‍යා සහ බණිජ ගවේෂණ වලින් ලබා ගන්නා ලද නිදර්ශක

1. වලවේ ගඟෙහි රත්‍රන් ගවේෂණය (එකතු කරනල ද නිදර්ශක 30)	- 180,000.00
2. තුනී කඩ සකස් කිරීම	
- ඒ. එස්. ජයකොඩි මහතා - ව්‍යාපාති (තුනීකඩ 20)	- 100,000.00
- ඒ.එම්.එම්. රත්නායක මහතා (තුනී කඩ 04)	- 20,000.00
3. පාෂාණ නිදර්ශක වලින් කුඩා තීරු වෙන්කර ගැනීම	
- ඒ.එම්.එම්. රත්නායක මහතා සහ ලියෝ කිරිගම්මන් මහතා	- 20,000.00
මුළු එකතුව	- 140,000.00

(ඇ) මහේස්ත්‍රාත් අධිකරණවලින් ලැබුණු නිදර්ශන

- වාරියපොල - (නිදර්ශක - 07) - 45,500.00
- පොල්ගහවෙල - (නිදර්ශක - 08) - 52,000.00
- මල්ලාකම් - (නිදර්ශක - 17) - 110,500.00
- දෙයියන්දර - (නිදර්ශක - 02) - 13,000.00
- අම්පාර - (නිදර්ශක - 05) - 32,500.00
- මාරවිල - (නිදර්ශක - 03) - 19,500.00
- මාතර - (නිදර්ශක - 02) - 13,000.00
- කිලිනොච්චි - (නිදර්ශක - 04) - 26,000.00
- නුවරඑළිය - (නිදර්ශක - 02) - 13,000.00
- පේදුරු තුඩුව - (නිදර්ශක - 02) - 13,000.00

මුළු එකතුව - 338,000.00

(ඈ) ප්‍රදර්ශන සහ පාසල් වැඩසටහන් සඳහා සහභාගි වීම සහ නිදර්ශක කට්ටල පිළියෙල කිරීම

1. පොළොන්නරුව - ලෝක පරිසර දිනය - ප්‍රදර්ශනය
2. කළුතර බාලිකා විද්‍යාලය - ප්‍රදර්ශනය
3. පිටකෝට්ටේ ශාන්ත අන්තෝනි විද්‍යාලය - ප්‍රදර්ශනය
4. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - ප්‍රදර්ශනය
5. බන්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව (ස්වර්ණාභරණ ප්‍රදර්ශනය) - ප්‍රදර්ශනය
6. බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව - (Sri Lanka Next) - ප්‍රදර්ශනය
7. ලෝක පරිසර දිනය - නිදර්ශන කට්ටල 50 ක් පිළියෙල කරන ලදී
8. ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය - නිදර්ශන කට්ටල 50 ක් පිළියෙල කරන ලදී

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිතිපතා කරනු ලබන කාර්යයන් සඳහා 2016 වර්ෂය තුළදී පාෂාණ විද්‍යා විද්‍යාගාරයේ සේවය ලබා දෙන ලදී.

විශ්ලේෂණ විද්‍යාගාරය

(අ) බාහිර ආයතන සඳහා සිදු කරන ලද රසායනික විශ්ලේෂණ කටයුතු

විවිධ ආයතන සහ පුද්ගලයන්ගේ ඉල්ලීම් මත හුණුගල්, තිරුවානා, ඩොලමයිට්, මිනිරන්, ෆෙල්ඩිස්පාර්, පස්, වැලි, සිමෙන්ති,මයිකා, බනිජ වැලි, මැටි, ජලය, දිරා ගිය පාෂාණ, මිශ්‍ර ලෝහ, ගඩොල් සහ පිඟන් භාණ්ඩ මිශ්‍රන නිදර්ශන 335ක් විශ්ලේෂණ කටයුතු මෙම විද්‍යාගාරය විසින් සිදු කරන ලදී. මේ අනුව මෙම විශ්ලේෂණ විද්‍යාගාරයෙහි ආදායම (බදු නොමැතිව) රු. 2,664,883.35 ක් විය.

(ආ) භූ විද්‍යා අංශය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති සඳහා සිදු කරන ලද රසායනික විශ්ලේෂණ කටයුතු

1. සීමාසහිත ටෝකියෝ සිමෙන්ති සමාගම සඳහා මන්නාරම දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද 'ද්විතියික අමුද්‍රව්‍ය (මැටි) සමීක්ෂණය වැඩසටහන යටතේ මැටි නිදර්ශක 205 ක් විශ්ලේෂණය කරන ලදී. මෙම විශ්ලේෂණ කටයුතු වලින් උපයන ලද ආදායම රු. 1,845,000.00 (බදු නොමැති) විය.

2. සීමාසහිත ටෝකියෝ සිමෙන්ති සමාගම සඳහා පුනරින් ප්‍රදේශය තුළ සිදු කරන ලද හුණුගල් ගවේෂණය යටතේ හුණුගල් නිෂ්පාදන 170 ක් විශ්ලේෂණය කරන ලදී.

(ඇ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදු කරන ලද අනෙකුත් ගවේෂණ සඳහා රසායනික විශ්ලේෂණ කටයුතු

1. භූ විද්‍යාඥ අජිත් ප්‍රේම් මහතා විසින් ලබා ගන්නා ලද තිරුවානා නිදර්ශක දෙකක් සඳහා විශ්ලේෂණ කටයුතු විශ්ලේෂණයේ වටිනාකම - රු. 18,000.00 (බදු නොමැතිව)

2. ජනාධිපති මන්දිර පරිශ්‍රයෙන් තුලින් භූ භෞතික විද්‍යාඥ නලින් ද සිල්වා මහතා විසින් ලබා ගන්නා ලද ජල නිදර්ශක දෙකක විශ්ලේෂණ කටයුතු විශ්ලේෂණයේ වටිනාකම රු 18,000.00(බදු නොමැතිව)

3. ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත භූ විද්‍යාඥ අජිත් ප්‍රේම් මහතා විසින් නාමල් උයන ප්‍රදේශයෙන් ලබා ගන්නා ලද රෝස තිරුවානා නිදර්ශක දෙකක විශ්ලේෂක කටයුතු විශ්ලේෂණයේ වටිනාකම - රු.36,000.00 (බදු නොමැතිව)

4. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සභාපතිතුමාගේ ඉල්ලීම මත මුහුදු වැලි / ගල්වල්වල් වලින් ලැබෙන ගල් කුඩු ඉදි කිරීම් කටයුතු සඳහා සුදුසුද යන්න පරීක්ෂා කිරීම සඳහා එකී නියැදි 13ක ක්ලෝරයිඩ සහ කාබනේට පරීක්ෂාවන් සිදු කරන ලදි. විශ්ලේෂණයේ වටිනාකම - රු. 32,500.00

(ඈ) ක්‍රියාකාරී සැලසුම් කටයුතු - භූ රසායනික සිතියම් සැකසීම

තිබොල්කැටිය, මාතර, රක්වාන, තංගල්ල, මොරවක සහ හම්බන්තොට යන 1:50,000 පරිමාණයේ කලාප 6 ක විශ්ලේෂණ දත්ත යොදා ගනිමින් කලාප අංක 20 (රක්වාන - තංගල්ල) හි භූ රසායනික සිතියම පිළියෙල කිරීමේ කාර්යය නිම කරන ලදී.

2016 වර්ෂය තුලදී සිදු කරන ලද භූ භෞතික ගවේෂණ

ගවේෂණය සිදු කළ දිනය	වැඩ සටහන
04/01/2016 සිට 13/01/2016	ඇඹිලිපිටිය,හම්බන්තොට, පොළොන්නරුව සහ සෝමාවතිය වැලි ගවේෂණය
20/01/2016 සිට 25/01/2016	බෙලිඅත්ත -මාගා යෝජිත ගල් වල පරිශ්‍රය තුළ පාෂාණ ධාරිතාව ගණනය කිරීම
05/02/2016 සිට 11/02/2016	බෙලිඅත්ත යෝජිත මාගා ගල්වල පරිශ්‍රයන්හි ධාරිතාවන් ගණනය කිරීම දෙවන පියවර
02/03/2016 සිට 07/03/2016	බෙලිඅත්ත යෝජිත මාගා ගල්වල පරිශ්‍රයන්හි ධාරිතාවන් ගණනය කිරීම තුන්වන පියවර
09/03/2016 සිට 12/03/2016	අනුරාධපුර ධම්මචේතිය විහාරයෙහි යෝජිත ගොඩනැගිල්ලෙහි (මහමෙව්නාවෙහි) ප්‍රතිරෝධතාවය පරීක්ෂා කිරීම
05/05/2016 සිට 09/04/2016	වැලි ගවේෂණය - වස්කඩුව දෙහිඅත්තකණ්ඩිය
28/04/2016 සිට 02/05/2016	උණුදිය උල්පත් සහ ඩොලරයිට් ඩයික පිළිබඳ භූ භෞතික ගවේෂණය
28/06/2016	දැරණියගල ස්ථාපිත කිරීමට නියමිත විදුලිබල මණ්ඩලයේ යෝජිත දිය ඇලි මධ්‍යස්ථානය සඳහා භූ භෞතික කටයුතු
12/07/2016 සිට 20/07/2016	පදියතලාව සහ මහව ප්‍රදේශ තුළ උණුදිය උල්පත් සහ ඩොලරයිට් ඩයික සඳහා භූ භෞතික කටයුතු, වේවැල්වත්ත ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට නියමිත විදුලි බල මණ්ඩලයේ යෝජිත උප ජාල මධ්‍යස්ථානය සඳහා භූ භෞතික කටයුතු, නාවලපිටිය ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට නියමිත විදුලිබල මණ්ඩලයෙහි යෝජිත උප ජාල මධ්‍යස්ථානය සඳහා භූ භෞතික කටයුතු
08/08/2016 12/08/2016	නාවලපිටිය ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට නියමිත විදුලිබල මණ්ඩලයෙහි යෝජිත උප ජාල මධ්‍යස්ථානය සඳහා භූ භෞතික කටයුතු
13/08/2016 සිට 20/08/2016	මාදුරුඔය, මහව, කවුඩුල්ල ප්‍රදේශ තුළ උණු දිය උල්පත් සහ ඩොලරයිට් ඩයික සඳහා භූ භෞතික කටයුතු
20/09/2016	රිකිලිගස්කැලේ ප්‍රදේශය තුළ ස්ථාපිත කිරීමට නියමිත විදුලිබල මණ්ඩලයෙහි යෝජිත උප ජාල මධ්‍යස්ථානය සඳහා භූ භෞතික කටයුතු
	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ඉල්ලීම මත නාවල සහ වේල්ලවත්ත ප්‍රදේශවල විශේෂ භූමිය විනිවිද යන රේඩාර් පද්ධති පරීක්ෂණයක් සිදු කිරීම

පර්යේෂණ වැඩසටහන්

තම නිතිපතා ඉටු කරන කාර්යයන්ට අමතරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කරන ශිෂ්‍යයන්ට සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් හා මග පෙන්වීම ලබා දෙනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දායකත්වය	**ශිෂ්‍යයාගේ නම / ආයතනය**	**පර්යේෂණ ක්ෂේත්‍රය**
ඒ. එම්. එම්. රත්නායක මහතා විසින් සිදු කරන ලදී.	දර්ශන ශූරී පර්යේෂණය	ශ්‍රී ලංකාවේ නිරිත දිග ප්‍රදේශය ආශ්‍රිතව සවිස්තරාත්මක සිතියම් සැකසීම
ඩී.ටී.ඩී.එස්. විජේසුන්දර මෙනවිය විසින් මගපෙන්වීම ලබා දෙන ලදී.	නදීකා ගුණාරත්න මහත්මිය දර්ශන ශූරී පර්යේෂණ විද්‍යා ශිෂ්‍යාවකි.	
එස්. එන්. බී. තල්දෙන මෙනවිය විසින් මගපෙන්වීම ලබා දෙන ලදී.	දිනුෂ මහතා විද්‍යාපති ශිෂ්‍යයෙකි	ඉන්දියානු සාගර කලාපයෙහි සිදුවුනු භූමි කම්පා පිලිබඳ සංඛ්‍යාලේඛනමය විශ්ලේෂනය
එස්. එන්. බී. තල්දෙන මෙනවිය විසින් මගපෙන්වීම ලබා දෙන ලදී.	පී.ඒ.පී.ඩබ්ලිව්.එස්. ලෝකේශ්වර ටී.එස්.එම්. තිලකරත්න උපාධි අපේක්ෂක විවෘත විශ්ව විද්‍යාලය	ශ්‍රී ලංකාවේ පැරණි ස්ථූප ආශ්‍රිත භූ කම්පන ක්‍රියාවලින්
ඩී.ටී.ඩී.එස්. විජේසුන්දර මෙනවිය විසින් මගපෙන්වීම ලබා දෙන ලදී.	ඩී.ඩී. උපේක්ෂා මහත්මිය සහ සාරංගා වික්‍රමසිංහ මහත්මිය උපාධි අභ්‍යාසලාභීන්	පුත්තලම සිට මන්නාරම දක්වා ගුවන් ඡායාරූප පරිලෝකනය කිරීම භූ විද්‍යා විමර්ශනයට ලක් කිරීම ඒවා සඳහා වාර්තාවන්, සිතියම් සැකසීම. Google Earth හා අනෙකුත් චන්ද්‍රිකා ඡායාරූප සහ ඉහත කී විවිත්‍ර සිතියම් යොදා ගනිමින් චාතුර්ථික සිතියම් සඳහා අවශ්‍ය, මිනිසා විසින් නිර්මාණය කරන ලද සහ ස්වාභාවික භූමි ලක්ෂණ අංකනය කිරීම සහ මේ සියල්ල පොදු බණ්ඩාංක පද්ධතියකට පරිවර්තනය කිරීම.
එස්. එන්ත බී. තල්දෙන මෙනවිය සහ සාරා ජුහුර් මෙනවිය විසින් මග පෙන්වීම ලබා දෙන ලදී.	අ.පො.ස. උ. පෙළ සිසුන්ගේ ව්‍යාපෘති	භූමි කම්පන සහ සුනාමි ආශ්‍රිත මාතෘකා
එස්. එන්. බී. තල්දෙන මෙනවිය විසින් සිදු කරන ලදී.	ශාස්ත්‍ර ශූරී පර්යේෂණ	ශ්‍රී ලංකාවේ පාදස්ථ ගල්පරවල භූ කම්පන ප්‍රවේශයක්

සේවාදායකයින්ගේ ඉල්ලීම මත සිදු කරනු ලබන ව්‍යාපෘති හා කටයුතු (ආදායම් උපදවනු ලබන)

1 වගුව : 2016 වර්ෂය තුළදී විවිධ ව්‍යාපෘති වලින් උපයන ලද ආදායම්වල සාරාංශය

ව්‍යාපෘතියේ නම සහ සේවාදායකයා (සමාගම)	ආදායම (රු.)
කොස්ලන්ද, ගැටමාන්න සහ බෙලිඅත්ත සහ ප්‍රදේශවල ගල්වලවල් හි භූ භෞතික පර්යේෂණ සී/ස මාගා ඉංජිනේරු සමාගම	500,000
පුනරින් ප්‍රදේශය තුළ සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ගවේෂණය - 2015 සී/ස ටෝකියෝ සිමෙන්ති සමාගම	
යාපනය / සෙන්ගුපිටිය ප්‍රදේශයේ විදුම් ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය	1,545,057
රාගල, මාලිබොඩ සහ නාවලපිටිය යන ප්‍රදේශයන් තුළ ප්‍රතිරෝධකතා ගවේෂණය ලංකා විදුලිබල මණ්ඩලය	
කළුගඟ - මොරගහකන්ද විදුම්, පාෂාණ පරීක්ෂා කිරීමේ වැඩසටහන මහවැලි ජල ආරක්ෂක ආයෝජන වැඩසටහන (මහවැලි උපදේශන කාර්යාංශය)	3,206,533
පුනරින් - වලෙපාඩු ප්‍රදේශයෙහි විදුම් පර්යේෂණ සී / ස ටෝකියෝ සිමෙන්ති සමාගම	3,617,895
දෙනියාය පස් පරීක්ෂණය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත	337,613
යාපනය වල්ලිපුරම් සහ චම්පි ප්‍රදේශ තුළ සිලිකා වැලි ගවේෂණය එම්. පී. එම්. පතල් හා බණිජ	2,000,000
කොළඹ අධිවේගී මාර්ගයෙහි මීරිගම විදුම් පරීක්ෂණය - සී/ස නිට් සොලියුෂන්ස් සමාගම	4,762,905
පාදුක්ක විදුම් ව්‍යාපෘතිය - සී/ස ඇක්සස් ඉංජිනේරු සමාගම	327,556

1.0 අනෙකුත් කටයුතු

මාඔය සඳහා කළමනාකරණ සැලැස්ම

මාඔය කළමනාකරණ සැලැස්ම යටතේ, 2016 වර්ෂය සඳහා මා ඔයෙහි වැලි කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සී/ස පාරිසරික පදනම, මධ්‍යම පරිසර අධිකාරිය, පොලිසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතනවල නිලධාරීන් සමග සිදු කරනු ලබන වාර්ෂික රැස්වීම පවත්වන ලදී.

ගිං ගඟ වැලි ගවේෂණය

2015 දෙසැම්බර් මාසය මැද භාගයේදී ආරම්භ කරන ලද වැලි ගවේෂණය ජනවාරි මාසයේ පළමු සතිය දක්වා සිදු කරන ලද අතර ඉන් අනතුරුව වාර්තාවද ඉදිරිපත් කරන ලදී.

මා ඔය වැලි ගවේෂණය

මා ඔය වාර්ෂික වැලි ගවේෂණය සිදු කර වැලි සම්පත් පිළිබඳ වර්තමාන තත්ත්වය සහ කැනීම් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ නිර්දේශ ඇතුලත් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

දැදුරු ඔය

දැදුරුඔය ප්‍රදේශයේ චන්ද්‍රිකා ඡායාරූප නිරීක්ෂණය කර වැලි එක්රැස් වී ඇති / තැන්පත් වී ඇති ප්‍රදේශ නිරීක්ෂණය කරන ලදී.

කච්චතිවු විදුම් වැඩසටහන

චාතුර්ථික සිතියම් ව්‍යාපෘතිය යටතේ (2016 මැයි මස 04 සිට 12 දක්වා) කච්චතිවු දිවයින තුළ විදුම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මෙම වැඩසටහන සඳහා අවශ්‍ය පහසුකම් සපයා දෙන ලද අතර මීටර් 17 ක ගැඹුරක් දක්වා විදුම් සිදුරක් විදින ලදී. කච්චතිවු දිවයින තුළ කොරල්පර පැවතීම සහ මයෝසීන පාදස්ථය දක්වා ගැඹුරට ඇති ප්‍රදේශය අධ්‍යයනය කිරීම සඳහා මෙම වැඩසටහන සිදු කරන ලදී. පලෙයිතිවු, ඉරනතිවු සහ කාරතිවු යන අසල්වැසි කුඩා දූපත්වලට ගමන් කර එම දූපත් වල අවසාදිත සහ කොරල්පර පැවතීම පිළිබඳව අධ්‍යයනය කරන ලදී. (2016 මැයි මස 10)

ක්ෂේත්‍ර පරීක්ෂණ සහ අනිකුත් කෙටිකාලීන කටයුතු

ඒ. එම්. එම්. රත්නායක මහතා / භූ විද්‍යාඥ

- උමා ඔය ආශ්‍රිතව පොළව යට උමගක් ඉදි කිරීම හේතු කොට ගෙන ඇති වූ ගැටළු විමර්ශනය කර ඒ පිළිබඳ වාර්තාවක් පෙබරවාරි මාසයේදී ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

- අප්‍රේල් මාසයේදී දෙල්තොට වත්තෙහි තිරුවානා ඉල්ලම් තුළ තැන්පත්ව ඇති සංචිත ප්‍රමාණය පිළිබඳව ගණනය කිරීම සඳහා ක්ෂේත්‍ර කටයුතු සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

- නුවර මයිලපිටිය ප්‍රදේශයේ හදිසියේ මතු වූ පැරණි උමඟ හඳුනාගැනීම සඳහා ඔක්තෝබර් මාසයේදී ක්ෂේත්‍ර කටයුතු සිදු කරන ලදී.

ඒ. එම්. එම්. රත්නායක මහතා / භූ විද්‍යාඥ සහ ඩී. එම්. එස්. දිසානායක මහතා / භූ විද්‍යාඥ

- බලන - ඉහළ කෝට්ටේ අතර දුම්රිය මාර්ගයෙහි ඇති දෝෂය පරීක්ෂා කිරීමේ කටයුතු නොවැම්බර් මාසයේදී සිදු කරන ලදී.

ඩී. එම්. එස්. දිසානායක මහතා / භූ විද්‍යාඥ

- කිතුල්ගල ප්‍රදේශයේ දැනට සිදු කරමින් පවතින ජල විදුලි ව්‍යාපෘතියට අදාල කැනීම් බලපත්‍ර දීර්ඝ කිරීම සඳහා නිර්දේශ සකස් කිරීමට භූ විද්‍යා පරීක්ෂාවක් සිදු කරන ලදී.

- ආචාර්ය ඩබ්ලිව්. අයි. එස්. ප්‍රනාන්දු මහතා යාපනය අර්ධද්වීපය තුළ පොළොවෙහි හදිසි ඉරි තැලීම් ඇති වීමට හේතුව අනාවරණය කර ගැනීම සඳහා පරීක්ෂණයක් සිදු කරන ලදී.

- කිරින්ද ප්‍රදේශයේ රබහ මැණික් පතල සම්බන්ධයෙන් ඒකාබද්ධ පරීක්ෂා කිරීමක් මැයි මාසයේදී සිදු කරන ලදී.

- ටෝකියෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ටකාෂි මහතා සමග එක්ව පාෂාණ පෘෂ්ඨීකරණය සම්බන්ධයෙන් පර්යේෂණයන් සිදු කිරීම සඳහා අරංගල ගුහනයිට් නිධිය ආශ්‍රිතව නිදර්ශක එකතු කරන ලදී.

- ගලහ ප්‍රදේශය තුළ සති කිහිපයක් තිස්සේ ස්වාභාවික දුම් විමෝචනයන් සිදු වූ ස්ථානයන් පිලිබඳව පරීක්ෂණයක් සිදු කරන ලදී.

- හම්බන්තොට ප්‍රදේශයේ බොරළු පතල සම්බන්ධව ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කරන ලදී.

ඩී. පී. ආර්. වීරකෝන් මහත්මිය - භූ විද්‍යාඥ

- මාඔය ජලා දෝනියෙහි කාර්මික මැටි කැනීම් ආශ්‍රිත ස්ථාන 6 ක ඒකාබද්ධ පරීක්ෂා කිරීම් සිදු කරන ලදී. කාර්මික කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අදාල ස්ථානවල යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා මෙය සිදු කරන ලදී.

- බනිජමය උල්කාෂ්මය හඳුනා ගැනීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය තුළ සංචාරයන් සිදු කරන ලදී.

- ගිං ගඟ ප්‍රදේශය තුළ කණ්ඩායම් ක්ෂේත්‍ර කටයුත්තක් සිදු කරන ලදී.

- කැළණි ගඟ හා ගිං ගඟ තුළ වැලි පැවතීම පිළිබඳව ඇති වර්තමාන තත්ත්වය සහ බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡාවකට සහභාගි වන ලදී.

- ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි රැස්වීමකට සහභාගි වන ලද අතර පසුගිය වර්ෂ 5 තුළ ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීම සහ පරිභෝජනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

- ට්‍රිපල් සුපර් පොස්පේට් සහ සින්ගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීමේදී එප්පාවල පොස්පේට් නිධිය සඳහා අගය එකතු කිරීමේ යෝජනා සම්බන්ධයෙන් ආයෝජන කලාපය තුළ පවත්වන ලද රැස්වීමකට සහභාගි වන ලදී.

ඩී. ටී. ඩී. එස්. විජේසුන්දර මෙනවිය / භූ විද්‍යාඥ

- කෑගල්ල ප්‍රදේශයෙහි නායයාම් පරීක්ෂණ කටයුතුවලදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමග එක්ව ඒකාබද්ධ පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. නායයාම් අවදානම් තත්ත්ව ඇගයීමට සහ නැවත පදිංචි කිරීම සඳහා සුදුසු ඉඩම් පරීක්ෂා කිරීම සඳහා 2016 ජූලි මස 10 සිට 17 දක්වා කාලය තුළ බුලත්කොහුපිටිය, වරකාපොල, කෑගල්ල සහ අරනායක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කරන ලදී.

- නුවර මහේස්ත්‍රාත් නිල නිවස පිහිටි භූමියෙහි ඇති වීමට ඉඩ ඇතැයි ප්‍රකාශ වුණු නායයෑම් හෝ බෑවුම් දෝෂයක් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා 2016 සැප්තැම්බර් මස 03 දින කෙටි ක්ෂේත්‍ර සංචාරයක් සිදු කරන ලදී. 'නුවර මහේස්ත්‍රාත් නිල නිවස පිහිටි භූමියෙහි ඇති වුනු ඉරිතැලීම් පිළිබඳව භූ විද්‍යාත්මක පරීක්ෂණය' යන නමින් ඒ පිළිබඳ වාර්තාවක් ඔක්තෝබර් මස මුල් භාගයේදී ඉදිරිපත් කරන ලදී.

- පස් කැනීම් සිදු කිරීම හේතු කොටගෙන ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයන් මත බලපත්‍ර තාවකාලිකව අහෝසි කරන ලද පතල් කිහිපයක් පරීක්ෂා කිරීම සඳහා 2016 ඔක්තෝබර් මස 24, 25 සහ 27 යන දිනවලදී පිළිවෙලින් මීරිගම, තුල්හිරිය සහ රුවන්වැල්ල යන ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා සිදු කරන ලදී.

'මීරිගම හා රුවන්වැල්ල යන ප්‍රදේශවල පස් කැනීම පිළිබඳ විමර්ශනය සහ 'තුල්හිරිය ප්‍රදේශය තුළ පස් කැනීම පිළිබඳ විමර්ශනය' යන මැයෙන් වූ වාර්තා නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී.උමා ඔය ව්‍යාපෘතිය හේතු කොටගෙන ඇති වූ සිද්ධියක් ලෙස ප්‍රකාශ වුණු බණ්ඩාරවෙල ප්‍රදේශයේ ඉඩම් ගිලාබැසීමක් සම්බන්ධයෙන් රූපවාහිනී නාලිකාවක විකාශනය වූ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කරන ලදී. රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම මත මෙය සිදු කරන ලදී. මෙම ගැටළුව සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ගෙන ඇති පියවර පිළිබඳව විමසීමට ඔවුන් සමග සාකච්ඡාවක් සිදු කරන ලද අතර 2016 දෙසැම්බර් මාසයේදී ඒ පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශය වෙත යවන ලදී.

පෙබරවාරිමස 27 වන දින රත්නපුර දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කමිටුව සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජල ගැලීම් පෙරහුරු වැඩසටහනෙහි සමාලෝචන සාකච්ඡාවෙහි ඇගයීම්කරුවකු ලෙස භූ භෞත විද්‍යාඥ එස්. එස්. බී. තල්දෙන මහත්මිය සහභාගි වූවාය. සිද්ධි විධාන පද්ධතිය භාවිතා කිරීම සම්බන්ධයෙන් මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.

භූ විද්‍යාඥ ඒ. එම්. ඩී. යූ. අබේසිංහ මහතා පහත සඳහන් කාර්යයන්ට සම්බන්ධ විය.

- 2016.03.01 දින විදුම් කටයුතු සඳහා මස්කෙලිය ප්‍රදේශය තුළ සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකාව
- කැළණි ගඟෙහි ඉඩ ධාරා ප්‍රදේශයට ඔබ්බෙන් සිදු කරන ලද මූලික වැලි ගවේෂණය, වාර්තාව ඉදිරිපත් කරන ලදී.
- 2016 පෙබරවාරි මස 23 සිට 24 දක්වා සහ 2016 මාර්තු 17 සිට 21 දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකාව
- සෙවනගල - කොවුලාර ෆෙල්ඩ්ස්පාර් පතල පරීක්ෂා කිරීම - 2016.03.17
- ජනාධිපති නිල නිවසෙහි අවහාර සිදුර - 23.03.2016
- රාජගිරිය විදුම් ප්‍රදේශය තුළ සිදු කරන ලද සංචාරය - 28.03.2016
- ගාල්ල මැලිබන් රෝහලෙහි නව වාට්ටුවෙහි අත්තිවාරම පරීක්ෂා කිරීම - 19.04.2016
- රත්නපුර නව කාර්යාල ගොඩනැගිල්ල තුල ක්ෂේත්‍ර චාරිකාව සහ සිදුරු විදීම් සඳහා කටයුතු සම්පාදනය කිරීම - 11.05.2016
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ එක්ව නාය යෑම් උවදුරු පරීක්ෂා කිරීම සහ ආපදා තත්ත්ව සම්බන්ධයෙන් ආධාර ලබා දීම - 25.05.2016 - 03.06.2016
- 2016 ජූනි මස 14 සිට 17 දක්වා කාලය තුළ ආඩිගම, තඹබෝව, පල්ලම, එප්පාවල පොස්පේට් නිධිය සහ මීගමුව වෙරළ තීරය යන ප්‍රදේශවල ප්‍රුරාසික් අවසාදිතයන් තුළ ඛනිජ වැලි ගවේෂණය කිරීම

Sri Lanka Next - 2016 ඔක්තෝබර් 16 සිට 18 ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය මගින් විශ්ලේෂණය කිරීම පිණිස එප්පාවල නියැදි ලබා ගැනීම

ප්‍රදර්ශන / සම්මන්ත්‍රණ / දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මුලතිවු මූලික කඳවුරෙහි සංවිධානය කරන ලද ව්‍යසන කළමනාකරණ පාඨමාලාවට අදාලව සුනාමි හා භූමිකම්පා පිළිබඳ එක් දින වැඩසටහනක් භූ විද්‍යාඥ එස්. ඒ. කළුබණ්ඩාර මහතා සහ භූ භෞතික විද්‍යාඥ එන්. එස්. බී. තල්දෙන මෙනවිය විසින් දෙසැම්බර් මස 17 දින පවත්වන ලදී.

ශිෂ්‍යයන් සහ මහ ජනතාව සඳහා සංවිධානය කරන ලද ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

1. පොලොන්නරුව - ලෝක පරිසර දිනය - ප්‍රදර්ශනය
2. කළුතර බාලිකා විද්‍යාලය - ප්‍රදර්ශනය
3. පිටකෝට්ටේ ශාන්ත අන්තෝනි විද්‍යාලය
4. ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය - ප්‍රදර්ශනය
5. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව (ස්වර්ණාභරණ ප්‍රදර්ශනය)
6. බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව (Sri Lanka Next) ප්‍රදර්ශනය

දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගි වීම

2 වගුව : දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගි වීම

වැඩසටහන	නිලධාරියාගේ නම	ස්ථානය	කාල පරිච්ඡේදය
පතල් හා බණිජ පනතෙහි නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළුව	ඩී. ටී. ඩී. එස්. විජේසුන්දර මෙනවිය ඩී. පී. ආර්. වීරකෝන් මහත්මිය	කුකුලේ ගඟ නිවාඩු නිකේතනය	2016 ජනවාරි 29-30
මිනුම්දෝරු දෙපාර්තමේන්තුවෙහි සහයෝගය ඇතිව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද පාර්ශ්වකාර වැඩමුළුව	ඩී.ටී.ඩී.එස්. විජේසුන්දර මෙනවිය එස්.එන්.බී. තල්දෙන මෙනවිය	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	2016 ජනවාරි 21
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සංවිධානය කරන ලද නායකත්ව පුහුණු වැඩසටහන	ආචාර්ය සී. එච්. ඊ. ආර්. සිරිවර්ධන කේ. ටී. යූ. එස්. ද සිල්වා මහතා වයි. පී. එස්. සිරිවර්ධන මහත්මිය අජිත් ප්‍රේමි මහතා එස්. ටී. කළුබන්ඩාර මහතා ඩී. ටී. ඩී. එස් විජේසුන්දර මෙනවිය එස්. එන්. බී. තල්දෙන මෙනවිය	MAS Fabric Park පරිශ්‍රය තුල්හිරිය	2016 නොවැම්බර් 12-13
විස්තීරණ න්‍යෂ්ඨික පර්යේෂණ තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය විසින් සංවිධානය කර ඇමෙරිකා එක්සත් ජනපදයේ නෙවාඩාහි පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩමුළුව	ඩී. ටී. ඩී. එස් විජේසුන්දර මෙනවිය	ඇමෙරිකා එක්සත් ජනපදය	2016 මැයි 14 සිට 23

ජයිකා ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරන ලද ජපානය සහ ශ්‍රී ලංකාව තුල ලබා ගන්නා ලද අත්දැකීම් මත පදනම්ව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය සමාලෝචනය පිලිබඳ 2 වන වැඩමුළුව	අජිත් ප්‍රේම මහතා එස්. එන්. බී. තල්දෙන මෙනවිය	ටාජ් සමුද්‍රා හෝටලය, ශ්‍රී ලංකාව	2016 ජනවාරි 14
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජපන් අභ්‍යවකාශ ගවේෂණ නියෝජිතායතනය එක්ව සංවිධානය කරන ලද 'සෙන්ටිනල් ඒෂියා පියවර 3' වැඩසටහන පිළිබඳව වූ 3 වන ඒකාබද්ධ ව්‍යාපෘති කණ්ඩායම් සාකච්ඡාව	එස්. එන්. බී. තල්දෙන මෙනවිය	ගල්කිස්ස මහ හෝටලය - ශ්‍රී ලංකාව	2016 ජනවාරි 19
ජයිකා ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කරන ලද ජපානය හා ශ්‍රී ලංකාව තුල ලබා ගන්නා ලද අත්දැකීම් මත පදනම්ව ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ යාන්ත්‍රණය පිලිබඳ වැඩමුළුව	එස්. එන්. බී. තල්දෙන මෙනවිය	සිනමන් ලේක්සයිඩ් හෝටලය	2016 ජනවාරි 24
චීනයේ භූ විද්‍යා සමීක්ෂණ ආයතනයේදී පවත්වන ලද දියුණු වෙමින් පවතින රටවල් සඳහා වූ භූ රසායනික සිතියම් සැකසීම සහ පාරිසරික භූ රසායනික පරීක්ෂණ කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාව	එච්. ඒ. පී. ජයලත් මහත්මිය	චීනය	2016 සැප්තැම්බර් 9-29
පරීක්ෂණ සහ ක්‍රමාංකන විද්‍යාගාර ප්‍රතිනතය කිරීම සම්බන්ධයෙන් ඇගයීම්කරුවන් සඳහා වූ පුහුණු පාඨමාලාව	වයි. පී. එස්. සිරිවර්ධන මහත්මිය	ශ්‍රී ලංකා ප්‍රතිනත මණ්ඩලය	2016 ඔක්තෝබර් 17-21
අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතන වැඩමුළුව	ඒ. එම්. ඩී. යූ. අබේසිංහ මහතා	ගලදාරි හෝටලය	2016 ජූලි 11-15
සම්මන්ත්‍රණය	ඒ. එම්. ඩී. යූ. අබේසිංහ මහතා	චීනය	2016 සැප්තැම්බර්12-27

කැනීම් අංශය

කැනීම් අංශයෙහි ප්‍රධාන කටයුතු

ප්‍රාදේශීය කාර්යාල 14 ක් තුලින් පතල් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. විවිධ කැනීම් කර්මාන්තවල නියුතු සේවාදායකයන් සඳහා සේවාවන් ලබා දීම සඳහා මෙම කාර්යාල ස්ථාපනය කරනු ලැබ ඇත. 1992 අංක 33 දරන පතල් හා බනිජ පනතට හඳුන්වා දෙන ලද මෑතකාලින සංශෝධන ප්‍රකාරව නීති විරෝධී කටයුතු පාලනය කිරීම සඳහා කාර්යංශය වෙත පුළුල් බලතල ලබා දී ඇත. මෙම අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කටයුතු තුලට ස්ථානීය පරීක්ෂා කිරීම් සිදුකිරීම, පරීක්ෂණ පිපිරවීම් සිදු කිරීම, මහජන පැමිණිලි විමර්ශනය කිරීම, බනිජ කැනීම, වෙළඳාම, ගවේෂණය සහ ප්‍රවාහනය සඳහා බලපත්‍ර ලබාදීම සහ නීතිවිරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම ඇතුලත් වේ. මෙම අංශයෙහි ප්‍රමුඛතම කාර්යයන් තුළට පහත සඳහන් කාර්යයන් ඇතුලත් වේ.ත;

- 1992 අංක 33 දරන පතල් හා බනිජ පනත ප්‍රකාරව බනිජ කැනීම, බනිජ සැකසීම සහ බනිජ අපනයනය සඳහා වාණිජමය ශක්‍යතාව ඇගයීම

- බලපත්‍ර නිකුත් කිරීම මගින් බනිජ ගවේෂණය, කැනීම, සැකසීම, වෙළඳාම සහ අපනයනය නියාමනය කිරීම ද වාණිජමය මට්ටමකින් බනිජ නිස්සාරණය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

ලබා දෙනු ලබන සේවාවන්

- පතල් පරීක්ෂා කිරීම (ජංගම සේවය, බලපත්‍ර නිකුත් කිරීම, තාක්ෂණික සේවා ලබා දීම)

- විශේෂඥ සේවාවන් (පිපිරවීම් ශිල්පීයක්‍රම, බලපත්‍ර නවීකරණය කිරීම,ආරක්ෂණ ක්‍රම, පරීක්ෂණ පිපිරවීම්, ඉරි තැලීම්, ගවේෂණය කිරීම)

- දැනුවත් කිරීමේ වැඩසටහන් (රාජ්‍ය නිලධාරීන් හා බලපත්‍ර හිමියන්ට සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, කැනීම් කටයුතුවල නිරත වීම,ප්‍රදර්ශනය සම්බන්ධයෙන් ජනතාව සඳහා වැඩමුළු පැවැත්වීම)

- පුනරුත්ථාපන වැඩසටහන් (පරිසරය ආරක්ෂා කිරීම සඳහා පතල් දිරිගැන්වීම සහ පතල් මගින් සිදුකරනු ලබන පාරිසරික ආරක්ෂණ හා පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය කිරීම) බලපත්‍ර නිකුත් කිරීම තුළින් උපයනු ලබන ආදායම 1992 අංක 33 දරන පතල් හා බනිජ පනත යටතේ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පහත සඳහන් බලපත්‍ර වර්ග නිකුත් කරනු ලැබේ.

- ගවේෂණ බලපත්‍ර

- කැනීම් බලපත්‍ර (ශිල්පීය, කාර්මික, විශේෂිත බණිජ)

- වෙළඳ පත්‍ර

- අපනයන බලපත්‍ර

- ප්‍රවාහන බලපත්‍ර

බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත දැක්වේ:

- ගවේෂණ බලපත්‍ර (EL) - (ආදායම්)

බලපත්‍රය මගින් අවසර ලබා දෙන ලද සියළුම බනිජ වර්ග ගවේෂණය කිරීම සඳහා විශේෂිත අයිතිය මෙම බලපත්‍රය මගින් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබේ.

- කැනීම් යන්ත්‍ර

ශිල්පීය කැනීම් බලපත්‍ර (AML) - (ආදායම්)

හෙක්ටයාරයක් නොඉක්මවන භූමි ප්‍රදේශයක් තුළ හෝ මීටර් 25 ක් නොඉක්මවන ගැඹුරක් දක්වා බලපත්‍රය තුළ විශේෂිතව දක්වා ඇති සියළුම බනිජ වර්ග කැනීම, සැකසීම සහ වෙළඳාම සඳහා විශේෂිත අයිතිය මෙම බලපත්‍රය මගින් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබේ.

(අ) කණ්ඩායම - පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අඩංගු වේ.

- විදුම් සිදුරෙහි ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය.
- නිෂ්පාදන ධාරිතාවය මාසයකට ඝන මීටර් 100 ට නොඅඩු සහ ඝන මීටර් 600 ට නොවැඩි විය යුතුය.
- යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතුය.

(ආ) කාණ්ඩය - පහත සඳහන් කොන්දේසි එකක් හෝ කිහිපයක් අඩංගු වේ.

- විදුම් සිදුරෙහි ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය.
- නිෂ්පාදන ධාරිතාවන් මාසයකට ඝන මීටර් 100 නොඉක්මවිය යුතුය.
- යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතු වේ.

කාර්මික කැනීම් බලපත්‍ර (IML) - (ආදායම්)

මෙකී බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය තුළ සඳහන් කර ඇති සියළුම බනිජ ගවේෂණය, කැනීම, සැකසීම සහ වෙළඳාම සඳහා විශේෂිත අයිතිය මෙම බලපත්‍රය මගින් ලබා දෙනු ලැබේ. කාර්මික කැනීම් බලපත්‍ර කාණ්ඩ 3 ක් ඇත.

(අ) කාණ්ඩය (පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුලත් වේ)

- පිපිරවීම් ක්‍රමය - ප්‍රමාද කිරීමේ මූලද්‍රව්‍ය යොදා ගනිමින් බහුවිධ විදුම් සිදුරු
- විදුම් සිදුරෙහි ගැඹුර - මීටර් 3 ට වැඩි විය යුතුය.
- නිෂ්පාදන ධාරිතාවය - මාසයකට ඝන මීටර් 1500 ට වැඩි විය යුතුය.
- භාවිතා කළ හැකි යන්ත්‍රෝපකරණ

(ආ) කාණ්ඩය (පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් වේ.)

- පිපිරවීම් ක්‍රමය - තනි විදුම් සිදුර
- විදුම් සිදුරේ ගැඹුර - මීටර් 1.5 ට නොඅඩු ඝන මීටර් 3.0 ට නොවැඩි
- නිෂ්පාදන ධාරිතාවය - ඝන මීටර් 1500 ට නොඅඩු සහ ඝන මීටර් 600 ට නොවැඩි විය යුතුය.

ඇ කාණ්ඩය (පහත සඳහන් කොන්දේසි එකක් හෝ වැඩි ගණනක් ඇතුලත් විය හැකිය)

- විසිරවීම් ක්‍රමය - තනි වෙඩි සිදුර
- විදුම් සිදුරේ ගැඹුර - මීටර් 1.5 ට වඩා අඩු
- නිෂ්පාදන ධාරිතාවය - මාසයකට ඝන මීටර් 600ට වඩා අඩු විය යුතුය.

විශේෂිත බනිජ බලපත්‍ර (RML) - (ආදායම්)

විශේෂිත බනිජ ගවේෂණය කැනීම, සැකසීම හා වෙළඳාම සඳහා වන බලපත්‍රය අමාත්‍යවරයාගේ අනුමැතිය මත ලබා දිය හැකිය.

- **වෙළඳ බලපත්‍ර (TDL) - (ආදායම්)**

යම් යම් බනිජ මිලදී ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා වෙළඳාම සහ එකී බනිජ අපනයනය කිරීම සඳහා විශේෂිත නොවන අයිතිය වෙළඳ බලපත්‍රය මගින් අධ්‍යක්ෂවරුන්ගේ විශේෂ අනුමැතිය සහිතව ලබා දෙනු ලැබේ.

අ කාණ්ඩය - අපනයනය සඳහා බනිජ වෙළඳාම

ආ කාණ්ඩය - දේශීය වශයෙන් බනිජ වෙළඳාම් කිරීම

ඇ කාණ්ඩය - අතින් නිෂ්පාදනය කරන ලද ගඩොල් සහ හුණු වෙළඳාම් කිරීම

- **ප්‍රවාහන බලපත්‍ර - (ආදායම්)**

බලපත්‍රය තුළ නිශ්චිතව සඳහන් කර ඇති බනිජ හෝ බනිජ අඩංගු ද්‍රව්‍ය නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයක් නිශ්චිතව සඳහන් කර ඇති කාල පරිච්ඡේදයක් තුළ ප්‍රවාහනය කිරීම සඳහා මෙම බලපත්‍ර ලබා දෙනු ලැබේ. සියලුම ගවේෂණ, කැනීම් සහ වෙළඳපත්‍ර වලට අදාලව බනිජ හෝ බනිජ අඩංගු ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන බලපත්‍රයක් තිබිය යුතු වේ.

- **බනිජ අපනයනය - (ආදායම්)**

සියළුම ගවේෂණ, කැනීම් සහ වෙළඳ බලපත්‍ර වලට අදාලව එකී බලපත්‍ර නිකුත් කරන ලද බනිජ අපනයනය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂවරයාගේ විශේෂ අවසරය ලබා ගත යුතු වේ.

පුරස්කාර - (ආදායම්)

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබා ගන්නා ලද පුරස්කාර ආදායම් පහත වගුව මගින් පෙන්නුම් කරනු ලැබේ. ලැබෙන පුරස්කාර ආදායමෙහි සාමාන්‍ය වර්ධනයක් එමගින් පෙන්නුම් කරනු ලැබේ.



1 වගුව : 2013 සිට 2016 දක්වා කාලය තුළ පුරස්කාර ආදායම

වර්ෂය	පුරස්කාර ආදායම (රු. මිලියන)
2013	681.27
2014	1,128.46
2015	1,293.43
2016	1,578.58

පතල් පරීක්ෂා කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම

පහත සඳහන් ප්‍රස්තාරය තුළ පෙන්නුම් කර ඇති පරිදි පතල් පරීක්ෂා කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම ඉහළ යෑම තුලින් රටෙහි බනිජ කර්මාන්තයෙහි ශීඝ්‍ර ඉහළයාම පෙන්නුම් කරනු ලැබේ. 2013 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුළදී පතල් පරීක්ෂා කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම.



වර්ෂය	පරීක්ෂා කිරීමේ ගාස්තුව (රු. මිලියන)
2013	153.23
2014	140.15
2015	182.94
2016	247.95

බලපත්‍ර සකස් කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම

බනිජ ගවේෂණය , කැනීම ,වෙළඳාම, ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත් නිකුත් කිරීම තුලින් උපයන ලද අදායම පහත සටහන තුලින් පෙන්නුම් කෙරේ.2013 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ දී බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයා ගන්නා ලද ආදායම.



වර්ෂය	බලපත්‍ර ගාස්තු (රු. මිලියන)
2013	91.15
2014	75.60
2015	80.00
2016	224.8

2016 වර්ෂය තුළ ලබා ගන්නා ලද කාර්යසාධනයෙහි සාරාංශය (මූල්‍ය හා භෞතික)

රු. මිලියන

	සංරචක/ කාර්යය	මූල්‍ය භෞතික	ප්‍රතිපාදන වර්ගය	ඒකකය	වාර්ෂික ප්‍රතිපාදන සහ අරමුණු	මූල්‍ය හා භෞතික ප්‍රගතිය
1	1992 අංක 33 දරන පතල් හා බනිජ පනත ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීම					
1.1	ශිල්පීය කැනීම් බලපත්‍ර (AML)					
1.1.1	ශිල්පීය කැනීම් බලපත්‍ර - අ කාණ්ඩය	මූ හෞ	ආදායම	රු.මි. ගණන	3.120 1040	5.445 1820
1.1.2	ශිල්පීය කැනීම් බලපත්‍ර - ආ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	3.759 3007	2.756 2217
1.2	කාර්මික කැනීම් බලපත්‍ර (IML)					
1.2.1	කාර්මික කැනීම් බලපත්‍ර - අ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	3.160 158	125.745 142
1.2.2	කාර්මික කැනීම් බලපත්‍ර - ආ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	12.600 1575	13.600 1885
1.2.3	කාර්මික කැනීම් බලපත්‍ර - ඇ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	6.092 1523	3.036 730
1.3	වෙළඳ බලපත්‍ර (TDL)					
1.3.1	වෙළඳබලපත්‍ර - අ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	0.112 15	0.090 12
1.3.2	වෙළඳබලපත්‍ර - ආ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	4.830 966	9.690 1938
1.3.3	වෙළඳබලපත්‍ර - ඇ කාණ්ඩය	හෞ මූ	ආදායම	රු.මි. ගණන	0.000 0	0.006 5
1.4	ප්‍රවාහන බලපත්‍ර (ලෝහ භාණ්ඩ වෙළඳ බලපත්‍ර)	හෞ මූ	ආදායම	රු.මි. ගණන	41.108 456,750	48.879 543,105
1.4.1	දෘඩාංග	හෞ	ආදායම		0.000	5.206
1.5	අපනයන අවසරපත්‍ර	හෞ මූ	ආදායම	රු.මි. ගණන	2.965 593	2.455 491
1.6	ගවේෂණ බලපත්‍ර (EL)	හෞ	ආදායම	රු.මි. ගණන	2.541	7.889

2	බනිජ ප්‍රවාහන කටයුතු අධීක්ෂණය කිරීම මගින් නීති විරෝධී කැනීම් කටයුතු සහ පාරිසරික හානිය අවම කිරීම	හෙෘ මූ			20.000 500	0.000 0
3	පරිසරයට හිතකාමී ලෙස කැනීම් කටයුතු සිදුකිරීම සහ පාරිසරික පුනරුත්ථාපන කටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් විකාශනය කිරීම	හෙෘ මූ			9.000 40	0.000 0
4	කාර්මික කැනීම් බලපත්‍ර - අ කාණ්ඩය	හෙෘ	ආදායම	රු. මි.	1431.889	1578.584
6	පරීක්ෂණ පිපිරවීම් සිදුකිරීම	හෙෘ	ආදායම	රු. මි.	4.725	4.737
7	බැංකු ඇපකර මුදල් නැවත ලබා දීම	හෙෘ	ආදායම	රු. මි.	0.586	0.146
8	සුළු ආදායම් - කැනීම්	හෙෘ	ආදායම	රු. මි.	0.400	0.407
9	ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිකුත් කරන ලද ප්‍රවාහන බලපත්‍ර	හෙෘ	ආදායම	රු. මි.	1.975	Included in 1.4
10	නිදර්ශක අපනයනය කිරීම	හෙෘ	ආදායම	රු. මි.	0.105	0.080
11	පිපිරවීම් පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන්න පැවැත්වීම	හෙෘ මූ	භූ.ස.ප.කා.	රු. මි.	0.347 2	0.454 1
12	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	හෙෘ	භූ.ස.ප.කා.	රු. මි.	(8.420)	(0.241)
13	පුනරුත්ථාපන කටයුතු කඩිනමින් සිදු කිරීම	හෙෘ	භූ.ස.ප.කා.	රු. මි.	(3.600)	(0.023)
14	අධීක්ෂණ කටයුතු කඩිනමින් සිදු කිරීම	මූ			12	0
	මුළු එකතුව				1691.618	2051.690

ප්‍රාදේශීය කාර්යාල :

නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ, පොලොන්නරුව සහ කොළඹ පිහිටි ප්‍රාදේශීය කාර්යාල 16 ක් සහ හසලක සහ කන්තලේ පිහිටි උප කාර්යාල 2 ක් තුලින් කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. අදාල පළාත් තුළ විවිධ කැනීම් කටයුතු වටල නිරත සේවාදායකයන් සඳහා වඩාත් හොඳ සේවාවක් ලබා දීම සහ නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම මෙම ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන් වේ.

2016 වර්ෂය තුළ මෙම ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය බනිජ ඉංජිනේරුවරුන්ගේ නාම ලේඛනය පහත සඳහන් වේ :

ප්‍රාදේශීය කාර්යාලය	- ප්‍රාදේශීය කැනීම් ඉංජිනේරුවරු
මහනුවර	- ධම්මික ප්‍රසාද් මහතා, එස්.ඒ.අයි.ජේ. රොද්‍රිගු මහතා
කුරුණෑගල	- එස්.ඒ.අයි.ජේ.රොද්‍රිගු මහතා, එන්.ඩබ්.පී.පී. ලංකා මහතා, ධම්මික ප්‍රසාද් මහතා
මාතර	- යු.එච්.ටී. ප්‍රියන්ත මහතා, කේ. වී. ජගත් මහතා
බදුල්ල	- ටී.එම්.ඩබ්. බණ්ඩාර මහතා, ඩබ්ලිව්.ඒ.එස්. රූපවංශ මහතා
අනුරාධපුරය	- චමිල කරුණානන්ද මහතා, කේ.එන්.ඩබ්.කේ. විමලරත්න මහතා
රත්නපුරය	- ටී. එස්. කුමාර මහතා, ඒ. එම්. එච්. පී. අධිකාරි මහතා
අම්පාර	- එච්.කේ.සී.කේ.ඩබ්. බණ්ඩාර මහතා, එම්.ආර්.එම්.ෆාරිස් මහතා
මොනරාගල	- ඩබ්.පී.එස්. කෝකිල මහතා, ටී.එම්.ඩබ්. බණ්ඩාර මහතා
හම්බන්තොට	- ඩබ්ලිව්. ඒ. එස්. රූපවංශ මහතා, යූ.එම්. ටී. ප්‍රියන්ත මහතා
ත්‍රිකුණාමලය	- කේ.එන්.කේ.ඩබ්. විමලරත්න මහතා, ඩී මයුරන් මහතා
මඩකලපුව	- එම්. ආර්. එම්. ෆාරිස් මහතා, එච්. කේ. සී. කේ. ඩබ්. බන්ඩාර මහතා
යාපනය	- ඩී. මුයරන් මහතා, චමිල කරුණානන්ද මහතා
කළුතර	- කේ. වී. ජගත් මහතා, ටී. එස්. කුමාර මහතා, අයි.එම්.ටී.එන්. ඉලංකොන් මහතා
ගම්පහ	- එච්. කේ. එම්. ගුණසේකර මහතා, එච්.ඒ.අයි.කේ.රුද්‍රිගු මහතා, එන්.ඩබ්.ඩී.පී. ලංකා මහතා
පොළොන්නරුව	- ඒ.එම්.එච්.වී. අධිකාරි මහතා, ෂෙල්ටන් මහතා
කොළඹ	- යූ. එන්. ඩිලන්ති මහත්මිය

කැනීම් අංශය විසින් සිදු කරන ලද විශේෂ කටයුතු සහ ජාතික ආර්ථිකයකට සිදු කරනු ලබන දායකත්වය

පිපිරවීම් කටයුතු භාරව වැඩමූලිකවරුන්ගේ සහ එම කටයුතු පිළිබඳව වගකීම දරන පුද්ගලයන්ගේ ශක්‍යතාවය සහ දැනුවත්භාවය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙලක් ලෙස පිපිරවීම් හා පිපිරවීම් ආශ්‍රිත කටයුතු පිළිබඳ පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස පවත්වාගෙන යාමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හැකි විය. මීට අමතරව, පිපිරවීම් කටයුතු, පතල්වල ආරක්ෂාව, පතල් කළමනාකරණය, පාරිසරිය සහ සමාජීය පැතිකඩ පිළිබඳව කැනීම් බලපත්‍රලාභීන්ගේ දැනුම හා අවබෝධය ඉහළ නැංවීම සඳහා ඔවුන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් පවත්වනු ලැබේ. නීතිවිරෝධී කැනීම් කටයුතු දුරලීම සඳහා විශේෂ කාර්ය බලකායෙහි සහ අදාල පොලිස් ස්ථානවල සෘජු සහයෝගය ඇතිව කැනීම් අංශය විසින් රට පුරාම වැටලීම් මාලාවක් සිදු කරන ලදී. කැනීම් කටයුතු වඩාත් විධිමත්, තිරසාර සහ සංවිධානාත්මක ආකාරයකින් සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට නිතිපතා සිදු කරනු ලබන ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කරන ලදී. කැනීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය තුළට දිස්ත්‍රික් කමිටු යාන්ත්‍රණය හඳුන්වා දීම තුලින් බොරළු කැනීමේ ක්‍රියාවලිය වඩාත් ඵලදායී සහ සංවිධානාත්මක කිරීමට හැකියාව ලැබුණි. බනිජ ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ විධිමත්භාවය සවිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේද සහයෝගය ඇතිව කාර්යසාධක හා ස්වයංක්‍රිය ලෙස ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට පතල් අංශය විසින් සැලසුම් කරමින් සිටියි. පතල් ප්‍රදේශ සාධනීය ලෙස පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සහ පතල් පරීක්ෂා කිරීමේ කටයුතු සහිතව පතල් ආශ්‍රිත කටයුතු සාර්ථක ලෙස සිදු කරගෙන යාමට පියවර ගන්නා ලදී.

රෙගුලාසි සංශෝධනය කිරීම

රෙගුලාසි සංශෝධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විධායක කාර්ය මණ්ඩලයේ සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි හිටපු අධ්‍යක්ෂවරුන්ගේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සහභාගිත්වයෙන් දින දෙකක සේවාස්ථ වැඩමුළුවක් කුරුණෑගල ලාඩා ලෙජර් හෝටලයේදී පවත්වන ලදී.

2015 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කරන ලද ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ගේ නාමලේඛනය පහත දැක්වේ:

ප්‍රාදේශීය කාර්යාලය	**ප්‍රාදේශීය කැනීම් ඉංජිනේරුවරයා**
නුවර	ධම්මික ප්‍රසාද් මහතා
කුරුණෑගල	එස්.ඒ.අයිපේ. රොද්‍රිගු මහතා
මාතර	යූ. එච්. ටී. ප්‍රියන්ත මහතා
බදුල්ල	ටී. එම්. ඩබ්ලිව්. බණ්ඩාර මහතා
අනුරාධපුරය	චමිල කරුණානන්ද මහතා
රත්නපුරය	ටී. එස්. කුමාර මහතා
අම්පාර	එච්.කේ.සී.කේ.ඩබ්. බණ්ඩාර මහතා
මොනරාගල	ඩබ්ලිව්. ජී.එස්. කෝකිල මහතා
හම්බන්තොට	අසංක රුපවංශ මහතා
ත්‍රිකුණාමලය	කේ.එන්.ඩබ්.කේ. විමලරත්න මහතා
මඩකලපුව	එම්.ආර්.එම්. ෆාරිස් මහතා
යාපනය	ඩී. මයුරන් මහතා
කළුතර	කේ. වී. ජගත් මහතා
ගම්පහ	එච්. කේ. එම්. ගුණසේකර මහතා

මූල්‍ය සමාලෝචනය

2016 වර්ෂයේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිය ආදායම හා ලාභය තුළ ඉකුත් වර්ෂයට සාපේක්ෂව වර්ධනයක් අත්පත් කර ගත්තේය. 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රුපියල් මිලියන 1564 (2015 : රු. බිලියන 1037) ක ශුද්ධ ලාභයක් ලබා ගැනීමට කාර්යාංශයට හැකි විය. සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයෙහි ආදායම 33.1% කින් එනම් රු. මිලියන 2283 ක් දක්වා ඉහළ ගියේය. (2014 රු. මිලියන 1715)

පුරස්කාර ආදායම (2016 : රුපියල් මිලියන 1578)(2015 : රුපියල් මිලියන 1293) බලපත්‍ර ගාස්තු (2016 : රුපියල් මිලියන 224.7)(2015 : රුපියල් මිලියන 80), පරීක්ෂා කිරීම් ගාස්තු (2016 : රුපියල් මිලියන 248 2015 : රුපියල් මිලියන 185) විද්‍යාගාර ආදායම : 2016 : රු. මිලියන 3.2(2015 : රුපියල් මිලියන 3.5) ව්‍යාපෘති ආදායම (2016 : රුපියල් මිලියන 33, 2015 රුපියල් මිලියන 30 සහ පොළී ආදායම(2016 : රුපියල් මිලියන 116 , 2015 රුපියල් මිලියන : 69) යන ආදායම් කාර්යාංශයෙහි ආදායමට ඇතුලත් වේ.

ලපසුගිය වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂය තුළ ලාභය 50.8% කින් එනම් රුපියල් මිලියන 1564 දක්වා වැඩි විය. (2015 : රුපියල් මිලියන 1037)



නීති අංශය

කාර්යාංශය විසින් හා කාර්යාංශයට එරෙහිව පවරන ලද නඩු කටයුතුවලදී කාර්යාංශය නියෝජනය කිරීම නීති අංශයට පැවරුණු කාර්යයන්ට ඇතුලත් වේ. රටෙහි යම් යම් ප්‍රදේශවල සිදු කරන ලද අනවසර කැනීම් කටයුතු සහ පතල් ප්‍රදේශ නිසි ලෙස පුනරුත්ථාපනය නොකිරීම සම්බන්ධයෙන් කාර්යාංශය විසින් නඩු පවරන ලදී.

උසාවිවල නඩු 25ක් විභාග වෙමින් පැවතුණ අතර (ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, දිස්ත්‍රික් උසාවිය, මහාධිකරණය, පළාත් බද මහාධිකරණය, කම්කරු උසාවිය සහ මානව හිමිකම් කොමිෂන් සභාව) අනවසර කැනීම් කටයුතු සහ වැලි කැනීම් ස්ථාන පවත්වාගෙන ගිය පුද්ගලයන්ට එරෙහිව නඩු 06 ක් පවරන ලදී. ඉහත නඩු පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර උපදෙස් ලබා ගන්නා ලදී.

පතල් හා බනිජ පනතට එක් කරන ලද සංශෝධන සහ පතල් හා බනිජ පනතෙහි නීතිමය ගැටළු පිලිබඳව දැනුවත් කිරීම සඳහා පොලිස් නිලධාරීන්, විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්, අනිකුත් රජයේ නිලධාරීන් සහ කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලය, කොළඹ මරදාන පොලිස් අභ්‍යාස විද්‍යාලය, අම්පාර පොලිස් පුහුණු විද්‍යාලය, මඩකලපුව පොලිස් පුහුණු විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අටක් පවත්වන ලදී.

සම්පත් පුද්ගලයන්, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් මෝල්කාව පිහිටි කුරුණෑගල නිවාඩු නිකේතනයේදී 2016.01.09 දින වැඩමුළුවක් පවත්වන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 81/2004 මගින් ලාබ දෙන ලද නියෝගය ප්‍රකාරව මා ඔය නමැති ගඟෙහි වැලි පවතින ස්ථාන පිළිබඳව සිදු කරන ගවේෂණ සම්බන්ධයෙන් අදාල පාර්ශ්වකරුවන් සමග භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පවත්වන ලද සාකච්ඡා නීති අංශය විසින් සම්බන්ධීකරණය කරන ලදී. එලෙසම එම ගැටළු සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් පරිසර අධිකාරිය, සීමාසහිත පාරිසරික පදනම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන සමග ද නීති අංශය අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

මේ සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේදී සාකච්ඡා ගණනාවක් පවත්වන ලද අතර මෙම ප්‍රදේශයේ පරිසරය ආරක්ෂා කිරීම සහ මා ඔය ඔස්සේ ඉඩම් පරිහරණ රටාව හඳුනාගැනීම සඳහා වැඩිදුරටත් කටයුතු කරන ලදී. එලෙසම මා ඔයේ සිට මීටර් 100 ක දුරක ප්‍රදේශය තුළ වැලි කැනීම් කටයුතු සිදු කිරීමට අවසර ලබා නොදීමට සහ මෙම ප්‍රදේශයේ පාරිසරික පනතට අයත් ප්‍රදේශයක් ලෙස නම් කර ගැසට් පත්‍රයෙහි පළ කිරීමටද යෝජනා කරන ලදී.

නීති විරෝධී පතල් කැනීම් / බනිජ ප්‍රවාහන කටයුතු නතර කිරීම සහ මහජන පැමිණිලි හා 1992 අංක 33 දරන බනිජ හා පතල් පනත යටතට අයත් වැරදි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීමටද නීති අංශය විසින් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව එම නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකයට අයත් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සමග සාකච්ඡා වට ගණනාවක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හිදී සිදු කරන ලදී.

කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් පවත්වා කාර්ය සටහන් පිලියෙල කරන ලද අතර එකී කළමනාකරණ මණ්ඩල රැස්වීම් වලදී පවත්වන ලද සාකච්ඡා ප්‍රකාරව අදාල පසුවිපරම් කටයුතු ද සිදු කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වල කාර්ය සටහන්ද පිලියෙල කරන ලද අතර එකී විගණන හා කළමනාකරණ කමිටුවේ සහ කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් වල පවත්වන ලද සාකච්ඡා ප්‍රකාරව අදාල පසු විපරම් කටයුතු ද සිදු කරන ලදී.

කාර්ය ප්‍රධානීන්ගේ රැස්වීම් පවත්වා ඊට අදාළ කාර්ය සටහන් පිලියෙල කරන ලදී.

පන්නල, කුරුණෑගල, වැටකොටළුවැව, ගලහ, දුටුවැව, කැබිතිගොල්ලෑව, වලල්ලාවිට, වටගල ගල්වැව යන පතල් ප්‍රදේශවල ස්ථානීය පරීක්ෂා කිරීම් 5 ක් පතල් අංශය විසින් සිදු කිරීමට කටයුතු සැලසුම් කරන ලදී. අභියාචනාව විභාගයේදී පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබා දෙන ලද නියෝගය ප්‍රකාරව නිෂ්පාදන අපනයනයට අදාළ බනිජ ආයෝජන ගිවිසුම ඇගයීමට ලක් කිරීම සඳහා නීති අංශයේ නිලධාරියෙකු මෙම සංචාරයන් සඳහා සහභාගි විය.

හිඟ පුරස්කාර කටයුතු, පතල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම, ව්‍යාපෘති වලට අදාල ණයකරුවන් පරීක්ෂා කිරීම යනාදිය සම්බන්ධයෙන් ලිපිගොනු ගණනාවක් පිලියෙල කර එක් එක් ලිපිගොනුව සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කරන ලදී.

කතරගම සංචාරක බංගලාව ඉදි කිරීම සඳහා වෙන් කරන ලද භූමිය පරීක්ෂා කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද සමග පරීක්ෂණ චාරිකාවක් සිදු කිරීමට අවශ්‍ය කටයුතු නීති අංශය විසින් සම්පාදනය කරන ලදී.

ප්‍රාදේශිය කාර්යාල පිහිටි ඉඩම්වල ඔප්පු පරීක්ෂා කරන ලද අතර ප්‍රාදේශීය කාර්යාල සඳහා අදාළ කල්බදු ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

භූ විද්‍යා අංශය විසින් සිදු කිරීමට භාර ගන්නා ලද විදුම් ව්‍යාපෘතිවලට අදාල ගිවිසුම්ද නීති අංශය විසින් සකස් කරන ලදී.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ව්‍යාපෘති, බනිජ ගවේෂණ ඒකකය, මුර සේවා, ආරක්ෂක සේවා සහ වාහනවලට අදාල නොතාරිස්මය නොවන ගිවිසුම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙනුවෙන් පිලියෙල කිරීම සහ අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම සිදු කරන ලදී.

මානව සම්පත් පිළිබඳ සමාලෝචනය



සියළුම සේවකයන්	
ස්ථිර	309
කොන්ත්‍රාත් පදනම	10
බාහිර සේවා සපයන්නන්	92
පුහුණු ලාභීන්	136

සේවක ලැයිස්තුව - ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල



සේවක ලැයිස්තුව	
ප්‍රධාන කාර්යාලය	171
ප්‍රාදේශීය කාර්යාල	138

ස්ථිර සේවකයන් පිළිබඳ තොරතුරු



පුරුෂ	208
කාන්තා	101
මුළු එකතුව	309

ආයතනික පාලනය

ආයතනයක තරඟකාරිත්වය, වර්ධනය සහ තිරසාරත්වය සඳහා ආයයතනික පාලනය මූලික අවශ්‍යතාවයක් බව මුළු ලෝකය තුළම පිළිගත් කරුණකි. යහපාලන ක්‍රියාපිලිවෙත් කෙරෙහි තම බැඳියාවන් සම්බන්ධයෙන් ඉහළ සාධාරණාත්මක වටිනාකම් සහ වගවීමක් සහිතව සිය රාජකාරි ඉටු කිරීමට කළමනාකාරිත්ව මණ්ඩලය විසින් කටයුතු කරන්නේද යන්න කෙරෙහි දැඩි අවධානයක් යොමුකරනු ලැබ ඇත.

අපගේ කාර්යාංශය දිගුකාලීන වශයෙන් සාර්ථක වීමට සහ තම ගනුදෙනුකරුවන් හට වටිනාකමක් සහිත ආයතනයක් වීමට නම්, එය සමාජය සඳහා වටිනාකමක් සහිත ආයතනයක් වියයුතු වේ. සමාජය සඳහා වටිනාකමක් සහිත ආයතනයක් වීම සඳහා වන අපගේ ප්‍රවේශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද ස්ථිරසාර ප්‍රතිපත්ති හා වටිනාකම් මත පදනම් වී ඇත. නීතිමය අවශ්‍යතාවයන් සහ යහපත් ක්‍රමවේදයන් මත පදනම්ව අප විසින් නිරන්තරවම අපගේ පාලනය සමාලෝචනය කරනු ලැබේ.

ආයතනයේ හර පද්ධතීන් සහ දිගුකාලීන දැක්ම සුරැකීම කළමනාකාරිත්ව මණ්ඩලයේ කාර්යභාරය වන අතර, කාර්යාංශය වෙත ක්‍රමෝපායික මග පෙන්වීම සහ නිර්දේශ ලබාදෙනුයේ එමගිනි. ප්‍රධාන කටයුතු, මූල්‍ය, නීති සහ සේවාදායක කටයුතු ඇතුළු කාර්යයන් ගණනාවක් සම්බන්ධයෙන් රැස්වීම් පැවැත්වීම තුලින් ආයතනය පිලිබඳව නිරන්තරවම දැනුවත්වීම කළමනාකාරිත්ව මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාලනය කරනු ලබනුයේ කළමනාකාරිත්ව මණ්ඩලය විසිනි. විෂයභාර අමාත්‍යවරයා විසින් පතල් හා බනිජ පනතෙහි නියමයන් ප්‍රකාරව කළමනාකාරිත්ව මණ්ඩලයෙහි සාමාජිකයන් පත් කරනු ලැබේ. කළමනාකාරිත්ව මණ්ඩලය පහත දැක්වෙන පරිදි සාමාජිකයන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නීති නිලධාරිවරයා කළමනාකාරිත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

- කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
- පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්
- භූ විද්‍යාව, පතල්, ව්‍යාපාර කළමනාකරණය, මුදල් හා නීතිය යන ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ඇති බවට සහ දැනුම සතු බවට අමාත්‍යවරයාට පෙනී යන පුද්ගලයන් තිදෙනෙක්
- මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයෙකු
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා

මණ්ඩලයේ රැස්වීම්

කළමනාකාරිත්ව මණ්ඩලය මාසිකව රැස්වන අතර මණ්ඩලය විසින් සුදුසු යැයි සිතන අවස්ථාවලදී සහ සුදුසු යැයි සිතනා පරිදි අමතර රැස්වීම් පවත්වනු ලැබේ.

2016 මුදල් වර්ෂය තුළදී කළමනාකාරිත්ව මණ්ඩලයේ රැස්වීම් 07ක් පවත්වන ලදී. එළඹෙන ලද තීරණ, නගන ලද ප්‍රශ්න සහ ප්‍රකාශ කරන ලද ප්‍රතිවිරුද්ධ අදහස් ඇතුලත් කර මණ්ඩලයේ ලේකම්වරයා විසින් න්‍යාය පත්‍රය සහ කාර්ය සටහන්වල කෙටුම්පත සකස් කරනු ලබන අතර ඒවා කළමනාකාරිත්ව මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීමට අදහස් කරනු ලබන දිනයට පෙර රාජකාරි දින3 ක් ඇතුලත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාද සමග සියළුම සාමාජිකයන් අතර බෙදා දෙනු ලැබේ. නිතිපතා පවත්වනු ලබන එක් එක් රැස්වීමේදී කාර්යාංශයේ කාර්යසාධනය, මූල්‍ය ක්‍රියාකාරිත්වය ආදිය ඇතුලත් විවිධ අංශ පිළිබඳව කාර්යාංශයේ අංශ ප්‍රධානීන් විසින් මණ්ඩලය වෙත කරුණු දක්වනු ලැබේ.සාකච්ඡා තුළදී තම වෘත්තිය මතයන් ඉදිරිපත් කිරීම සහ ක්‍රියාශීලී දායකත්වයක් දැක්වීම තුලින් කාර්යාංශයේ රැස්වීම් සඳහා සහභාගිවීම සම්බන්ධයෙන් කාර්යාංශයේ කළමනාකාරිත්ව මණ්ඩලය විසින් ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

මූල්‍ය වාර්තා



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2016 දෙසැම්බර් මස 31 දිනට ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 පොදු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය 1992 අංක 33 දරන පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ යන ස්ථානයයි.

1.2 ප්‍රධාන කටයුතු

- ශ්‍රී ලංකාවේ භූ විද්‍යා සිතියම් කටයුතු ක්‍රමානුකූල ලෙස සිදු කිරීම සහ භූ විද්‍යා සිතියම් පිළියෙල කිරීම.
- ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඇගයීමට ලක් කිරීම.
- එකී ඛනිජ කැනීම, සැකසීම සහ අපනයනය සඳහා ඇති වාණිජමය ශක්‍යතාවය ඇගයීමට ලක් කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීම මගින් ඛනිජ කැනීම හා ගවේෂණය සහ එකී ඛනිජ සැකසීම, වෙළඳාම හා අපනයනය නියාමනය කිරීම.
- වාණිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය කිරීම හා නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස් ලබා දීම.
- පනත ප්‍රකාරව එනම් විශේෂයෙන්ම මෙම අංශයෙහි (අ),(ආ) සහ(ඇ) පරිච්ඡේද යටතේ කාර්යයන් ඉටු කිරීමේදී ලබා ගනු ලබන තොරතුරු සහ දත්ත යෝග්‍ය ප්‍රචාරණ මාධ්‍ය තුල ප්‍රචාරණය කිරීම.
- ඉංජිනේරු භූ විද්‍යාව සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සහ සිදු වී ඇති භූ විද්‍යා උවදුරු හා ව්‍යසන සම්බන්ධයෙන් ගත යුතු ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා පෙදෙස් ලබා දීම.

1.3 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට ස්ථිර සේවක සංඛ්‍යාව 318 ක් විය.

2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.1 පොදු

අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ස්ථාපිත කරන ශ්‍රීලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ නියමයන් හා අනුකූල වන ලෙස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

පිළියෙල කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය සම්මුතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරනු ලැබ ඇත. ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධක සම්බන්ධයෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. ව්‍යතිරේකයන් පවතින සෑම අවස්ථාවකදීම සහ යෝග්‍ය සැම අවස්ථාවකදීම, අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන්වල අනාවරණය කරනු ලැබ ඇත.

2.2 ප්‍රවර්තන ව්‍යාපාරය

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී ප්‍රවර්තන ව්‍යාපාර පදනම යොදා ගැනිම සාධාරනිකරණය කිරීම සඳහා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කාර්යාංශය සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බව අධ්‍යක්ෂවරුන් විසින් සනාථ කරනු ලැබේ.

2.3 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති තොරතුරු හා අනුකූල වන ලෙස අවශ්‍ය අවස්ථාවලදී ආයතනික තොරතුරු නැවත වර්ගිකරණය කරනු ලැබ ඇත.

3. වත්කම් සහ අනිකුත් තක්සේරු කිරීම් වල පදනම

3.1 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් ඒවා උපලබ්ධි කිරීමට ගණනය කර ඇති මිල ගණන් මත සඳහනක් කරනු ලැබ ඇත.

3.2 භාණ්ඩ ලේඛන

භාන්ඩ ලේඛන පිරිවැය මත තක්සේරු කර ඇත. මේ සම්බන්ධ පිරිවැයකරණය මිලදී ගැනීම් වල සමාහාර පිරිවැය සඳහා පමණක් සීමා වී ඇති අතර මිලදී ගැනිම් හා සම්බන්ධ සියලු වියදම් ඊට ඇතුළත් වී ඇත.

3.3 ආයෝජන

ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.

3.3.1 සීමාසහිත භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ තාක්ෂණික සේවා සමාගම

සීමාසහිත භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ තාක්ෂණික සේවා සමාගම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් රු. 4,000,000 ක මුදලක් ආයෝජනය කර ඇත. සමාගම් පනත යටතේ මෙම සමාගම සංස්ථාගත කර ඇත. සමාගම් පනත යටතේ ඇති නීති හා රෙගුලාසි අදාල වේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ තාක්ෂණික සේවා සමාගම විසින් 2016 වර්ෂය සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කර ඇත. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශනවල මෙය පෙන්නුම් කරනු ලැබ ඇත. සමාගමෙහි මුදල් වර්ෂය 2016/03/31 දිනෙන් අවසන් වන හෙයින් ලැබිය යුතු ලාභාංශ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ නොහැකි වේ.

3.4 දේපල,පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ, පිරිවැය හෝ තක්සේරු වටිනාකමින් සමාහාර ක්ෂයවීම් අඩු කර සඳහන් කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය තුළ එය මිලදී ගත් මුදල හා එකී වත්කම එමගින් අපේක්ෂිත ප්‍රයෝජන ලබා ගත හැකි මට්ටමට ගෙන ඒම සඳහා අදාල වල සෘජු පිරිවැය ඇතුලත් වේ.

පහත දැක්වෙන පරිදි වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලයට අදාල කාල පරිච්ඡේදය තුළ සරල ක්‍රමය මත කාර්යාංශයෙහි දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම් දක්වා ඇත.

ප්‍රයෝජනවත් වර්ෂයකට අදාල ආයු කාලය	අදාල අනුපාතිකය	
ගොඩනැගිලි	20	5%
පිරියත හා යන්ත්‍රෝපකරණ	8	12.5%
විද්‍යාගාර උපකරණ	5	20.0%
මෝටර් වාහන	5	20.0%
ගෘහභාණ්ඩ හා උපාංග	10	10%
කාර්යාල උපකරණ	5	20.0%
ක්ෂේත්‍ර උපකරණ	5	20.0%
මිනුම් උපකරණ	5	20.0%
සන්නිවේදන	8	12.5%
පුස්තකාලපොත් / සිතියම්	20	5%

ඉඩම් සඳහා ක්ෂයවීම් දක්වා නොමැත. මාසය තුළදී මිලදි ගත් දේපල, පිරියත හා උපකරණ සඳහා සම්පූර්ණ ක්ෂයවීම් දක්වා ඇත.

3.5 දේපල, පිරියත හා උපකරණ බදු දීම

කාර්යාංශය වෙත කල්බදු පදනම මත ලබා ගනු ලබන භාණ්ඩවල හිමිකාරිත්වය හා සම්බන්ධ සියලුම ප්‍රතිලාභ හා අවදානම් තත්ත්ව පුර්ණ ලෙස මාරු කරනු ලබන කල් බදු මුල්‍ය කල්බදු ලෙස හැඳින්වේ. එවැනි මුල්‍ය කල්බදු මත ලබා ගනු ලබන වත්කම් අනිකුත් දේපල පිරියත හා උපකරණ සඳහා අදාල අනුපාතික මතම ක්ෂ-යවීම් දක්වනු ලැබේ.කාර්යාංශය වෙත කල්බදු පදනම මත ලබා ගනු ලබන භාණ්ඩවල හිමිකාරිත්වයට අදාල සියලුම අවදානම් තත්ත්ව හා ප්‍රතිලාභ පූර්ණ ලෙස මාරු කර හරිනු නොලබන කල්බදු, මෙහෙයුම් කල්බදු ලෙස හඳුන්වනු ලැබේ.

3.6 මුදල් හා මුදල් තුල්‍යයන්

අත ඇති මුදල්, බැංකුවල ඇති තැන්පතු සහ ඒක්ෂන තැන්පතු මුදල් හා මුදල් තුල්‍යයන් තුළ අන්තර්ගත වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල සඳහන් මුදල් හා මුදල් තුල්‍යයන් තුළ ගෙවීමට ඇති බැංකු අයිරා අඩු කොට අත ඇති මුදල් හා බැංකුවල ඇති ඒක්ෂණ තැන්පතු ඇතුලත්කර ඇත.

4 වගකීම් හා ප්‍රතිපාදන

4.1 ප්‍රතිපාදන

වගකීම් හේතු කොට ගෙන සම්පත් පිටතට ගලා යාමක් සිදු වේ නම් සහ පිටතට ගලා යන සම්පත් ප්‍රමාණය පිලිබඳ විශ්වාසනීය තක්සේරුවක් කල හැකි නම් ශේෂපත්‍ර දිනට පවතින වගකීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

4.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂික ලබා දීම සඳහා ප්‍රතිපාදන සලසා දී ඇත. සේවකයෙකු සම්බන්ධයෙන් වගකීමක් ඇති වන්නේ අවුරුදු 5ක අඛණ්ඩ සේවයක් සපුරා ඇති විටදී පමණකි.

4.3 සේවකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවකයන්ගේ භාරකාර අරමුදල සඳහා නිශ්චිත දායකත්ව සැලසුම්

අදාල නීති හා රෙගුලාසි හා අනුගතව සේවකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවකයන්ගේ භාරකාර අරමුදල සඳහා දායකත්වයන් ලබා දීමට සේවකයන් සුදුසුකම් ලබයි. සේවකයන්ගේ මුළු වේතනයෙන් 12% ක් සහ 3%ක මුදලක් පිලිවෙලින් සේවකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවකයන්ගේ භාරකාර අමුදල සඳහා කාර්යාංශය විසින් දායක කරනු ලැබේ.

5. විස්තීර්ණ ආදායම් ප්‍රකාශන

5.1 ආදායම් හඳුනාගැනීම

5.2 ආර්ථික ප්‍රතිලාභ කාර්යාංශයට ගලා යාමට ඇති ඉඩකඩ ප්‍රමාණය සහ ආදායම සහ දරන ලද හෝ දැරීමට ඇති ආශ්‍රිත පිරිවැය ප්‍රමාණය මත ආදායම හඳුනාගනු ලැබේ. ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකම මත ආදායම ගණනය කරනු ලැබේ. ආදායම හඳුනාගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක යොදා ගනු ලැබේ.

a) සේවාවන් ලබා දීම

සේවාවන් ලබා දීම තුළින් ලැබෙන ආදායම සේවාවන් ලබා දෙනු ලබන ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළදී හඳුනාගනු ලැබේ.

b) පොළිය

උපචිත පදනමක් මත පොලී ආදායම හඳුනාගනු ලැබේ.

c) වෙනත්

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළු අනිකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීම තුළින් ලැබෙන ශුද්ධ ලාභය හෝ අලාභය එකී බැහැර කිරීම තුළින් ලැබෙන ලාභයෙන් එකී වත්කම්වලට අදාල ප්‍රවාහන පිරිවැය සහ අනිකුත් අදාල විකිණුම් වියදම් අඩු කොට ආදායම් ප්‍රකාශනය තුළ ගිණුම්ගත කිරීම ප්‍රතිපත්තිය වේ.

d) පුරස්කාර ආදායම

පුරස්කාර යටතේ ලද ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර ඇත.කිසියම් වර්ෂයකට අදාල පුරස්කාර ගෙවීම් ඊළඟ වර්ෂයේ අප්‍රේල් මස 20 දින දක්වා සිදු කිරීමට පතල් හා බනිජ පනත මගින් අවසර ලබාදී ඇත. ප්‍රකාශනය සිදු කරන තුරු පුරස්කාර පිලිබඳව නිශ්චිතව තහවුරු කර ගැනීම කළ නොහැකි හෙයින් ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන සැලසිය නොහැකි වේ. රෙගුලාසි සඳහා 2006 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධන

මගින් පුරස්කාර සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අවසර ලබා දෙන ලදී. බලපත්‍ර කාල පරිච්ඡේදය තුලදී ගෙවා නොමැති පුරස්කාර පියවා ගැනීමට මෙය යොදා ගත හැකි අතර එවැනි ගෙවීමක් සිදු කිරීමට නොමැති නම් බලපත්‍රලාභියා වෙත එම මුදල සම්පූර්ණයෙන්ම ආපසු ගෙවිය යුතු වේ.

5.3 වියදම්

වර්ෂයට අදාල ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩු කරනු ලැබේ.

6. මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රමිති අංක 02 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා අනුකූලව වක්‍ර ක්‍රමය යොදා ගනිමින් කාර්යාංශයෙහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කරනු ලැබ ඇත.

7. බදුකරණය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි 07(ආ) වගන්තිය ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ආදායම් බදු ගෙවිය යුතු වේ.

8. පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂපත්‍ර දිනට පසුව සිදුවන සියළුම වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා ගැලපීම් සිදුකිරීමට හෝ අනාවරණයන් සිදු කිරීමට අපි කටයුතු කරමු.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2016 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනය

	සටහන	2016 තථ්‍ය රු.	2015 තථ්‍ය රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත උපකරණ	1	525,923,902.73	544,174,181.25
කෙරීගෙන යන වැඩ	2	2,102,992.40	1,505,000.00
මුළු ජංගම නොවන වත්කම් ප්‍රමාණය		528,026,895.13	545,679,181.25
ආයෝජනය	3	4,000,000.00	4,000,000.00
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛනය	4	17,703,073.21	21,352,047.94
වෙළඳ හා අනිකුත් ලැබීම්	5	157,752,554.57	110,456,075.08
ස්ථාවර තැන්පතු	6	1,762,682,571.27	1,068,000,572.47
මුදල් හා මුදල් තුල්‍යයන්	7	10,345,805.68	37,925,813.36
මුළු ජංගම වත්කම් ප්‍රමාණය		1,948,484,004.73	1,237,734,508.85
මුළු වත්කම්		**2,480,510,899.86**	**1,787,413,690.10**
කොටස් හා වගකීම්			
කොටස්			
ඒකාබද්ධ අරමුදල	8	27,652,883.05	27,652,883.05
දෙපාර්තමේන්තු අරමුදල	9	1,746,725.68	1,746,725.68
ප්‍රාග්ධන අරමුදල	10	68,916,655.00	68,916,655.00
විදේශ අරමුදල	11	16,968,107.86	1,984,210.00
දේශීය ප්‍රදාන	12	10,399.80	1,373,648.24
ප්‍රත්‍යාගණන සංචිත		129,978,094.46	129,978,094.46
ආපදා අරමුදල	13	8,592,291.67	
රඳවා ගත් ඉපැයීම්		1,648,805,133.54	1,110,852,578.03
මුළු කොටස් ප්‍රමාණය		1,902,670,291.06	1,342,504,794.46
ජංගම නොවන වත්කම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	14	131,042,055.66	125,128,193.32
ජංගම වගකීම්			
ණයහිමියන් සහ සිදු කළ යුතු ගෙවීම්	15	213,514,014.21	151,933,552.62
සිදු කළ යුතු වෙනත් ගෙවීම්	16	233,284,538.93	167,847,149.70
		446,798,553.14	319,780,702.32
මුළු කොටස් හා වගකීම්		**2,480,510,899.86**	**1,787,413,690.10**

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2016 තථ්‍ය රු.	2015 තථ්‍ය රු.
ආදායම	17	2,087,912,668.07	1,590,377,799.45
අනිකුත් ආදායම්	18	79,632,423.60	56,841,607.51
මෙහෙයුම් වියදම්	19	(306,977,448.55)	(287,560,815.22)
පරිපාලන වියදම්	20	(385,188,483.01)	(372,653,632.52)
මෙහෙයුම් ලාභය		1,475,379,160.11	987,004,959.22
ශුද්ධ මූල්‍ය ආදායම	21	115,963,666.35	68,585,384.20
බදුවලට පෙර ලාභය		1,591,342,826.46	1,055,590,343.42
ආදායම් බදු වියදම්	22	27,315,639.00	18,496,473.00
වර්ෂය තුළ ශුද්ධ ලාභය		1,564,027,187.46	1,037,093,870.42

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්



සටහන් 01
දේපල, පිරියත සහ උපකරණ

	2016.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය	බැහැර කරන ලද භාණ්ඩ	2016.12.31 දිනට ශේෂය
පිරිවැයමත					
ඉඩම්, ගොඩනැගිලි හා ඉඩම්වල වැට බැඳීම	639,713.50				639,713.50
ඉඩම්	224,787,057.75		9,391,549.00		215,395.508.75
ගොඩනැගිලි	77,116,363.10				77,116,363.10
ගොඩනැගිලි වෙන් කිරීම	14,257,187.72	851,660.00			15,108,847.72
පිරියත හා යන්ත්‍රෝපකරණ	83,981,006.01	6,493,000.00		173,062.00	90,300,944.01
මෝටර් වාහන	227,515,299.00	9,950,000.00			237,465,299.00
මැනුම් උපකරණ	9,396,268.44				9,396,268.44
විදුම් අමතර කොටස්	26,474,039.71	36,366.27		5,095.00	26,505,310.98
විද්‍යාගාර උපකරණ	157,011,914.67	47,050,621.63			204,062,536.30
ක්ෂේත්‍ර උපකරණ	14,444,018.46	29,863.00		1,215.80	14,472,665.66
කාර්යාල උපකරණ	127,496,158.38	13556,801.00		116,622.90	140,936,336.48
සන්නිවේදන උපකරණ	6,134,812.65	1039,372.14			7,174,184.79
ගෘහභාණ්ඩ හා උපාංග	14,623,038.60	4,858,540.90			19,481,579.50
සිතියම්	475,824.75				475,824.75
පුස්තකාල පොත්	28,298,953.40	774,297.50			29,073,250.90
කෞතුකාගාර භාණ්ඩ		812,055.87			812,055.87
	1,012,651,656.14	85,452,578.31	9,391,549.00	295,995.70	1,088,416,689.75

	2016.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා ගාස්තුව	භාණ්ඩ බැහැර කිරීම	2016.12.31 දිනට ශේෂය
ක්ෂයවීම්				
ඉඩම්, ගොඩනැගිලි හා ඉඩම්වල වැට බැඳීම	549,048.73	37,515.96		586,564.69
ගොඩනැගිලි	46,086,875.93	3,902,963.79		49,989,839.72
ගොඩනැගිලි වේන් කිරීම	4,959,449.18	2,937,246.57		7,896,695.75
පිරියත හා යන්ත්‍රෝපකරණ	41,561,708.05	8,516,895.98	82,323.44	49,996,280.59
මෝටර් වාහන	140,413,293.66	28,810,851.91		169,224,145.57
මැනුම් උපකරණ	7,806,503.93	608,079.57		8,414,583.50
විදුම් අමතර කොටස්	10,781,384.01	3,221,554.49	3,235.59	13,999,702.91
විද්‍යාගාර උපකරණ	82,005,035.02	30,048,847.53		112,053,882.55
ක්ෂේත්‍ර උපකරණ	10,756,619.08	1,086,832.04	1,215.80	11,842,235.32
කාර්යාල උපකරණ	102,050,726.51	11,512,566.08	116,622.90	113,446,669.69
සන්නිවේදන උපකරණ	3,044,131.18	673,268.64		3,717,399.82
ගෘහභාණ්ඩ හා උපාංග	6,834,113.44	1,410,206.69		8,244,320.13
සිතියම්	241,007.15	23,791.20		264,798.35
පුස්තකාල පොත්	11,387,579.02	1,428,089.41		12,815,668.43
	468,477,474.89	94,218,709.86	203,397.73	562,492,787.02
ශුද්ධ පොත් අගය	544,174,181.25			525,923,902.73

02. සටහන කරමින් පවතින වැඩ

	2016 තථ්‍ය රු.	2015 තථ්‍ය රු.
යෝජිත භූමිය විනිවිද යන රේඩාර්	1,505,000.00	1,505,000.00
පද්ධතිය / ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය විද්‍යාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල	143,145.00	
යෝජිත ගොඩනැගිල්ල - රත්නපුර	454,847.40	
	2,102,992.40	**1,505,000.00**

03. සටහන ආයෝජන

ආයෝජන	4,000,000.00	4,000,000.00
	4,000,000.00	**4,000,000.00**

04. සටහන - භාණ්ඩ ලේඛනය

	2016 රු.	2015 රු.
ලිපිද්‍රව්‍ය තොගය	2,088,803.05	1,994,078.18
ලෝහ භාණ්ඩ තොගය	12,329,004.96	14,076,887.66
පුස්තකාල පොත් / සිතියම් තොගය	668,527.30	668,527.30
බලපත්‍රය - තොගය	2,616,737.90	4,612,554.80
	17,703,073.21	**21,352,047.94**

5 සටහන - වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ

	2016 රු.	2015 රු.
ණයගැතියන් - ව්‍යාපෘති	5,005,990.56	4,970,255.82
ණයගැතියන් - අනිකුත් 05B	1,706,000.11	1,737,923.21
ණයගැතියන් - චෙක්පත් ආපසු එවීම්	87,760.75	314,180.70
ණයගැතියන් - භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය තාක්ෂණික සේවා සමාගම	-	545,916.95
පූර්ව ගෙවීම්	4,811,743.04	7,500,165.25
කාර්ය මණ්ඩල ණය	77,331,044.34	59,385,490.16
උත්සව අත්තිකාරම්	72,600.00	54,950.00
විශේෂ අත්තිකාරම්	7,200.00	9,500.00
අත්තිකාරම් - ක්ෂේත්‍ර නිලධාරීන්	862,455.88	824,090.88
අත්තිකාරම් - අනිකුත් නිලධාරීන්	3,092,656.25	1,914,700.00
අත්තිකාරම් - විදේශ සඟරා	-	316,207.42
අත්තිකාරම් - මිලදී ගැනීම්	2,647,820.33	19,471,423.14
අත්තිකාරම් හා අත්තිකාරම් ණය **B**	208,775.26	208,775.26
ගොඩනැගිලි තැන්පතු	141,000.00	66,000.00
ආපසු ගෙවිය යුතු තැන්පතු	343,000.00	418,000.00
ගෙවල් කුලී අත්තිකාරම්	2,572,437.50	3,009,312.50
භාණ්ඩාගාර බිල්පත් - පොළී ගිණුම	3,048,655.01	1,825,698.85
මහජන බැංකුව - පොළී ගිණුම	55,813,415.54	7,883,484.94
	157,752,554.57	**110,456,075.08**

05B. සටහන - ණය ගැතියන්

	2016 රු.	2015 රු.
රසායනික විශ්ලේෂණය	149,917.50	149,917.50
සුළු ණයගැතියන්	378,410.46	371,221.56
දේශීය ආදායම් - භාණ්ඩ හා සේවා බදු ලැබිය යුතු	973,143.00	973,143.00
රක්ෂණ හිමිකම්	-	39,112.00
එච් ඇන්ඩ් එස් රක්ෂණය	113,732.35	113,732.35
හර සටහන්	90,796.80	90,796.80
	1,706,000.11	1,737,923.21

සටහන 6 - ස්ථිර තැන්පතු

	2016 රු.	2015 රු.
තැන්පතුව - මහජන බැංකුව (අවදානම් අරමුදල)	8,587,556.16	5,900,000.00
තැන්පතුව - මහජන බැංකුව (පී.එස්.එන්. මධ්‍යස්ථානය)	6,890,389.20	6,404,510.32
තැන්පතුව - මහජන බැංකුව (පාරිතෝෂික අරමුදල)	128,033,799.53	54,683,764.98
තැන්පතුව - මහජන බැංකුව (ගාලු පාර)	1,362,072,134.83	762,978,559.12
රාජ්‍ය අතිරික්ත අරමුදල	6,826,756.58	6,249,362.84
භාණ්ඩාගාර බිල්පත්	250,271,934.97	231,784,375.21
	1,762,682,571.27	1,068,000,572.47

සටහන 7 - මුදල් හා මුදල් තුල්‍යයන්

	2016 තථ්‍ය රු.	2015 තථ්‍ය රු.
ලංකා බැංකුව - ජංගම ගිණුම	520,611.20	1,830,454.84
කොමර්ෂල් බැංකුව - ජංගම ගිණුම	293,757.56	350,143.15
සම්පත් බැංකුව - ජංගම ගිණුම	4,217,634.45	1,348,867.63
සම්පත් බැංකුව පී එස් එන් - ජංගම ගිණුම	931,590.15	548,973.49
මහජන බැංකුව - මාතර	147,652.84	1,028,863.87
මහජන බැංකුව - වැල්ලවත්ත	177,387.39	424,059.73
මහජන බැංකුව - ගාලු පාර	2,659,636.58	31,130,798.70
මහජන බැංකුව - පිටකෝට්ටේ	14,735.51	8,136.95
මුද්දර අග්‍රිමය	5,800.00	18,515.00
සුළු මුදල් අග්‍රිමය - ප්‍රාදේශීය කාර්යාල	1,365,000.00	1,225,000.00
සුළු මුදල් අග්‍රිමය - ප්‍රධාන කාර්යාලය	12,000.00	12,000.00
	10,345,805.68	37,925,813.36

සටහන - 08 - ඒකාබද්ධ අරමුදල

1993 වර්ෂයේදී භූ විද්‍යා දෙපාර්තමේන්තුව වෙතින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත මාරු කර හරින ලද ශුද්ධ මුළු වත්කම් ප්‍රමාණය මෙමගින් නිරූපණය වේ.

සටහන 09 - දෙපාර්තමේන්තු අරමුදල

ආරම්භක අවදියේදී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද මුදල් භාවිතා කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට සිදු වූ අතර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් භාවිතා කරන ල ද එම මුදල් මෙමගින් නිරූපණය වේ.

සටහන 10 - ප්‍රාග්ධන අරමුදල

1993 සිට 2001 දක්වා කාලය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන මෙමගින් නිරූපණය වේ.

සටහන 11 - විදේශ අරමුදල

2001 වර්ෂයේදී පරිගණක මිලදී ගැනීම සඳහා ඔස්ට්‍රේලියානු රජය වෙතින් ඔස්ට්‍රේලියානු ආධාර භූ.ස.ප.කා. වෙත ලැබුණු අතර ඇමරිකා එක්සත් ජනපදය සහ වියානාහි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් එම වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රදානයන් ද ලැබුණි. එම ප්‍රදානයන්හි වටිනාකම මෙමගින් නිරූපණය වේ.

භාණ්ඩය පරිත්‍යාග කළ රට හෝ ආයතනය

1. ඩී.ඩී. පවර් මොනිටරය	සිස්කෝ 890 රවුටරය ඇමරිකා එක්සත් ජනපදය
2. එක්ස්.ආර්.එෆ්. වර්ණාවලිමානය	වියානාහි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය
3. ජංගම විකිරණ පද්ධතිය	වියානාහි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය

සටහන 12 - දේශීය ප්‍රදාන

2013 වර්ෂයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් වෙතින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත පරිගණකයක් ලැබුණි.(එස්.එල්.ටී. මෙගා ට්වෙන්ටි 20 සම්මානය)

අංක 13 - ආපදා අරමුදල

සුභසාධන කටයුතු මගින් සහ කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන දිරි දීමනා වලින් නැවත අය කර ගනු ලබන මුදල් මගින් මේ සඳහා මුදල් සපයා ගනු ලැබේ.

සටහන 14 - පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ ලබා දෙනු ලබන විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා දී ඇත. අවුරුදු 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සම්බන්ධයෙන් පමණක් මෙකී ආයතනයට වගකීමක් පැවරේ.

සටහන 15 - ණයහිමියන් සහ සිදු කළ යුතු ගෙවීම්

	2016 තථ්‍ය රු.	2015 තථ්‍ය රු.
ගෙවිය යුතු කාර්ය මණ්ඩල වැටුප් ණයහිමියන්	(114,493.40)	59,135.54
මිලදී ගැනීම් සඳහා ණයහිමියන්	10,377,550.46	11,344,366.10
ගෙවිය යුතු සේ.අ.අ./ සේ.හා.අ.	2,765,920.10	2,508,623.47
ගෙවිය යුතු මුද්දර ගාස්තු	1,082,959.48	1,770,276.00
උපයන විට ගෙවීම් බදු	954,591.66	58,339.02
අගය මත එකතු කල බද්ද	32,540,445.93	25,183,362.71
ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු	3,032,637.00	1,123,971.00
ජාතිය ගොඩනැගීමේ බද්ද	7,831,390.25	6,180,103.48
ගෙවිය යුතු ආදායම් බද්ද	15,377,490.00	7,321,411.00
රක්ෂණ සමාගම් විසින් වාහන රක්සණ හිමිකම් පෑම්	-	22,642.74
උපචිත වියදම්	139,665,522.73	96,361,321.56
	213,514,014.21	151,933,552.62

සටහන 16 - සිදු කළ යුතු අනිකුත් ගෙවීම්

	2016 රු.	2015 රු.
පී.එස්.එන්. මධ්‍යස්ථානය සඳහා අත්තිකාරම් 16 ඒ	7,821,979.35	6,887,885.35
අයි.ඊ.ඊ.ආර්. සඳහා අත්තිකාරම්	137,685.00	137,685.00
ව්‍යාපාති සඳහා අත්තිකාරම්	2,749,532.07	12,024,414.90
රසායනික විශ්ලේෂණය සඳහා අත්තිකාරම්	200,300.00	8,500.00
එම් අයි ඒ සඳහා අත්තිකාරම්	-	14,000.00
පුනරුත්ථාපන කටයුතු අත්තිකාරම්	-	32,012.00
පුරස්කාර සඳහා අත්තිකාරම්	90,052,365.07	53,064,259.76
කැනීම් බලපත්‍ර සඳහා අත්තිකාරම් - 16 බී	80,308,677.44	58,284,392.69
බැංකු ඇපකරය	52,014,000.00	37,394,000.00
	233,284,538.93	167,847,149.70

16 ඒ සටහන - පී එස් එස් මධ්‍යස්ථානය සඳහා අත්තිකාරම්

පල්ලෙකැලේ පිහිටි පී එස් එන් මධ්‍යස්ථානයෙහි කටයුතු පවත්වාගෙන යාමට කැලිෆෝනියා විශ්ව විද්‍යාලයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ප්‍රතිපාදන ලබා දෙනු ලැබුණි. එම මුදල් මෙමගින් නිරූපනය වේ.

සටහන 16 බී - කැනීම් බලපත්‍ර සඳහා අත්තිකාරම්

බලපත්‍ර අයදුම්පත් සැකසීම සඳහා රඳවා ගන්නාලද මුදල් මෙමගින් නිරූපනය යෙවි. බලපත්‍ර සැකසූ පසු මෙය ආදායමක් ලෙස සලකනු ලැබේ. බලපත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් රඳවාගත් මුදල් ආපසු සේවාදායකයා වෙත ලබා දෙනු ලැබේ.

	2016 රු.	2015 රු.
ගවේෂණ බලපත්‍ර සඳහා ලැබුණු අත්තිකාරම්	15,527,732.83	15,605,352.83
කාර්මික කැනීම් බලපත්‍ර 'අ' කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	15,371,275.63	7,319,416.96
කාර්මික කැනීම් බලපත්‍ර - බී - කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	26,315,455.05	17,325,336.71
කාර්මික කැනීම් බලපත්‍ර - සී - කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	6,755,297.75	6,401,066.30
ශිල්පීය කැනීම් බලපත්‍ර - ඒ - කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	8,353,189.23	6,542,548.87
ශිල්පීය කැනීම් බලපත්‍ර- බී කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	4,155,149.81	3,248,902.12
වෙළඳ බලපත්‍ර - ඒ කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	158,650.36	131,150.36
වෙළඳ බලපත්‍ර - බී කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	3,615,793.50	1,662,225.14
වෙළඳ බලපත්‍ර - සී කාණ්ඩය සඳහා ලැබුණු අත්තිකාරම්	19,796.55	14,427.40
කැනීම් බලපත්‍ර සඳහා අතිරික්ත මුදල්	36,336.73	33,966.00
	80,308,677.44	58,284,392.69

සටහන 17 - ආදායම

	2016 රු.	2015 රු.
රාජ්‍ය භාගය 17 ඒ	1,578,584,414.25	1,293,433,031.76
බලපත්‍ර ගාස්තු 17 බී	224,798,381.13	80,002,819.08
පරීක්ෂණ ගාස්තු (බනිජ ගවේෂණය) 17 සී	247,954,045.63	182,943,929.26
විද්‍යාගාර 17 ඩී	3,247,333.33	3,568,174.29
ව්‍යාපෘති (විදුම්) 17 ඊ	33,328,493.73	30,429,845.06
	2,087,912,668.07	1,590,377,799.45

17 ඒ - රාජ්‍යභාගය

	2016 රු.	2015 රු.
රාජ්‍ය භාගය - ගොඩනැගිලි ද්‍රව්‍ය	976,297,424.94	729,914,696.68
රාජ්‍ය භාගය - කාර්මික බණ්ඩ	431,489,987.19	397,746,549.61
පූර්ව - ගොඩනැගිලි ද්‍රව්‍ය	129,541,294.48	121,198,115.71
පූර්ව - කාර්මික බණ්ඩ	4,109,071.52	12,977,493.39
දණ්ඩන - ගොඩනැගිලි ද්‍රව්‍ය	35,571,489.98	28,942,518.98
දණ්ඩන - කාර්මික බණ්ඩ	1,575,146.14	2,653,657.39
	1,578,584,414.25	1,293,433,031.76

17 බී - බලපත්‍ර ගාස්තු

	2016 රු.	2015 රු.
අපනයන	2,455,000.00	2,305,000.00
ගවේෂණ	7,889,000.00	7,874,000.00
කාර්මික කැනීම් බලපත්‍ර	142,381,200.00	19,104,000.00
ශිල්පීය කැනීම් බලපත්‍ර	8,201,250.00	7,194,500.00
වෙළඳ	9,786,000.00	5,612,000.00
ප්‍රවාහන බලපත්‍ර	54,085,931.13	37,913,319.08
	224,798,381.13	80,002,819.08

17 සී - පරීක්ෂා කිරීම්

	2016 රු.	2015 රු.
පරීක්ෂා කිරීම	222,488,420.57	168,187,722.53
විශේෂ පරීක්ෂා කිරීම - කාර්මික කැනීම් බලපත්‍ර - ඒ	767,500.00	730,000.00
විශේෂ පරීක්ෂා කිරීම - කාර්මික කැනීම් බලපත්‍ර - බී	6,889,585.58	1,182,500.00
විශේෂ පරීක්ෂා කිරීම - කාර්මික කැනීම් බලපත්‍ර - සී	4,255,579.48	300,000.00
විශේෂ පරීක්ෂා කිරීම - ශිල්පීය කැනීම් බලපත්‍ර - ඒ	827,860.00	80,320.00
විශේෂ පරීක්ෂා කිරීම - ශිල්පීය කැනීම් බලපත්‍ර - බී	129,500.00	5,000.00
ප්‍රධාන ප්‍රදේශ විශේෂ පරීක්ෂා කිරීම්	12,595,600.00	12,458,386.73
	247,954,045.63	182,943,929.26

17 ඩී - විද්‍යාගාර

	2016 රු.	2015 රු.
විශ්ලේෂණාත්මක	2,691,733.33	3,568,174.29
පෂාණ විද්‍යාව	555,600.00	
	3,247,333.33	3,568,174.29

17 ඊ - ව්‍යාපෘති තොරතුරු

	2016 රු.	2015 රු.
භූ භෞතික ගවේෂණය ගල් පතල - කොස්ලන්ද ගැටමාන්න බෙලිඅත්ත - සී/ස මාගා ඉංජිනේරු (පුද්) සමාගම	500,000.00	
සිමෙන්ති අමුද්‍රව්‍ය ගවේෂණය - පුනරීන් 2015 සී/ස ටෝකියෝ සිමෙන්ති සමාගම	1,545,057.40	
විදුම් කටයුතු - යාපනය/සෙංගුපිටිය ලංකා විදුලිබල මණ්ඩලය	900,000.00	
ප්‍රතිරෝධතා ගවේෂණය - රාගල, මාලිබොඩ, නාවලපිටිය	636,750.29	
ලංකා විදුලිබල මණ්ඩලය ගල්පර විදුම් පරීක්ෂණ ගවේෂණය - කළුගග/මොරගහකන්ද මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන	3,206,533.08	
විදුම් කටයුතු - පුනරීන් ටෝකියෝ සිමෙන්ති		3,183,375.00
විදුම් කටයුතු - හබරණ, හුරුළුවැව, මහවැලි උපදේශන කාර්යාංශ	15,120,487.50	
විදුම් ගවේෂණය - පුනරීන්/වැල්ලෙපාදු සී/ස ටෝකියෝ සිමෙන්ති සමාගම	3,617,895.83	
විදුම් ගවේෂණය - කොළඹ අධිවේගී මාර්ගය මීරිගම - සී/ස නිට් සොලියුෂන් සමාගම	4,762,905.79	
පස් ගවේෂණය - දෙනියාය - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව දකුණු පළාත	337,618.24	
විදුම් කටයුතු - පාදුක්ක - සී/ස ඇක්සස් ඉංජිනේරු සමාගම	327,556.97	
ගල්පර සංරක්ෂණය - සීගිරිය 01 අ සහ 01 - සීසීඑෆ්	2,009,651.83	
විදුම් කටයුතු -වරකාපොළ -එම්.ආර්.එල්. ග්‍රැපයිට්		3,080,110.00
බනිජ ගවේෂණය - /නුවර - එම්.අයි.සී		3,458,527.58
බනිජ ගවේෂණය - මුලතිව් ලංකා බනිජ වැලි සමාගම		1,789,375.00
බනිජ ගවේෂණය - පොතුවිල්/අම්පාර- නැගෙනහිර බනිජ		1,081,012.22
විදුම් කටයුතු - අළුකැටිය - එම් ආර් එල්		5,566,206.37
බනිජ වැලි ගවේෂණය - හලාවත - වයික්කාල - වීවී.එම්.එල්	364,036.80	161,588.42
විදුම් කටයුතු - මැල්සිරිපුර - මිනිරන්		10,830,747.97
විදුම් කටයුතු - යාපනය - අයිටිඅයි		735,775.00
විදුම් කටයුතු - බත්තරමුල්ල - ශ්‍රී ලංකා තිරසර අධිකාරිය		543,127.50
	33,328,493.73	30,429,845.06

සටහන 18 : අනිකුත් ආදායම

	2016 රු.	2015 රු.
පරීක්ෂණ පිපිරුම් ආදායම	4,737,000.00	4,326,000.00
ප්‍රකාශන අලෙවිය	226,091.78	178,086.00
ක්ෂේත්‍ර අධීක්ෂණය	468,397.24	40,000.00
අපනයන නිදර්ශක ආදායම	560,709.50	619,499.98
සැපයුම් කරුවන්ගේ ලියාපදිංචිකිරීම	112,000.00	158,000.00
ආපදා ණය මත පොලිය	2,789,876.18	2,192,441.80
සුළු ආදායම් - කැනිම්	407,082.25	447,066.34
ලාභාංශ ආදායම 18 ඒ	720,000.00	720,000.00
මාරුකර යැවීම් ගාස්තුව - කැනිම්	11,000.00	11,663.22
පසුගිය බලපත්‍ර ලබා නොදීම සඳහා දඩ අය කිරීම	37,466,681.32	28,566,859.55
පුහුණු පාඨමාලා ගාස්තු	454,000.00	0.00
සිතියම්/ බනිජ පෙට්ටි අලෙවිය	190,434.29	236,570.00
බලපත්‍ර ගාස්තු නැවත ලබා දීමේදී කාර්යාල ගාස්තු	37,750.00	44,250.00
බැංකු ඇපකර සඳහා කාර්යාල ගාස්තු	107,812.50	133,900.00
ඡායා පිටපත් ගාස්තු	4,065.00	6,428.00
අපනයන බලපත්‍ර සඳහා සන්නිවේදන ගාස්තු	95,000.00	280,000.00
සුළු ආදායම් - භූවිද්‍යා	51,091.42	33,373.28
කුලී ආදායම	-	918,000.00
ප්‍රවාහන බලපත්‍ර මත සේවා ගාස්තු - එස් එල් එල් ආර් සීසි	1,824,100.00	328,442.00
නිදර්ශක අපනයනය සඳහා පරීක්ෂා කිරීමේ ගාස්තු	8,250.00	5,500.00
ආදායම - ප්‍රාදේශීය ලේකම් කාර්යාල	28,140,870.38	16,746,059.25
සුළු ආදායම්	1,220,211.74	849,468.09
	79,632,423.60	56,841,607.51

සටහන 18 ඒ - ලාභාංශ ආදායම

සි/ස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ තාක්ෂණික සේවා සමාගමෙන් රැඳවුම් බද්ද අඩු කළ විට රු. 720,000.00 ක ශුද්ධ ලාභාංශය ලැබී ඇත.

සටහන 19 - මෙහෙයුම් වියදම්

	2016 රු.	2015 රු.
භූ විද්‍යා - 19 ඒ	55,816,814.94	60,936,938.27
සිතියම් - 19 බී	6,769,793.08	8,201,413.15
ව්‍යාපෘති - 19 සී	13,216,437.84	13,308,901.10
ප්‍රාදේශිය - 19 ඩී	197,997,860.79	167,317,920.49
කැනිම් - 19 ඊ	33,176,541.90	37,795,642.21
	306,977,448.55	287,560,815.22

19 ඒ සටහන - භූ විද්‍යා

ගිණුම් වර්ගය	භූ විද්‍යා රු.	සුනාමි රු.	පුස්තකාල රු.	විද්‍යාගාර රු.	2016 මුළු එකතුව රු.	2015 මුළු එකතුව රු.
වැටුප්	14,897,143.92	-	345,891.10	3,688,042.38	18,931,077.40	16,283,147.41
දීමනා	10,941,074.29	766,950.00	322,433.50	2,728,729.82	14,759,187.61	19,362,090.99
සේ.අ.අ.	2,280,758.11	-	62,136.13	576,622.93	2,919,517.17	2,725,142.54
සේ.භා.අ.	571,866.18	-	15,534.03	144,155.76	731,555.97	681,021.97
වේතන	2,144,050.27	-	229,847.00	2,063,028.60	4,436,925.87	4,803,672.28
අතිකාල දීමනා	540,194.35	-	-	5,167.36	545,361.71	670,683.38
ප්‍රවාහන	258,877.00	-	-	-	258,877.00	381,602.00
ඉන්ධන	144,715.00	-	-	-	144,715.00	88,230.00
ලිපිද්‍රව්‍ය	464,687.20	-	27,216.16	2,502,051.98	2,993,955.34	3,527,738.70
පුවත්පත්	-	-	307,830.00	-	307,830.00	288,352.00
පණිවුඩ සේවා ගාස්තු	-	-	104,221.67	-	104,221.67	59,457.66
පර්යේෂණ	428,972.63	-	-	-	428,972.63	471,259.84
පර්යේෂණ සිමාවාසික	1,637,639.88	-	-	-	1,637,639.88	1,697,926.40
වෙනත්	750,632.63	5,176,495.22	20,841.00	1,669,008.84	7,616,977.69	9,896,613.10
	35,060,611.46	5,943,445.22	1,435,950.59	13,376,807.67	55,816,814.94	60,936,938.27

19 බී - සිතියම

ගිනුම් වර්ගය	අබලන් වූ විදුම් පෙට්ටි ප්‍රතිසංස්කරණය කිරීම 2015 සිතියම් සිතියම්කරනය රු.	භූ රසායනික සිතියම් කැකිරාව සිතියම්කරනය රු.	භූ රසායනික සිතියම්නාවුල මාතලේ ඇල පාර සිතියම්කරනය රු.	බනිජ ගවේෂණය සබරගමුව සිතියම්කරනය රු.	භූ රසායනික සිතියම් නාවුල / නුවර සිතියම්කරනය රු.	චාතුර්තික සිතියම් යාල සිතියම්කරනය රු.	චාතුර්ථික සිතියම් කල්පිටිය සිට සිලාවතුර සිතියම්කරනය රු.	උණුදිය උල්පත් ගවේෂණය සිතියම් පදියතලාව / මහව සිතියම්කරනය රු.	ගඩොල් හා උළු මැටි ගවේෂණය සිතියම් වයම පලාතු සිතියම්කරනය රු.	න්‍යෂ්ටික අමුද්‍රව්‍ය සිතියම් මන්නාරම සිට ගාල්ල සිතියම්කරනය රු.	කැගල්ල දිස්ත්‍රික්කය ගවේෂණ සිතියම් සිතියම්කරනය රු.	බනිජ වැලි ගවේෂණය සිතියම්කරනය රු.	2016 මුළු එකතුව සිතියම්කරනය රු.	2015 මුළු එකතුව සිතියම්කරනය රු.
වැටුප්	81,550.00	126,946.21	80,738.71	122,820.00	247,584.48	17,842.76	274,998.19	64,605.87	442,674.50	118,531.03	-	-	1,578,291.75	1,406,768.80
දිමනා	69,592.50	121,370.00	59,173.55	200,864.00	188,424.66	26,876.62	224,927.99	53,302.47	193,325.22	79,912.58	-	-	1,217,769.59	1,630,195.04
වේතන	143,000.00	83,400.00	33,000.00	178,625.00	37,600.00	22,500.00	462,500.00	38,000.00	269,650.00	58,050.00	-	77,400.00	1,403,725.00	1,827,540.80
අතිකාල	-	14,432.71	5,239.16	4,243.48	15,603.54	-	36,370.44	14,165.86	42,090.65	-	-	-	132,145.84	208,804.69
සේ.අ.අ.	13,389.60	19,486.09	12,132.52	23,294.40	37,393.96	3,343.92	46,976.98	10,737.21	67,041.18	20,213.23	-	5,641.80	259,650.89	227,265.45
සේ.භා.අ.	3,347.40	4,871.53	3,033.13	5,823.60	9,348.49	835.98	11,744.25	2,684.31	16,760.29	5,053.31	-	-	63,502.29	57,241.83
ප්‍රවාහන	-	82,725.00	19,200.00	101,250.00	103,800.00	-	78,850.00	-	127,850.00	21,025.00	-	38,385.14	573,085.14	642,445.00
ඉන්ධන	-	21,375.00	6,840.00	88,500.00	66,025.00	16,750.00	144,080.00	22,690.00	68,875.00	70,140.00	40,375.00	96,475.00	642,125.00	814,246.00
ලිපිද්‍රව්‍ය	-	-	-	-	-	-	98,007.00	-	-	-	-	-	98,007.00	-
වෙනත්	9,022.45	27,724.22	34,653.00	43,020.00	16,000.00	49,179.38	204,032.53	78,850.00	57,280.00	14,680.00	2,205.00	264,844.00	801,490.58	1,386,905.54
	319,901.95	502,330.76	254,010.07	768,440.48	721,780.13	137,328.66	1,582,487.38	285,035.72	1,285,546.84	387,605.15	42,580.00	482,745.94	6,769,793.08	8,201,413.15

19 සි - ව්‍යාපෘති

ගිණුම් වර්ගය	කොස්ලන්ද ගැටමාන්න බෙලිඅත්ත ගල්කඩන ස්ථානයන්හි භූ භෞතික පර්යේසණාය සී/ස මාගා ඉංජිනියරින් සමාගම රු.	පුනරින් 2015 සිමෙන්ති අමුද්‍රව්‍ය ගවේෂණාය සී/ස ටෝකියෝ ලංකා සිමෙන්ති සමාගම රු.	යාපනය සෙංගුපිටිය විදුම් කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය රු.	රාගල මාලිබොඩ නාවලපිටිය විදුම් පර්යේෂණාය ලංකා විදුලිබල මණ්ඩලය රු.	කළුගග මොරගහකන්ද ගල්පර මිනුම් පරීක්ෂණාය මහවැලි ජල ආර්කෂණ යෝජනා ක්‍රමය රු.	පුනරින් වැල්ලයිපාඩු විදුම් පර්යේසණාය සී/ස ටෝකියෝ ලංකා සිමෙන්ති සමාගම රු.	කොළඹ අධිවේගි මාර්ගය මිරිගම විදුම් පර්යේසණාය සී/ස නීට් සොලියුෂන් සමගාම	දෙනියාය පස් පර්යේෂණාය සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව දකුණු පලාත රු.	පාදුක්ක විදුම් සී/ස ඇක්සස් ඉංජිනේරු සමාගම	2016 එකතුව	2015 එකතුව
වැටුප්	34,705.00	84,032.20	65,623.30	93,703.50	298,924.50	176,783.80	403,609.33	125,280.00	53,228.07	1,335,889.70	1,875,716.45
දිමනා	20,314.27	91,143.70	59,242.60	54,848.50	295,725.10	195,435.80	366,545.27	108,490.00	51,750.48	1,243,495.72	1,393,931.56
වේතන	22,000.00	191,700.00	145,050.00	21,000.00	1,279,440.00	974,000.00	2,053,400.00	150,200.00	209,000.00	5,045,790.00	3,393,650.00
අතිකාල	3,350.33	11,341.83	22,915.20	9,045.90	123,340.22	73,705.35	146,989.47	3,003.33	27,545.60	421,237.23	472,301.74
සේ.අ.අ.	5,240.60	12,257.70	11,254.80	14,149.62	54,199.10	32,764.40	68,504.22	22,233.60	9,660.32	230,264.36	225,085.97
සේ.භා.අ.	1,310.15	3,064.40	2,813.70	3,537.40	13,549.80	8,191.10	17,126.06	5,558.40	2,415.08	57,566.09	56,271.49
ප්‍රවාහන	-	29,250.00	37,000.00	-	101,500.00	85,828.00	227,350.00	36,465.00	12,900.00	530,293.00	851,029.88
ඉන්ධන	-	0.00		-	225,000.00	196,233.76	94,933.91	-		516,167.67	1,878,590.08
ලිපිද්‍රව්‍ය	14,250.00	75,810.00	104,045.00	16,300.00	295,905.00	350,350.00	360,845.00	37,685.00	91,920.00	1,347,110.00	1,225,073.00
වෙනත්	77,165.00	13,685.00	109,878.00	114,935.00	757,907.89	945,054.00	376,974.18	52,910.00	40,115.00	2,488,624.07	1,937,250.93
	178,335.35	512,284.83	557,822.60	327,519.92	3,445,491.61	3,038,346.21	4,116,277.44	541,825.33	498,534.55	13,216,437.84	13,308,901.10

19 ඩී - ප්‍රාදේශීය

වර්ගය	මහනුවර රු.	මාතර රු.	කුරුණෑගල රු.	අනුරාධපුරය රු.	බදුල්ල රු.	පොලොන්නරුව රු.	රත්නපුරය රු.	අම්පාර රු.	මොනරාගල රු.	හම්බන්තොට රු.	කන්තලේ රු.	යාපනය රු.	ත්‍රිකුනාමලය රු.	මඩකලපුව රු.	කළුතර රු.	ගම්පහ රු.	කොළඹ රු.	එකතුව 2016 රු.	එකතුව 2015 රු.
වැටුප්	4,126,229.42	3,060,523.03	3,552,560.61	2,765,933.54	2,625,034.34	1,575,026.14	2,512,316.75	2,143,956.69	1,936,662.67	1,372,054.50	431,256.00	1,576,824.28	1,841,125.95	1,454,463.14	2,437,199.15	2,588,357.86	3,483,703.35	39,483,227.42	28,839,328.83
දීමනා	3,951,648.44	2,781,971.12	3,683,614.02	3,091,158.78	2,846,901.72	1,340,572.71	2,639,763.10	1,979,915.65	2,124,365.78	1,511,461.61	471,050.00	1,874,750.10	2,080,651.15	1,713,961.27	2,676,143.61	2,847,163.68	3,687,051.34	41,302,144.08	41,573,721.64
වේතන	9,467,694.41	191,938.28	2,391,418.39	1,637,547.50	2,075,677.67	2,544,695.59	1,006,339.28	738,863.27	2,963,729.29	1,902,746.93	283,167.09	2,171,158.98	1,955,631.07	1,785,200.49	836,000.00	2,165,564.79	599,500.00	34,716,873.03	26,553,305.16
අතිකාල	540,268.42	107,358.23	233,837.96	123,352.57	126,091.62	185,753.56	108,851.93	95,783.00	223,489.00	89,094.00	44,207.29	81,715.28	128,886.88	76,655.69	156,881.08	224,696.12	49,386.51	2,596,309.14	2,446,847.27
සේ.අ.අ.	722,332.13	511,811.55	634,475.67	497,143.33	478,928.72	255,648.13	444,871.14	366,461.60	350,959.11	245,128.77	80,052.72	281,432.76	319,089.10	262,311.59	435,193.39	464,102.45	625,313.60	6,975,255.76	5,472,745.88
සේ.භා.අ.	180,583.04	127,952.90	158,618.92	124,285.83	119,732.18	63,912.04	111,217.77	91,615.40	87,739.79	61,282.20	20,013.18	70,358.19	79,772.29	65,577.89	108,798.36	116,025.63	156,328.40	1,743,814.01	1,368,186.59
ප්‍රවාහන	470,439.80	182,922.00	389,929.00	346,290.00	237,170.00	532,405.00	257,090.00	218,450.00	399,850.00	222,417.00	-	339,222.00	138,392.00	162,700.00	200,640.00	192,750.00	171,260.00	4,461,926.80	3,572,570.95
ගෙවල් කුලී	530,838.70	660,000.00	600,000.00	-	885,041.67	-	597,000.00	380,100.00	650,315.00	740,500.00	338,000.00	475,156.20	-	411,250.00	502,416.13	-	-	6,770,617.70	6,437,787.61
ඉන්ධන	1,068,820.00	470,784.00	887,118.80	832,923.00	542,589.00	956,152.00	723,632.00	611,195.05	884,909.00	289,307.42	-	828,158.85	537,178.00	616,836.00	517,485.50	388,413.00	187,592.00	10,343,093.62	8,809,416.57
දුරකථන	564,876.84	329,054.58	332,364.13	321,059.29	334,724.93	197,166.99	320,362.42	342,411.60	331,681.43	358,512.39	26,024.00	301,671.44	293,969.17	301,517.31	357,107.37	302,928.92	-	5,015,432.81	4,560,808.30
විදුලිය	90,226.30	42,727.93	80,893.00	93,625.00	79,310.17	11,522.60	53,195.00	16,218.90	91,891.00	98,042.08	18,698.00	105,048.20	81,851.00	55,563.60	85,379.35	95,165.00	-	1,099,357.13	1,010,739.22
ලිපිද්‍රව්‍ය	2,284,166.06	479,416.66	1,309,946.26	983,213.42	929,100.78	1,821,795.81	473,797.67	671,026.60	1,102,381.10	484,943.71	-	871,435.66	916,175.31	767,453.59	553,055.27	521,782.95	375,439.04	14,545,129.89	10,540,662.53
ආරක්ෂණ	1,584,950.00	507,920.00	695,240.00	543,640.00	541,170.00	382,990.00	389,540.00	389,050.00	388,600.00	518,670.00	362,070.00	493,680.00	190,320.00	477,100.00	415,890.00	559,065.00	127,750.00	8,567,645.00	9,454,400.00
ජල	68,425.24	79,398.51	108,180.00	109,375.00	60,790.31	106,057.31	54,656.49	62,048.51	114,308.00	85,636.54	12,901.00	50,200.00	51,932.00	128,855.00	68,353.90	29,900.00	-	1,191,017.81	1,039,666.56
අළුත්වැඩියා කටයුතු	241,258.22	165,634.38	397,997.85	404,195.01	361,935.87	185,786.64	417,537.83	405,952.70	629,457.55	160,877.57	-	272,279.50	191,031.82	291,036.26	475,890.85	241,229.77	-	4,842,101.82	4,102,876.19
පවිත්‍ර කටයුතු	249,050.00	121,550.00	195,500.00	212,995.83	224,400.00	194,154.17	238,850.00	242,250.00	178,500.00	198,050.00	200,175.00	243,100.00	209,950.00	218,450.00	255,000.00	215,711.11	-	3,397,686.11	3,171,055.58
දැනුවත් කිරීම්	100,445.00	-	77,900.00	18,760.00	-	12,045.00	5,500.00	-	-	-	-	21,490.00	-	-	4,780.00	-	-	240,920.00	268,510.00
පුනරුත්ථාපන	12,895.00	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	12,895.00	24,723.00
රක්ෂණය	433,585.98	97,696.37	173,020.66	252,026.58	241,199.08	24,008.64	98,194.54	127,595.91	133,456.04	90,893.24	17,809.93	55,201.68	81,496.44	19,530.63	105,814.51	368,004.19	6,825.44	2,326,359.86	2,095,342.46
කාර්යාල උපකරණ නඩත්තු කිරීම	122,707.89	130,963.40	138,236.21	236,894.73	146,515.02	15,989.94	159,156.32	90,360.44	125,662.10	111,559.09	43,664.78	85,824.92	109,589.95	101,299.89	218,149.72	165,674.53	-	2,002,248.93	1,811,484.54
වෙනත්	1,160,790.92	290,797.00	863,519.25	448,094.00	491,090.14	267,586.50	403,887.80	173,953.19	351,781.50	252,812.26	62,742.50	218,983.48	202,796.00	268,273.67	411,729.00	375,018.96	119,948.70	6,363,804.87	4,163,741.61
	27,972,231.81	**10,340,419.94**	**16,904,370.73**	**13,042,513.41**	**13,347,403.22**	**10,673,268.77**	**11,015,760.04**	**9,147,208.51**	**13,069,738.36**	**8,793,989.31**	**2,411,831.49**	**10,417,691.52**	**9,409,838.13**	**9,178,036.02**	**10,821,907.19**	**11,861,553.96**	**9,590,098.38**	**197,997,860.79**	**167,317,920.49**

19 ඊ - කැනීම්

ගිණුම් වර්ගය	**2016** මුළු එකතුව රු	**2015** මුළු එකතුව රු
වැටුප	11,028,115.65	11,632,878.61
දීමනා	10,104,433.11	14,727,460.44
වේතන	4,379,156.22	3,332,263.69
අතිකාල	872,048.88	959,877.91
සේ.අ.අ.	1,895,186.99	2,148,064.61
සේ.භා.අ.	473,796.79	536,750.71
ප්‍රවාහනය	235,779.00	519,019.00
ඉන්ධන	337,890.00	549,620.00
දැනුවත් කිරීම්	926,029.65	102,376.85
ලිපිද්‍රව්‍ය	1,835,614.66	1,837,381.26
වෙනත්	1,088,490.95	1,449,949.13
	33,176,541.90	37,795,642.21

සටහන 20 - පරිපාලනය

ගිණුම් වර්ගය	**2016** මුළු එකතුව රු	**2015** මුළු එකතුව රු
වැටුප	19,423,013.77	15,887,343.30
දීමනා	18,300,115.44	19,582,860.67
වේතන	10,844,601.29	8,417,933.83
අතිකාල	4,062,501.59	3,261,397.00
සේ.අ.අ.	3,421,978.87	2,944,800.02
සේ.භා.අ.	855,494.45	736,453.63
ප්‍රවාහනය	827,436.39	928,371.00
විදේශ සංචාර	5,084,127.90	5,113,770.59
නිලඇඳුම්	938,473.29	2,357,520.03
වෛද්‍ය	9,827,942.00	9,424,415.00
දිරි දීමනා	100,000,000.00	70,000,000.00
ප්‍රසාද දීමනා	3,705,974.18	3,973,721.91
සුභසාධන	7,433,298.26	5,099,611.56
කාර්යමණ්ඩල පුහුණු කිරීම්	497,647.38	478,940.00
සාමාජිකගාස්තු	201,482.06	268,645.38
ගෙවල් කුලි	-	676,232.50
ආරක්ෂක	3,335,026.19	5,102,355.13
පවිත්‍රතා කටයුතු	4,461,800.00	4,046,834.56
විදුලිය	6,522,346.00	6,165,570.52
ජලය	543,071.57	336,525.59
දුරකථන	4,177,818.99	3,203,749.32
ඉන්ධන	6,501,976.03	5,761,482.02
පාරිතෝෂික දීමනා	13,284,441.88	33,602,380.33
වාහන ණය පොලි ප්‍රතිපූරණය.	146,644.49	301,726.92

නිවාස ණය පොලි ප්‍රතිපූරණය	7,083,343.62	4,470,006.88
මෝටර් රථ අලුත්වැඩියාව	6,235,178.79	4,639,002.68
මෝටර් රථ- සේවා ගාස්ත	2,611,852.24	2,764,388.24
මෝටර් රථ- කුලියට ගැනීමේ ගාස්ත	140,240.00	48,882.00
මෝටර් රථ- වෙනත්	594,716.74	837,298.49
රක්ෂණය - පුද්ගලික අනතුරු	460,811.73	512,312.51
රක්ෂණය - වෙනත්	2,232,963.49	2,011,950.19
රක්ෂණය - එච් ඇන්ඩ් එස්	3,264,477.23	3,214,183.70
රක්ෂණය - මෝටර් රථ	3,892,001.12	4,530,862.79
රක්ෂණය - ගොඩනැගිලි	497,070.12	325,006.58
නඩත්තු කටයුතු- ගොඩනැගිලි	3,831,300.04	2,701,822.15
නඩත්තු කටයුතු - පිරියත හා යන්ත්‍රෝපකරණ	772,240.50	147,530.00
නඩත්තු කටයුතු - සෝපාන	263,303.59	232,981.52
නඩත්තු කටයුතු - කාර්යාල උපකරණ.	2,657,647.34	2,642,636.45
නඩත්තු කටයුතු - මෘදුකාංග	536,065.61	772,403.54
නඩත්තු කටයුතු - විදුලිජනක යන්ත්‍ර	312,225.76	269,512.08
අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	390,204.00	310,682.20
නීති ගාස්තු	785,953.00	299,350.00
විගණන ගාස්ත	1,096,225.46	1,512,843.70
තැපැල් ගාස්ත	23,852,.23	13,705.84
මුද්දරගාස්තු	853,884.99	660,882.00
ලිපි ද්‍රව්‍ය	277,725.00	190,475.00
වෙළඳ දැන්වීම්	3,377,280.46	3,215,181.58
වෙළඳ ප්‍රවර්ධන කටයුතු	1,991,600.00	2,051,753.75
වෙළඳ ප්‍රවර්ධනය	398,120.00	200,000.00
ක්ෂයවීම්	92,658,195.18	106,408,827.96
වැට් /ජාතිය ගොඩනැගීමේ බදු / ආර්ථික සේවාගාස්තු	13,192,691.20	7,077,027.07
පරිත්‍යාග	348,187.50	750,900.00
පුනරුත්ථාපන කටයුතු	9,951.00	73,000.00
වෙනත් වියදම් - සටහන 20ඒ	10,001,962.91	12,095,582.81
	385,188,483.01	372,653,632.52

සටහන 20 ඒ - වෙනත් වියදම්

	2016 මුළු එකතුව රු	2015 මුළු එකතුව රු
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය	101,304.00	6,000.00
පරිසර දිනය / සමාජ ආයතනික වගකීම	2,049,743.16	1,172,633.51
මහනගර සභා බද්ද	591,855.60	591,855.60
ටෙන්ඩර් මණ්ඩලය	87,000.00	110,300.00
යක්කල බදු වියදම්	1,801,407.47	1,771,875.00
කාර්ය මණ්ඩල ප්‍රවාහනය	-	1,958,780.00
භාන්ඩ ප්‍රවාහනය - 5000ට අඩු	600,740.25	1,215,573.39
උපදේශන ගාස්තු	2,500.00	27,500.00
පරිත්‍යාගය - ශිෂ්‍යත්ව විභාගය	45,000.00	45,000.00
පරිත්‍යාගය - විශ්ව විද්‍යාල ප්‍රවේශය	-	45,000.00
අනිකුත් කාර්යාල වියදම්	4,628,102.43	5,151,065.31
බලාත්මක කිරීමේ ඒකකයේ වියදම්	94,310.00	-
	10,001,962.91	12,095,582.81

සටහන 21 - මුල්‍ය ආදායම

	2016 මුළු එකතුව රු	2015 මුළු එකතුව රු
මහජන බැංකුව - ගාලු පාර	92,722,607.60	52,440,860.69
මහජන බැංකුව (පාරිතෝෂික අරමුදල)	2,953,149.09	2,526,552.76
භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය	19,710,515.92	13,617,970.75
අතිරික්ත අරමුදල් සඳහා පොලිය	577,393.74	-
	115,963,666.35	68,585,384.20

සටහන 22 - ආදායම් බද්ද

2006 දේශීය ආදායම් බදු පනතෙහි 07(41) වගන්තිය ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ආදායම් බදු ගෙවීමට බැඳ සිටියි. ඒ අනුව 2016 වර්ෂය සඳහා රු. 27,315,639 ක් ගෙවා ඇත.

සටහන 23 - ආයතනයට එරෙහිව ගන්නා ලද නීතිමය පියවර

බාහිර පාර්ශ්වයක් විසින් කාර්යාංශයට විරුද්ධව බදුල්ල දිසා අධිකරණයෙහි නඩුවක් ගොනු කර තිබුණි.

සටහන 24 - අදාළ පාර්ශ්ව සමඟ සිදු කරන ලද ගනුදෙනු අනාවරණය කිරීම

සී/ස භූ.ස.ප.කා තාක්ෂණික සේවා සමාගම වෙතින් සේවකයන් කුලී පදනම මත ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් 42,766,124.33ක් ගෙවීම.

විගණකාධිපති වාර්තාව



විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. අයිඊඑන්/සී/ජීඑස්එම්බී/1/16

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2017 නොවැම්බර් 02 දින

සභාපති,

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය.

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2017 සැප්තැම්බර් 26 දින නිකුත් කරනු ලැබිය.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර නිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මුලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 අභිතකර මතය

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.108,272,097 ක්වූ කාර්යාංශයට අනුබද්ධිත ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගමේ සියයට 66 ක හිමිකමක් කාර්යාංශයට තිබුණද එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 82, 83(අ) වගන්ති ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල පාරිතෝෂික වෙන්කිරීම් අනාවරණය කිරීමේදී විශ්‍රාම ගන්වන වයස ඉක්මවූ සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂිකය ජංගම වගකීම් ලෙසත් ඉතිරිය ජංගම නොවන වගකීම් ලෙසත් නිරූපනය කිරීම වෙනුවට රු.131,042,056 ක්වූ මුළු පාරිතෝෂික වෙන්කිරීම, ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

* පල්ලෙකැලේ සුනාමී සන්නිවේදන මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් ලැබී තිබුණු මුදලින් ඉතිරි වූ රු.7,821,979 ක් ජංගම නොවන වගකීමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට මුළු ශේෂයම ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 118 වගන්තිය ප්‍රකාරව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ ස්කන්ධය යටතට නොගැනෙන රු.25,560,400 ක් වූ අරමුදල් 2 ක් හා රු.10,400 ක ප්‍රදානයක් ස්කන්ධය යටතේ දක්වා තිබුණි.

(iii) ප්‍රමිතයේ 82, 83(අ) වගන්ති ප්‍රකාරව සටහන් මගින් හෙළිදරව් කළ යුතු කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල 16 පිළිබඳව හා අනෙකුත් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

ගොඩනැගිලි ක්ෂය අනුපාතය සියයට 20 සිට සියයට 5 දක්වා අඩුකර තිබුණද එකී වෙනස්වීම පිළිබඳව ප්‍රමිතයේ 44 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ප්‍රමිතයේ 69 වගන්තිය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම වත්කම භාවිතයට ගත් දිනයේ සිට ආරම්භ කළ යුතු වුවද රු.525,923,903 ක් වූ දේපල, පිරියත හා උපකරණ මිලදී ගත් මාසයේ අවසන් දිනට පැවති අගය මත ක්ෂය කර තිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නොග නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතු වත්කමක අවම වටිනාකම ගිණුම් ප්‍රතිපත්ති මගින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) දේශීය හා විදේශීය රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ආයතනය විසින් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ප්‍රදාන රු.10,399 ක් හා විදේශීය ප්‍රදාන රු.16,968,107 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ දක්වා තිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවාදායකයන් වෙනුවෙන් මිලදීගෙන ඔවුන් විසින් වියදම් ප්‍රතිපූරණය කරන ලද රු.2,046,540 ක් වටිනා වත්කම් කාර්යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) කාර්යාංශය සතුව පැවති රු.199,962,533 ක් වටිනා ඉඩම් ඉකුත් වර්ෂවලදී නීත්‍යානුකූලව වෙනත් රාජ්‍ය ආයතනවලට පවරා තිබුණද, ඒවා තව දුරටත් ගිණුම්වල ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් කාර්යාංශය වෙත පවරන ලද පර්චස් 129 ක ඉඩම් හා ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ ගොඩනැගිල්ල පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂයට අදාල පාරිතෝෂික වියදම් රු.13,892,899 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය රු.13,282,442 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පාරිතෝෂික වියදම් රු.608,457 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ලෙස රු.5,447,160 ක් මුදලින් ගෙවා තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කිරීමේදී, කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ ගැලපුම් කළ යුතු පාරිතෝෂික අරමුදල් පොලිය රු.646,884 ක් හා පාරිතෝෂික ගෙවීමේදී අයකර ගන්නා ලද රු.2,570,304 ක ආපදා ණය ගැලපුම් කර පාරිතෝෂික ගෙවීම් ලෙස රු.7,370,580 ක් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ දිරිදීමනා ඌන ප්‍රතිපාදනය වූ රු.1,161,325 ක් රඳවාගත් ඉපයුම්වලට ගැලපීම් වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

(උ) ආයෝජන ආදායම්වලින් රඳවාගන්නා ලද බදු රු.6,156,849 ක් ගිණුම්වල දක්වා නොතිබීම හේතුවෙන් ආදායම් හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) කාර්යාංශයේ සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.33,514,439 ක් වුවද රඳවා ගැනීම් බදු හිලව් කිරීමෙන් පසු ගෙවිය යුතු ආදායම් බදු ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු.27,315,639 ක් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී විශ්ලේෂණ රසායනාගාරයේ වර්ෂ අවසානයට ඉතිරිව තිබූ ඇසිඩ් බෝතල් 52 ක් හා විවිධ රසායන ද්‍රව්‍ය බෝතල් 171 ක් ගණනය කර අවසාන තොග ලෙස දක්වා නොතිබුණි.

(ඒ) ජීඑස්එම්බී තාක්ෂණ සේවා සමාගම විසින් කාර්යාංශය වෙනුවෙන් 2011 වසරේ සිට 2016 දක්වා දරන ලද කාර්ය මණ්ඩල, කාර්යාල අළුත්වැඩියා හා ව්‍යාපෘති වියදම් පිළිවෙලින් රු.9,499,181 ක්, රු.1,450,874 ක් හා රු.1,618,283 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.157,752,554 ක් වූ වෙළඳ හා අනෙකුත් ණයගැතියන්ගෙන් රු.1,671,390 ක් වර්ෂ 5 ඉක්මවා තිබුණ ද ඒ වෙනුවෙන් බොල්ණය වෙන්කිරීම් කර නොතිබුණි.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන හා භෞතික සමීක්ෂණ වාර්තා සැසඳීමේදී රු.668,527 ක් වටිනා පොත් හා සිතියම් තොගයක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

වසර 23 ක සිට පැවතෙන විදේශ ප්‍රදාන මගින් ලැබුණු රු.1,984,210 ක් වූ වත්කම් තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2002 වර්ෂයේදී භාණ්ඩ හා සේවා බදු අවලංගු කර තිබුණද වැඩිපුර ගෙවා තිබූ රු.973,143 ක් අදාළ වර්ෂවලදී නිරවුල් නොකිරීම හේතුවෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) කාර්යාංශයේ හිටපු සභාපතිවරයෙකුට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා 2014 වර්ෂයේ ලබා දී තිබූ රු.1,500,000 ක අත්තිකාරම් පියවාගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1992 අංක 33 දරන පතල් හා බණිජ ද්‍රව්‍ය පනතේ 26(1) හා 44(ආ) වගන්ති	රජය වෙනුවෙන් කාර්යාංශය විසින් අයකර ගන්නා රාජ්‍යභාග මුදල් භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2014, 2015 හා 2016 වර්ෂවල ලැබුණු පිළිවෙලින් රු.428,601,622 ක් රු.438,810,229 ක් හා රු.568,348,602 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණි.
(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 9(2)(ඊ)වගන්තිය	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබූ රු. 1,010,235,812 ක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ස්කන්ධය අඩුවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

11 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.250,271,935 ක් භාණ්ඩාගාර බිල්පත්වල හා රු.1,362,072,135 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණ ද ඊට අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 6(2)(අ) ඡේදය	පාරිතෝෂික ගණනය කිරීමේදී මාස භාගයක වැටුප වෙනුවට 2015 වර්ෂයේ සිට මාසයක වැටුප පදනම් කරගෙන ගණනය කිරීම හේතුවෙන් නිලධාරීන් 10 දෙනෙකුට රු.4,580,276 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i) XXIV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛය	ආපදා ණය ගෙවීමේදී දළ වැටුප පදනම් කරගෙන හා රු. 250,000 ක උපරිම සීමාව ඉක්මවා නිලධාරීන් 133 කට ගෙවීම හේතුවෙන් රු.31,991,022 ක් වැඩිපුර ගෙවා තිබුණි.
(ii) XXX පරිච්ඡේදයේ 1.4 හා 1.4.1 වගන්ති	ලේකම්වරයාගේ අවසරයකින් තොරව නිලධාරීන් තිදෙනෙකු විසින් කාර්යාංශයට අනුබද්ධිත ආයතනයකට ව්‍යාත්මය සේවා සැපයීම සිදුකර ඉකුත් වර්ෂයේ උපයාගෙන තිබුණු රු.1,969,500 ට අදාළව ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කාර්යාංශය වෙත අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ	
(i) මුදල් රෙගුලාසි 104	සමාලෝචිත වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 26 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	(ii) මුදල් රෙගුලාසි 371(5)	සමාලෝචිත වර්ෂය අවසානයේ නොපියවූ රු.1,382,800 ක උපඅග්‍රිම ශේෂ පියවා ගැනීමට කටයුතු නොකර මුදල් හා මුදල් සමාන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 396	නිකුත් කර මාස 6 ඉක්මවූ රු. 654,830 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
	(iv) මුදල් රෙගුලාසි 757	ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල හා රසායනාගාරවල ස්ථාවර වත්කම්වලට අදාළව තොග සමීක්ෂණය සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ඊ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.3.1 වගන්තිය	2016 වර්ෂය සඳහා වූ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ විගණන හා කළමනාකරණ කමිටු වාර්තා ඇතුළත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,564,027,187 ක ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ලාභය රු.1,037,093,870 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.526,933,317 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාලවල මෙහෙයුම් වියදම් රු.30,679,940 කින් හා දිරිදීමනා වෙන්කිරීම රු.30,000,000 කින් වැඩිවී තිබුණද, රාජ්‍ය භාග ආදායම රු.285,151,382 කින්, බලපත්‍ර ගාස්තු රු.144,795,562 කින්, පරීක්ෂණ ගාස්තු රු.65,010,116 කින්, මූල්‍ය ආදායම් රු.47,378,282 කින් හා වෙනත් ආදායම් රු.22,790,816 කින් වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කළද 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව ලාභයේ වර්ධනයක් නිරීක්ෂණය විය. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු කාර්යාංශයේ දායකත්වය 2012 වර්ෂයේ රු.907,668,917 ක් වූ අතර 2016 වර්ෂයේදී රු.2,081,082,775 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

කාර්යාංශයට විරුද්ධව බාහිර පාර්ශවයන් විසින් නඩු 17 ක් හා කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 07 ක් පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත අනුව භූ විද්‍යා සිතියම් සැකසීම, ඛණිජ සම්පත් හඳුනා ගැනීම, ගවේෂණය හා කැණීම, ඒවා වෙළඳාම් කිරීම හෝ අපනයනය විධිමත් කිරීම කාර්යාංශයේ ප්‍රධාන අරමුණු විය. අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ කාර්යයන් අතරින් භූ විද්‍යා සිතියම් සකස් කිරීම, ඛනිජ සම්පත් හඳුනාගැනීම සහ ඒවා තක්සේරු කිරීමේ කටයුතුවල ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක තිබූ අතර පතල් කැනීමේ වාණිජමය ශක්‍යතාවය පිළිබඳව ඇගයීම ද, ඛනිජ සකස් කිරීම, වාණිජමය පදනමක් මත ඛනිජ නිෂ්කර්ෂණය කිරීම, වටිනාකම් එකතු කිරීම සහ අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම යන කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ආ) කාර්යාංශයේ භූ විද්‍යා අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව භූ විද්‍යා අංශය විසින් ඉටු කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 12 ක් සඳහා රු.58,539,100 ක් වෙන් කර තිබුණද අදාළ කාර්යයන්ගේ වාර්ෂික/කාර්තුමය කාර්යසාධන වාර්තා පිළියෙල කර හෝ එක් එක් කාර්ය සඳහා අවශ්‍ය ලිපිලේඛන පවත්වා හෝ නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ දක්වා තිබූ ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ii) වසරේ ඛණිජ අත්පොත -2015 නිකුත් කිරීමට 2017 ජූලි 31 දින දක්වා අසමත්ව තිබූ අතර පුස්තකාලය හා කෞතුකාගාරය සඳහා රු.මිලියන 6.8 ක් වෙන්කර තිබුණද අදාළ අංශවල ප්‍රමාණවත් භෞතික හා මූල්‍ය කාර්යසාධනයක් සමාලෝචිත වර්ෂයේදී ද පෙන්නුම් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොළඹ වරාය නගරය ඉදිකිරීම සඳහා කැණීම් කර තිබූ මුහුදු වැලි කියුබ් 3,909,669 ක් සඳහා අයවිය යුතු රාජ්‍යභාග රු.465,546,966 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගය දිර්ඝකිරීමේ ව්‍යාපෘතිය සඳහා නිකුත් කර තිබූ බලපත්‍ර 4 කට අදාළව බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකර තිබූ පස් කැපීම් හේතුවෙන් අයවිය යුතු රු.3,001,788 ක රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කැණීම් කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් හෝ බලපත්‍ර දීර්ඝ කිරීමේදී නිසි ඇගයීමක්ද කාර්යාංශය විසින් සිදු කර නොතිබුණු අතර එක් බලපත්‍රලාභියෙකු කොන්දේසි කඩකර තිබියදී පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 36(අ) වගන්තියට පටහැනිව බලපත්‍ර අලුත් කර දී තිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල සඳහා සේව්‍ය හා සේවක දායකත්වය 3:2 අනුපාතයට විය යුතු වුවත් කාර්යාංශයේ සේව්‍ය දායකය සියයට 12 ක් හා සේවක දායකය සියයට 10 ක් වීමෙන් සේව්‍ය දායකත්වය සියයට 3 ක් අඩුවෙන් ගෙවා තිබුණි. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවක දායකත්වය පිළිබඳ කිසිදු තොරතුරක් ගිණුම් සටහන්වල හෙළිදරව් කර ද නොතිබුණි.

(ඈ) කාර්යාංශයේ අරමුණුවලට පටහැනිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සම්බන්ධිත කාර්යයන් 4 ක් සඳහා රු.6,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විවිධ ආයතනවලට ගෙවා තිබුණි. මීට අදාළ ලිපිගොනු හා වැයකිරීම් තහවුරු කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර ද නොතිබුණි.

(ඉ) නීති විරෝධී කැනීම් පාලනය සඳහා වැටලීම් ඒකකයක් ස්ථාපිත කර නොතිබීම නිසා දීප ව්‍යාප්තව නිරන්තරයෙන් අනවසර කැනීම් සිදු වුවත් ඒ සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට හා බලපත්‍රයේ සඳහන් අනුමත ප්‍රමාණය ඉක්මවා කැනීම් කර ඇති අවස්ථාවලදී වැඩිපුර කැනීම් කර ඇති ප්‍රමාණය සඳහා රාජ්‍යභාග අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ඊ) ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන් යෙදවීමේදී අනුරාධපුර, වවුනියාව හා මන්නාරම යන දිස්ත්‍රික්ක 03 හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32 ක් ආවරණය කිරීමට ක්ෂේත්‍ර සහායකයින් දෙදෙනෙකු පමණක් යොදවා තිබුණි.

(උ) රජයේ ප්‍රතියාන්ත්‍රණය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා 2012 වර්ෂයේදී පද්ධති අධ්‍යනයක් සිදුකිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.1,505,000 ක් ගෙවා තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර තිබුණි.

(ඌ) 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිකුත් කර තිබුණු බනිජ වැලි ගවේෂණ බලපත්‍ර 42 කට අදාල ගවේෂණ ප්‍රතිඵල මත කැණීම් බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(එ) 2012 නොවැම්බර් 14 දිනැති අංක 12/1383/527/0121 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර බනිජ වැලි කැණීම පාරිසරික හා සමාජීය බලපෑම් අවම්වන ආකාරයෙන් නීති රීතිවලට අනුගත වෙමින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සඳහා

යෝජනා කැඳවීමේ ලියවිල්ලක් සකස් කළ යුතු වුවත් වසර 4 ක් ගතවී ඇතත් එවැනි ලියවිල්ලක් සකස් කර නොතිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව බනිජ වැලි කැණීම් හා අපනයන කටයුතු සිදු කරන ආයතන අගය එකතු කිරීම නිසි ආකාරයෙන් සිදු කරන්නේද යන්න පසුවිපරම් කළ යුතු වුවත් ඒ සඳහා ද පියවර ගෙන නොතිබුණි.

(ඒ) බලපත්‍ර නිකුත් කිරීමේදී ඊට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට පෙර අයදුම්පත සමඟ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවත් ඊට අදාල එකතු කළ අගය මත බදු හා මුද්දර ගාස්තුද අයකර තිබුණි. මීට අමතරව බලපත්‍රය මඟින් කැනීම් කරන බණිජ ප්‍රමාණය මත අයකළ යුතු රාජ්‍ය භාගය සඳහා අත්තිකාරම් මුදලක් අයකර තිබුණි. මේ හේතුවෙන් බලපත්‍ර නිකුත් කිරීමට නොහැකි අයදුම්පත්වලට අදාලව විශාල මුදලක් කාර්යාංශයේ නිරන්තරයෙන් සමුච්චිතව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි එකතුව රු.170,361,042 ක් විය.

(ඔ) කුඨ ලේඛන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධ විෂමාචාර ක්‍රියා

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදය ප්‍රකාරව කුඨ ලේඛණ සැකසීම සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශන වාර්තාවකට අනුව, නිලධාරීන් 6 දෙනෙකු චූදිතයන් ලෙස හඳුනාගෙන තිබුණ ද, ඉන් නිලධාරීන් තිදෙනෙකුට පමණක් චෝදනාපත්‍ර නිකුත් කර තිබුණි.

(ii) නිලධාරීන් දෙදෙනෙකුගේ වැඩ තහනම් කළ යුතු බවට මූලික විමර්ශන වාර්තාවෙන් නිර්දේශ කර තිබියදී ස්ථාන මාරුකිරීම් පමණක් සිදු කර තිබූ අතර එක් නිලධාරියෙකු විදේශ වැඩමුළුවක් සඳහා සහභාගී කරවීම වෙනුවෙන් රු. 130,118 ක් වැයකර තිබුණි.

(iii) මේ සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව වෙත දැනුම්දිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

(ඕ) කැණීම් කටයුතුවලින් අනතුරුව පරිසරය ප්‍රතිසංස්කරණය කිරීමට බලපත්‍රලාභීන් කටයුතු නොකිරීම හේතුවෙන් 2009 වසරේ සිට රු.52,014,000 ක් වූ බැංකු ඇපකර කාර්යාංශය වෙත පවරා ගෙන තිබුණ ද කොන්දේසි කඩකළ බලපත්‍රහිමියන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට හෝ ඔවුන් අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. මෙහිදී

අදාළ පරිසර ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුවී නොතිබීම හේතුවෙන් පැනනැඟී ඇති පාරිසරික හා සාමාජීය ගැටලු සම්බන්ධයෙන් කාර්යාංශයේ අවධානය යොමුකර නොතිබුණි.

(ක) **උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීම**

උමාඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයේ පුහුල්පොල වේල්ල හා පුහුල්පොල ජලාශය ඩයිරබා ජලාශයේ මීටර් 3870 ක් දිග සම්බන්ධක උමඟ ඉදිකිරීමට අදාළ කැණීම්වලදී කැණීම් බලපත්‍රවල හා ඊට අදාළ පරිසර ආරක්ෂණ බලපත්‍රවල සඳහන් පිපිරුම් සීමාවන් ඉක්මවා තිබූ අවස්ථා හා ඒ පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) සම්බන්ධක උමඟ ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් සිට 2016 නොවැම්බර් දක්වා කාලය තුළ සිදුකර තිබූ පිපිරුම් 2034 කින් පිපිරුම් 269 ක දීම නියමිත භූකම්පන සීමාව වූ 5mm/sec සීමාව, 19.6mm /sec ක් දක්වා ඉක්මවා තිබුණි.

(ii) පුහුල්පොල වේල්ල ඉදිකිරීම සඳහා 2015 දෙසැම්බර් සිට 2016 නොවැම්බර් දක්වා කාලය තුළ සිදුකර තිබූ පිපිරුම් 1607 කින් පිපිරුම් 170 ක දීම නියමිත වායු පිපිරවීම් පීඩන සීමාව වූ 120db සීමාව ඉක්මවා තිබුණි.

(iii) මෙම සීමා ඉක්මවීම් පිළිබඳ අධීක්ෂණ සමාගම විසින් කාර්යාංශයටද පිටපත් සහිතව කොන්ත්‍රාත්කරුට දැනුම්දී තිබුණද කොන්ත්‍රාත්කරු ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම කටයුතු පාලනය කිරීම සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කළ කාර්යාංශය විසින්ද ප්‍රමාණවත් පියවර නොගෙන 2016 මාර්තු 24 දින සිට සම්බන්ධක උමඟ සඳහා වූ කැණීම් බලපත්‍රය දීර්ඝ කර දී තිබුණි.

(iv) සීමාව ඉක්මවන පරිදි පිපිරුම් කර ඇති බව අනාවරණය වී තිබියදීත්, 2015 ඔක්තෝම්බර් 02 සිට වසරක් සඳහා සම්බන්ධක උමඟ වෙනුවෙන් මධ්‍යම පරිසර අධිකාරිය ලබාදුන් පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සඳහන්

පිපිරුම් පරාමිතයන් කාර්යාංශය විසින් අදාල වසර තුළ දෙවරක් වැඩිකරදී තිබුණි. විස්තර පහත දැක්වේ.

	නියමිත පරාමිතිය	පරාමිතීන් වැඩි කිරීම	
		2015 දෙසැම්බර් 04	2016 මැයි 13
උපරිම බෝර සිදුරු සංඛ්‍යාව	45	80	75
උපරිම බෝර ගැඹුර	2.2 m	3 m	3m
එක් පිපිරුමක් සඳහා භාවිතා කල යුතු ද්‍රව්‍ය ප්‍රමාණ			
Emulsion	91 kg	140 kg	149.2 kg
ANFO	12.7 kg	40 kg	48.4 kg
Nonnel Detonator	75	80	75
Electric Detonator	06	10	08
Detonator Code	3 m	3 m	10 m

(i) ව්‍යාපෘතියේ ඩයිරබා වේල්ල හා මීටර් 15,650 ක් දිග ප්‍රධාන උමඟ ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරු කැණීම් බලපත්‍ර ලබා නොගෙන කැණීම්කර තිබුණද ඒ සඳහා කාර්යාංශය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ග) **දිරිදීමනා ගෙවීම**

සමාලෝචිත වර්ෂයේදී රු.71,161,325 ක දිරිදීමනා ගෙවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1996 අගෝස්තු 02 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් කාර්යසාධනය පදනම් කරගත් දිරි දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද එවැනි දිරිදීමනා යෝජනාක්‍රමයක් සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දිරිදීමනා සඳහා අදාල කර නොගත යුතු ශුද්ධ ඉපයීම් රු.144,326,648 ක් දිරිදීමනා ගණනය කිරීමේදී පදනම් කරගෙන තිබුණි.

(iii) දිරිදීමනා ගෙවීම සඳහා කාර්යසාධන නිර්ණායක 04 ක් මත ලකුණු ලබාදී තිබුණ ද ඒවා පදනම් කර ගෙන නොතිබුණු අතර සියළු සේවකයන්ට කාර්යසාධන මට්ටම නොසලකා මාස 10 ක දිරිදීමනා ලබා දී තිබුණි.

(iv) සියලු සේවකයන්ට වගකීම් පැවරෙන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබිය දී කාර්යසාධන ඇගයීමේ ලකුණු වලින් සියයට 45 ක් ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යසාධනය සඳහා ලබාදී තිබීමත් සේවක පැමිණීම හා නිවාඩු දිරිදීමනා ගෙවීමේ දී සලකා බලා නොතිබීමත් මතභේදයට තුඩු දී තිබුණි.

(v) දිරිදීමනා ගෙවීම සඳහා සුදුසුකම් ලැබූ මුදලින් සියයට 05 ක් එනම් රු.3,823,563 ක් හදිසි ආපදා අරමුදල නම් වූ භාණ්ඩාගාර අනුමැතිය නොලත් සුභසාධන අරමුදලකට බැර කර තිබුණි.

(vi) දිරිදීමනා ගණනය කිරීමේදී පදනම් කරගන්නා ලද ශුද්ධ ඉපයීම නිරණය කිරීමේ දී ආදායමෙන් පොදුකාර්ය වියදම් සියයට 15 ක් අඩුකර තිබුණද එම ප්‍රතිශත නිරණය කිරීමේ පදනම විගණනයට හෙළිදරව් නොකෙරුණි.

(ජ) විගණන විමසුම් සඳහා අප්‍රමාදව ක්‍රියාකර පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ විගණන විමසුම් 04 ක් සඳහා 2017 සැප්තැම්බර් 30 වනවිටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බනිජ වැලි ගවේෂණ හා කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

(i) 2010 වර්ෂයේ වාකරේ ප්‍රදේශයේ බණිජවැලි කැණීම් බලපත්‍ර අයදුම් කර තිබුණු පුද්ගලික සමාගමක් වෙත ඒවා නිකුත් නොකර ගවේෂණ බලපත්‍ර දෙවරක් අලුත් කර දී තිබුණි. එම සමාගම නීතිමය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීමේ දී ඇති වූ එකඟතාවය මත පතල් හා බණිජද්‍රව්‍ය පනතට පටහැනිව 2014 දෙසැම්බර් 09 දින සිට වසර 10 ක කාලයකට හෙක්ටයාර 06 ක් හා හෙක්ටයාර 19 ක් සඳහා බණිජවැලි කැණීම් බලපත්‍ර 02 ක් නිකුත් කර තිබුණි.

(ii) 2012 නොවැම්බර් 14 දිනැති අංක 12/1383/527/0121 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාර දේශීය වශයෙන් අගය එකතු කර නිමවුම් නිෂ්පාදනය කිරීමට කැමති ආයෝජකයින්ට පමණක් ගවේෂණ හෝ කැණීම් බලපත්‍ර නිකුත් කළ යුතු බවට වූ නියමයන් නොසලකා මෙම බලපත්‍ර නිකුත් කර තිබුණි. එසේ වුවද එම තත්ත්වයේම පැවතුණු රාජ්‍ය සමාගමක් කෝකිලායි ප්‍රදේශයේ බණිජවැලි කැණීම් සඳහා 2015 වර්ෂයේ ඉල්ලුම් කළ කැණීම් බලපත්‍රය අමාත්‍ය මණ්ඩල තීරණය හේතුකොටගෙන ලබානොදී ගවේෂණ බලපත්‍ර දීර්ඝ කරදීම පමණක් සිදුකර තිබුණි.

(iii) කැණීම් බලපත්‍ර වර්ෂයකට ලබාදී, වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව වාර්ෂිකව බලපත්‍රය දීර්ඝ කළ යුතු වුවත් අදාල බලපත්‍ර වර්ෂ 10 ක කාලයකට ලබාදීම හේතුවෙන් නියමිත ක්‍රමවේදය අනුගමනය කළ නොහැකි වී තිබුණි.

(iv) සමාගම මෙම බලපත්‍ර 2 ට අදාළව 2014 වර්ෂයේ සිට 2017 ජූනි දක්වා කිසිදු කැණීම් කටයුත්තක් සිදු කර නොතිබුණද, 1993 නොවැම්බර් 26 දිනැති අංක 794/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් කාර්යාංශයට පැවරී ඇති බලතල ප්‍රකාරව බලපත්‍ර අවසන් කිරීමට හෝ ගවේෂණ බලපත්‍ර බවට වෙනස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(v) අදාළ පුද්ගලික සමාගම බණිජවැලි පිළිසකර කර ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයන බලපත්‍ර ලබා ගෙන තිබූ අතර අපනයනය කරන බණිජ සඳහා රාජ්‍යභාග ගෙවීමේදී නැව තෙක් නොමිලේ වටිනාකමට (FOB) සාවද්‍ය ලෙස ගණනය කිරීම හේතුවෙන් රාජ්‍යභාග අඩුවෙන් ගෙවා තිබුණි. විගණනය විසින් සිදු කළ නියැදි පරීක්ෂණය අනුව චුම්බක නොවන බැර බණිජ සාන්ද්‍රිත (Non Magnetic Heavy Mineral Concentrate) මෙට්‍රික් ටොන් 8000 ක් චීනයට අපනයනය කිරීමේදී රු.3,131,588 ක් රාජ්‍යභාග අඩුවෙන් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(vi) තෙවික්කාලු ප්‍රදේශයේ බණිජ වැලි කැණීම සඳහා රාජ්‍ය සමාගමකට නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන එම රාජ්‍ය සමාගමේ එකඟතාවයකින් තොරව මාස 3 ක කාලයකට මෙම පෞද්ගලික සමාගම වෙළඳ බලපත්‍රයක් ලබාගෙන තිබුණි. එම බලපත්‍රය මත තෙවික්කාලු ප්‍රදේශයේ කණින ලද බණිජ වර්ග බව දක්වමින් මෙට්‍රික් ටොන් 13,373 ක් අපනයනය කර තිබුණද එම ප්‍රදේශයෙන් කැණීම් සිදු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාංශය අපනයන බලපත්‍ර ලබාදී තිබුණි.

(ආ) සිලිකා වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පුත්තලම් දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය, මාදම්පේ හා මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ස්ථානගතව ඇති සිලිකා වැලි නිධි පිළිබඳ ගවේෂණය කිරීමට, සිතියම් ගත කිරීමට හා එම පතල් කැණීමේ වාණිජමය ස්වශක්තිතාවය පිළිබඳ ඇගයීම් කිරීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) බලපත්‍ර 08 ක් ලබාදීමේ දී අනුමත කැණීම් ගැඹුර ලෙස අඩි 10 – අඩි 15 දක්වා තිබුණ ද ගවේශණයක් සිදු කර නොතිබිය දී කැණීම් ගැඹුර තීරණය කළ ආකාරය මතභේදයට තුඩු දී තිබුණි.

(iii) බලපත්‍රලාභීන් විසින් කැණීම් වලවල් වල ගැඹුර, සක්‍රීය කැණීම් ප්‍රදේශය, ඉඩම් මායිම්වල සිට තැබිය යුතු දුර, කැණීම් වලවල්වල බැවුම අනුමත සීමාව ඉක්මවා තිබීම, කොන්දේසි ප්‍රකාරව කැණීම් වලවල් ප්‍රතිසංස්කරණය කර නොතිබීම හා ප්‍රතිසංස්කරණය නොකර අතහැර දැමීම සහ පරිසර අධිකාරියේ හා ජල සම්පත් මණ්ඩල නිර්දේශ ප්‍රකාර කටයුතු නොකිරීම ආදී වූ බලපත්‍ර කොන්දේසි කඩකර තිබුණ ද ඒ පිළිබඳ පසු විපරම් කිරීමට කටයුතු නොකර බලපත්‍ර අලුත් කිරීම, නව බලපත්‍ර නිකුත් කිරීම හා ඇප මුදල් නිදහස් කිරීම සිදුකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී කාර්යාංශයේ නොවන නිලධාරීන් දෙදෙනෙකු විදේශ පුහුණුවකට යැවීම වෙනුවෙන් සංයුක්ත දීමනා හා වෙනත් වියදම් ලෙස කාර්යාංශය විසින් රු. 953,258 ක් ගෙවා තිබුණද අදාල මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

4.4 හඳුනාගෙන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු විසින් ලබාගෙන තිබූ රු. 597,231 ක් වටිනා උපකරණ ආපසු භාර දී නොතිබූ අතර එම අලාභ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 1992 අංක 33 දරන පතල් හා බණිජ ද්‍රව්‍ය පනතේ 35 හා 44 වගන්ති ප්‍රකාරව අයකර ගත යුතු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමෙන් තොරව වරාය නගරය සඳහා මුහුදුවැලි කැණීම පිණිස ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත නිකුත් කර තිබූ 2014 සැප්තැම්බර් 16 දිනැති අංක IML/A/HO/ 8328 දරන බලපත්‍රයට අදාළ රු.68,000,000 ක ගාස්තුව ලබා නොගැනීම හා 2016 ට පෙර කැණීම් කරන ලද මුහුදු වැලි කියුබ් 3,485,823 ක් සඳහා අයවිය යුතු රු.557,731,680 ක රාජ්‍යභාග මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.625,731,680 ක් කාර්යාංශයට අහිමිවී තිබුණි.

(ඇ) **යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය**

(i) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන චීන සමාගම ඇතුළු බලපත්‍රලාභීන් 41 ක් සඳහා ලබාදුන් වැලි කැණීම් බලපත්‍ර මත සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රාජ්‍යභාග රු.34,215,010 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ii) යාන් ඔය වැලි නිධිය සම්බන්ධයෙන් 1992 අංක 33 දරණ පතල් හා බණිජ ද්‍රව්‍ය පනතේ 12(ආ) වගන්තිය ප්‍රකාරව භූ විද්‍යාත්මක කැණීම් සිදු කර වැලි ප්‍රමාණය තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) පතල් හා බණිජ ද්‍රව්‍ය පනතේ 36(ආ) වගන්තියට පටහැනිව බලපත්‍ර 5 ක් සඳහා අයකර ගත යුතු රු.6,100,560 ක රාජ්‍යභාග අයකර ගැනීමෙන් තොරව බලපත්‍ර කාලය දීර්ඝ කර දී තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 407 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 318 ක් විය. ඒ පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) කාර්යාංශයේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2009 වසරේ සිට උපදේශකවරයකුගේ සේවය ලබා ගන්නා අතර කාර්ය මණ්ඩලය අනුමත කර වසර 04 කට ආසන්නව පැවතුණද ඊට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ සේවකයන් 12 ක් ස්ථීර සේවයට බඳවා ගෙන තිබුණි.

(ii) කාර්යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරී කළමනාකරණ ශ්‍රිතයක් වන අධ්‍යක්ෂ(මූල්‍ය) තනතුර සාමාන්‍යාධිකාරී යටතට පත් කර තිබුණි.

(ආ) කාර්යාංශයට අනුබද්ධ සමාගමක් හරහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 92 ක් බඳවාගෙන තිබුණි. ඉන් සේවකයන් 60 ක් අතිරික්ත බඳවා ගැනීම් වූ අතර එම සේවකයන්ට වැටුප් හා දීමනා වශයෙන් මාසකට රු.1,939,995 ක් ගෙවා තිබුණි.

(i) කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගත් සේවකයන්ගේ තනතුරට අදාළ සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කරගෙන නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 315 ප්‍රකාරව වත්කම් භාරකාරිත්වයක් ඇති ගබඩා නිලධාරී තනතුර සඳහා විශ්‍රාමික නිලධාරියෙකු අමාත්‍ය මණ්ඩල අනුමැතිය රහිතව කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. ස්ථිර තනතුරට හිමි වැටුපට වඩා ඉහළ වැටුපක් වූ රු.53,004 ක් කොන්ත්‍රාත් නිලධාරියාට ගෙවීමද මතභේදයට තුඩුදී තිබුණි.

(iii) බඳවාගත් කොන්ත්‍රාත් සේවකයන් වෙනුවෙන් වැටුපෙන් සියයට 10 ක ආන්නිකයක් ද සමඟ සමාගමට වැටුප් ප්‍රතිපූරණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එසේ ගෙවා තිබූ මුදල රු.3,463,359 ක් විය. කාර්යාංශය සෘජුව සේවකයන් බඳවා ගත්තේ නම් එම මුදල ඉතිරි කරගත හැකිව තිබුණද ඒ පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත පිළිවෙලින් 12 ක් හා 92ක් බඳවාගෙන තිබියදී කාර්යාංශය, පුහුණුවන්නන් 148 ක්ද බඳවාගෙන ප්‍රාදේශීය කාර්යාලවලට උපරිමය 20 දක්වා වූ පුහුණුවන්නන් සංඛ්‍යාවක් යොදවා තිබුණි.

(ඈ) කාර්යාංශයේ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර මාස 5 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණද එම තනතුරට බඳවා ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) කාර්යාංශයේ භූ විද්‍යාඥයින් 8 ක් පුරප්පාඩුව පැවතියදී සේවයේ නියුතු විද්‍යාඥයින් දෙදෙනෙකු 2016 ඔක්තෝබර් 17 දින සිට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අතර මෙම නිලධාරීන්ට ගෙවූ රු.429,966 ක වැටුප් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ කාර්යාංශයේ නිලධාරීන් සිව්දෙනෙකු ගිවිසුම් ප්‍රකාර අනිවාර්ය සේවාකාලය සම්පූර්ණ කිරීමකින් තොරව සේවයෙන් ඉවත්වී තිබුණි. ගිවිසුම් කඩ කිරීම නිසා නිලධාරීන්ගෙන් අය කර ගත යුතු දණ්ඩන මුදල් සහ අනෙකුත් වියදම් රු.2,459,663 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩමේ සිදුකරන සංවර්ධනයන් හා ඉදිකිරීම්වල අයිතිය බදු කාලය අවසානයේ බදු දීමනාකරුට හිමිවන බවත් ඒ සම්බන්ධයෙන් කිසිදු දීමනාවක් ඉල්ලා සිටීමට බදු ගැණුම්කරුට අයිතියක් නොමැති බවත් ගිවිසුමේ සඳහන්ව තිබියදී කාර්යාංශය විසින් කල්බදු පදනම මත ලබාගෙන තිබූ වැරැල්ලවත්ත ඉඩමේ රු. 46,035,957 ක් වැය කර ගොඩනැගිලි 02 ක් ඉදිකර තිබුණි.

(ආ) ඉඩමේ අයිතිය පවරා ගැනීමෙන් තොරව 2014 වර්ෂයේම රු.4,040,144 ක් වැයකර අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය ඉදිකර තිබුණි. එහිදී සැලසුම් ප්‍රකාරව ඉදි කිරීම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා ලිපිගොනු අනාරක්ෂිතව පැවතීම යන අඩුපාඩු ද නිරීක්ෂණය විය.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2015 – 2017 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයේ දී යාවත්කාලීන කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක වන සෑම අංශයක් සඳහාම භෞතික හා මූල්‍ය කාර්යසාධන ඉලක්ක හා වගකීම් ලබාදෙමින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) කාර්යාංශයේ අංශ 11 ක හා ප්‍රාදේශීය කාර්යාල 14 හි කාර්යභාරය ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම්වල මුළු භෞතික ඉලක්ක දක්වා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයට අනුමත කර තිබූ නිලධාරීන් 4 දෙනෙකුගෙන් යුතු ස්ථීර සහායක විගණන කාර්ය මණ්ඩලය පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණක කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක තබා තිබුණි. මේ හේතුවෙන් අභ්‍යන්තර විගණකගේ බලතල සීමාවීමක් සිදුව තිබුණි.

(ආ) අභ්‍යන්තර විගණකගේ විගණනය පිළිබඳ වෘත්තිය දැනුම වර්ධනය කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 133(2) ප්‍රකාර කාර්යාංශයේ සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි විධිමත් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර භූ විද්‍යා අංශයේ ඒකක 03 ක් හා මානව සම්පත් අංශයේ ක්‍රියාකාරකම් 12 ක් විගණන සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර ඒවා විගණනයට ලක්කර නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ඉටුකළ යුතුව තිබූ භූ විද්‍යා අංශයට අදාල විගණන පරීක්ෂණ කාර්යයන් 12 ක් ඉටුකර නොතිබුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 මැයි මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 11 සිට සියයට 226 දක්වා හා අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 12 සිට සියයට 295 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

තවද ඇස්තමේන්තු කර නොතිබූ ආදායම් මූලාශ්‍ර 4 කින් රු.මිලියන 2.9 ක් උපයාගෙන තිබුණි, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,592,292 ක ශේෂයක් පැවති ආපදා අරමුදල අයවැය ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අතුළත්ව නොතිබුණි.

5.6 පරිසර හා සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිසරික හා සාමාජීය ගැටලු හේතුවෙන් මන්නාරම් දූපත තුළ වාණිජමය වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් නොකිරීමට කාර්යාංශය කටයුතු කර තිබුණ ද වාණිජමය නොවන වැලි කැණීම් බලපත්‍ර උපයෝගී කරගෙන සිදුකරන අනවසර වැලි කැණීම් බහුල වීමත් එවැනි කැණීම් නවතාලීම සඳහා කාර්යාංශය මැදිහත් නොවීමත් හේතුවෙන් කාර්යාංශය අපේක්ෂා කළ පරිදි ගැටලු පාලනය වීමක් සිදුව නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිලිකා වැලි කැණීම්වලින් අනතුරුව කැණීම් වලවල් වැසීමේදී ප්‍රදේශයේ භූගත ජල මට්ටම හා ජලයෙහි ගුණාත්මක බව රැක ගැනීම සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් කර තිබූ නිර්දේශ වලට පටහැනි ආකාරයෙන් කාර්යාංශය බලපත්‍ර නිකුත් කර තිබුණි.

(ඇ) බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන බණිජ ද්‍රව්‍ය ඉවත් කිරීම් හේතුවෙන් උග්‍ර පාරිසරික හා සමාජීය ගැටලු පැන නැඟී ඇති බව අනාවරණය වුවද එවැනි කැණීම් වළකාලීම සඳහා කාර්යාංශය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	පොත්පත් පවත්වා ගැනීමේ හා ගිණුම්කරණ දෝෂ මෙන්ම ගිණුම්කරණ ප්‍රමිති හා ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කර නොතිබීම.
(ආ) ගබඩා පාලනය	රසායනාගාරවල තොග ලැබීම්, නිකුත් කිරීම් හා සටහන් කිරීම් නිසි පරිදි සිදුකර නොතිබීම.
(ඇ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම	ක්ෂේත්‍ර පරීක්ෂණවලදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පිළිබඳ උපදෙස් නිකුත් නොකිරීම, දින පොත් භාවිතා නොකිරීම, මාසික කළ වැඩ වාර්තා හා ඉදිරි වැඩසටහන් ඉදිරිපත් නොකිරීම, ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු හා කොන්දේසි කඩවීම් ප්‍රාදේශීය කාර්යාල වලට වාර්තා නොකිරීම.

(ඇ) වැලි කැණීම් බලපත්‍ර අලුත්කිරීම	වැලි කැණීම් බලපත්‍ර අලුත්කිරීමේදී ප්‍රමාද ගාස්තු අය නොකිරීම, බලපත්‍ර අලුත්කිරීමේදී අවලංගුව පැවති කාලසීමා තුළ කැණීම් කටයුතු සිදුකර ඇතිද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් නොතිබීම, පාරිසරික නිර්දේශ, ප්‍රාදේශීය ලේකම් නිර්දේශ හා ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ලබා නොගැනීම.
(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වාණිජ නොවන බලපත්‍ර නිකුත් කිරීම	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට බලපත්‍ර පොත් නිකුත් කිරීම, එම කාර්යාල නිකුත් කළ පොත් හා මාසික සාරාංශ ලබා ගැනීම, අනුපිටපත් සුරක්ෂිතව තබා ගැනීම් යන කාර්යයන් ප්‍රමාණවත් අධීක්ෂණයක් යටතේ විධිමත්ව හා විශ්වාසදායී අයුරින් සිදුකර නොතිබීම.
(ඊ) කාර්ය මණ්ඩලය	කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම, බඳවා ගැනීම් පටිපාටි අනුමත කර ගැනීම හා පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු



2017.11.21

ඔබේ අංකය :- අයිඊඑන්/ඩී/ජීඑස්එම්බී/16/01

මගේ අංකය :- එෆ් එන්/ ඒකිවු/07

විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව හා සම්බන්ධ කාර්යාංශයේ පැහැදිලි කිරීම්.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ගිණුම් සකස් කරුණු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව වන අතර, ජී.එස්.එම්.බී ටෙක්නිකල් සර්විස් (පුද්) සමාගම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර ක්‍රමවේදය යටතේය. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව එය අදාල වන ආයතන සඳහා ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමක් සිදුනොවන නිසා ඊට අදාල ප්‍රමිතයන් නිකුත්ව නොමැත.

කාර්යාංශය 1992 අංක 33 දරණ පතල් හා බනිජ ද්‍රව්‍ය පනත මඟින් ස්ථාපිත ආයතනයක් බැවින්ද, ජී.එස්.එම්.බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම, සමාගම් පනත යටතේ ස්ථාපිත ආයතනයක් බැවින්ද එම ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් SLFRS අදාල කර ගත නොහැක.

තවද ඒකාබද්ධ ගිණුම් සකස්කිරීම සඳහා පරිපාලිත ආයතනයේ සිදුකරන ව්‍යාපාර කාර්යය භාරය සම්බන්ධව මව් ආයතනයට සෘජු පූර්ණ පාලන බලය (Existing Control Rights) හිමිව තිබිය යුතුය. එහෙත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට එය පිහිටවූ 1992 අංක 33 දරණ පතල් හා බනිජ ද්‍රව්‍ය පනත මඟින් ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම සම්බන්ධව හා එහි මෙහෙයුම් කාර්යය භාරය පිළිබඳව පූර්ණ පාලන බලයක් ලබාදී නැති අතර, එම සමාගම පාලනය වන්නේ භාණ්ඩාගාර නියෝජිතයකු ද ඇතුළත් වෙනම අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් වේ. මේ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමට අදාලව ඒකාබද්ධ ගිණුම් සැකසීමට නෛතික බලයක්, අදාල ප්‍රමිතයක් හෝ ප්‍රායෝගික තත්වයක් නොමැති බව කාර්යාංශයේ මතය වේ.

කෙසේ වෙතත් මෙම කරුණ සම්බන්ධව කාර්යාංශය ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත කමිටුවෙන් විමසීමට අදහස් කරන අතර, ඉන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදහස් කරන බව මෙයින් දන්වා සිටිමි.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01

(අ)(ෂ) (ස) විගණනය පෙන්වා ඇති පරිදි ඉදිරියේදී පාරිතෝෂික වෙන් කිරීම් අනාවරණය කිරීමේදී ජංගම වගකීම් සහ ජංගම නොවන වගකීම් ලෙසත් පෙන්නුම් කිරීමට සටහන් කර ගතිමු.

- මෙම මුදල් භූ කම්පන මාන කුළුණු වල හදිසි නඩත්තු කටයුතු සඳහා යොදා ගැනීමට අදාලව ලැබී

ඇති මුදල් වේ. මෙම වසරේ සිට මෙම මුදල් ජංගම නොවන වගකීම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු යොදා ඇත. මෙය 2018 ජනවාරි මස සිට ගිණුම් වල නිවැරදි කිරීමට සටහන් කර ගතිමු.

- විගණනය පෙන්වා දුන් පරිදි මෙය නිවැරදි කිරීමට සටහන් කර ගතිමු.

(iii) විගණනය දක්වා ඇති පරිදි 2017 වසරේ සිට ප්‍රාදේශීය කාර්යාල තොරතුරු අවසන් ගිණුම් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03

මේ වනවිට ගිණුම් වල නිවැරදි කිරීම් කිරීමට කටයුතු කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07

විගණනය දක්වා ඇති පරිදි ක්ෂය කිරීම් සිදුකිරීමට කටයුතු යොදා ඇත.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ - ආ) විගණනය පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී මුල්‍ය ප්‍රකාශනවල මෙම කරුණු අනාවරණය කිරීමට සටහන් කර ගතිමු.

(ඇ) විගණනය පෙන්වා දුන් පරිදි මෙය නිවැරදි කිරීමට සටහන් කර ගතිමු.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සිගිරිය ව්‍යාපෘතිය සඳහා සේවාදායකයා විසින් මිළදීගෙන තිබූ භාණ්ඩ කාර්යාංශයේ වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකර ඇත.

(ආ)(ඇ) කාර්යාංශය විසින් මිළදී ගෙන තිබූ ඔරුගොඩවත්ත ඉඩම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරා ගෙන ඇත. එහෙත් මේ සඳහා වෙනත් පර්චස් 80 ක ඉඩමක් බත්තරමුල්ලේ රොබට් ගුණවර්ධන මාවතෙන් ලැබුණි. මීට පෙර කාර්යාංශයට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලද පර්චස් 129 ක ඉඩමත් යන දෙකම පරිසර අමාත්‍යාංශයට පවරා ඒ වෙනුවට දැනට කාර්යාංශය පිහිටා තිබෙන එපිටමුල්ලේ ඉඩම සහ ගොඩනැගිල්ල කාර්යාංශයට ලබාගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. මෙයට අදාල ඔරුගොඩවත්ත ඉඩම ගිණුම් වලින් ඉවත්කර නව ඉඩම ගිණුම් ගත කිරීම සිදුකරණු ඇත.

(ඈ) නිවැරදි පාරිතෝෂික ප්‍රතිපාදන මුදලම ප්‍රතිපාදන ගිණුමට මාරු කිරීමට කටයුතු කරමු.

(ඉ) ඉදිරියේදී අදාල පාරිතෝෂික ගෙවිය යුතු මුළු මුදල නිදහස් කර ලබාගත යුතු මුදල් සඳහා ලදුපත් නිකුත් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ඊ) විගණනය දක්වා ඇති කරුණ පිළිබඳව කාර්යාංශය අවධානය යොමු කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමු.

(උ) විගණනය පෙන්වා ඇති පරිදි ඉදිරියේදී රඳවා ගැනීම් බදු ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමු.

(ඌ) ඉදිරියේදී රඳවා ගැනීමේ බදු ගිණුම් ගත කිරීමට කටයුතු කරමු.

(එ) ඇසිඩ් වැනි ද්‍රව්‍ය මිළදී ගත් පසු විද්‍යාගාරය වෙත නිකුත් කරනු ලැබේ. භෞතික ලෙස ආගණනය කිරීමද අපහසුය.

(ඒ) කාර්යාංශය වෙනුවෙන් කරන ලද වියදම් GSMB TS දැරිය යුතුව ඇත්තේ කාර්යාංශයේ ඒකඡතාවය මතය. කාර්යාංශයෙන් අයවිය යුතු බව දන්වා ඇති මුදල් කාර්යාංශය විසින් තක්සේරු වලට යොමුකර ඇති අතර, තක්සේරු මුදල ලද පසු ගෙවීම් සිදු කරනු ඇත.

(ඔ) මේ සම්බන්ධව කාර්යාංශය අවශ්‍ය පියවර ගත්තද මෙම ආයතන බොහොමයක් මේ වනවිට ලංකාවේ නොමැති බැවින් ඉදිරියේදී විගණනය දක්වා ඇති පරිදි බොල් ණය කිරීමට සටහන් කර ගතිමු.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

කාර්යාංශය විසින් විකිණීම සඳහා යොමු කරනුයේ කාර්යාංශය විසින් ප්‍රකාශනය කරනු ලබන සිතියම් හෝ පොත් පත් පමණි. එසේ නොමැතිව 2001 වර්ෂයේ කාර්යාංශයෙන් විකිණීම සඳහා පොත් හා සිතියම් මිළට ගෙන නොමැත.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මෙම මුදල් භූ කම්පන මාන කුළුණු වල හදිසි නඩත්තු කටයුතු සඳහා යොදා ගැනීමට අදාලව කැලිෆෝනියා විශ්ව විද්‍යාලයෙන් ලැබී ඇති මුදල් වේ. එබැවින් මෙම මුදල් මෙලෙස ගිණුම් වල පෙන්නුම් කිරීමට කටයුතු යොදා ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙය දේශීය ආදායම් දෙපර්තමේන්තුව මගින් හිලව්කල යුතු මෙම මුදල ඉදිරියේදී පොත් වලින් කපා හැරීමට කටයුතු කරමු.

(ආ) 2014 වර්ෂයේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයාගේ ලිඛිත උපදෙස් මත මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව මෙම මුදල සභාපති වෙත මුදා හැර ඇත. එහෙත් පැවති මැතිවරණයෙන් අනතුරුව සභාපතිතුමා ඉවත්ව ගිය බැවින් එම කාර්යයට අදාල සියළුම ලිපි ලේඛන ලැබී නොමැත. මේ පිළිබඳව සොයා බලා එම තොරතුරු ලබාගැනීමට පියවර ගන්නෙමු.

2.4 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ ප්‍රතිපාදන අනුව කාර්යාංශය වියදම් පියවාගත යුත්තේ උපයන ආදායමින්ය. එබැවින් සියළු රාජ්‍ය භාග මුදල් භාණ්ඩාගාරයට යැවිය යුතු නැත. කාර්යාංශයේ අතිරික්ත මුදල් වාර්ෂිකව මහා භාණ්ඩාගාරයට යවනු ලැබේ.

(ආ) වියදම් ලෙස ගත යුත්තේ අදායම් ඉපයීමට ඉවහල් වන මූල්‍ය ප්‍රමාණයන්ය.භාණ්ඩාගාර ප්‍රධානයන් වියදම් ලෙස ගත නොහැක. එබැවින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන මුදල් වියදමක් ලෙස සඳහන් කර නොහැක.

(ii) භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය සඳහා අනුමැතියක් අවශ්‍ය නොවේ. ස්ථාවර තැන්පතු සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇත.

(ඈ) පාරිතෝෂික පනතේ විධිවිධාන තුල මෙයට අවකාශ ඇති බවට කම්කරු කොමසාරිස් විසින් ලබාදී ඇති පැහැදිළි කිරීම් සලකා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙය අනුමත කර ඇති නිවැරදි ගෙවීමකි. එබැවින් වැඩිපුර ගෙවීමක් සිදුවී නොමැත.

(ඇ) (i) මේ වනවිට ආපදා ණය ගෙවනු ලබන්නේ මූලික වැටුප පදනම් කරගෙනය. උපරිම සීමාව කාර්යාංශයට අදාල නොවන බව මහා භාණ්ඩාගාරය දන්වා ඇත.

(ii) ආයතන සංග්‍රහයේ ××× 1.4.1 හි දක්වා ඇත්තේ රජයේ නිලධාරීන් සම්බන්ධවය. ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදයේ දක්වා ඇති අර්ථ නිරූපණයට අනුව ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයින් රාජ්‍ය නිලධාරීන්ගේ ගණයට අයත් නොවන බව කාර්යාංශයේ මතය වේ. කෙසේ වෙතත් එවැනි ගෙවීමක් පිළිබඳව ද කාර්යාංශය දැනුවත් නොමැත.

ඉ) (i) මේ වනවිට වාහන අනතුරු සම්බන්ධව රක්ෂණ මුදල් ලබාගැනීමට කටයුතු කර ඇති අතර පොලිස් වාර්තා ලැබීමෙන් අනතුරුව මුදල් රෙගුලාසි අනුව කටයුතු කරනු ලැබේ.

(ii) මෙය ප්‍රාදේශීය කාර්යාල සඳහා ලබාදී ඇති අග්‍රිම වේ. ප්‍රාදේශීය කාර්යාල පිහිටා තිබෙනුයේ දුරබැහැර ප්‍රදේශ වලය. එබැවින් දෙසැම්බර් 31 දිනට ගිණුම් අවසන් කිරීමට ඒවා ආපසු දී නැවත ලබාගැනීමට සිදුවුවහොත් එම කාර්යාල වසරේ මුල් දින කිහිපය ක්‍රියාත්මක නොවනු ඇත. කෙසේ වෙතත් වාර්ෂික වියදම් සාරාංශ ගිණුම් සඳහා ගනු ලැබේ.

(iii) මේ සම්බන්ධව අදාල පුද්ගලයින් සඳහා ලිපි යවා ඇති නමුදු පිළිතුරු නොලැබුණු හෙයින් ඉදිරියේදී මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කරනු ඇත.

(iv) මේ වනවිට මෙම වාර්තා ලබාදී ඇත.

(ඒ)ඉදිරි කෙටුම්පත් වාර්ෂික වාර්තාවේදී විගණන කළමණාකරන කමිටු වාර්තා ඇතුළත් කිරීමට කටයුතු කරමු.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

කාර්යාංශයේ බදු පෙර ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සැසඳීමේදී රු. 526,933,317/- කින් වැඩිවූ අතර, ඒ සඳහා රාජ්‍ය භාගය, බලපත්‍ර ආදායම, පරීක්ෂණ ගාස්තු සහ පරීක්ෂණාගාර ආදායම් වැඩිවීම සහ සේවක මහත්ම මහත්මීන්ගේ දැඩි කැපවීම සහ කාර්ය සාධනය මත දිරි දීමනා ගෙවීම හේතුවෙන් ද මෙසේ ආදායම වර්ධනය විය.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

විගණනය දක්වා ඇති පරිදි ඉදිරියේදී නඩු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට සටහන් කර ගනිමු.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) බනිජ සම්පත් හඳුනාගැනීම, සමීක්ෂණය කිරීමට අදාලව අමාත්‍යාංශ ලේකම්වරයා සමඟ තීන්දු තිරණ ගත් අතර එය 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරව බනිජ ආයෝජනය කිරීම සම්බන්ධව ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයාට උපදෙස් ලබාදීමට කටයුතු කරන ලදී.

(ආ)(i) මේ වනවිට අදාල කාර්ය සාධන වාර්තා සකස් කර ඇත. ඒ අනුව 2016 වාර්ෂික වාර්තාවේ ද ඇතුළත් කර ඇත.

(ii) කාර්යාංශයේ භූ විද්‍යාඥයින්ගේ හිඟය නිසා 2015 වසරේ බණිජ අත්පොත සඳහා අනුයුක්ත කර සිටි නිලධාරියා වෙනත් ප්‍රමුඛ කටයුතු සඳහා යෙදවීමට සිදුවූ නිසාත් එම අත්පොත සඳහා විවිධ ආයතන වලින් ලබාදිය යුතු දත්ත ලැබීමේදී සිදුවූ ප්‍රමාදය නිසාත් පොත මුද්‍රණය ප්‍රමාද විය. කෙසේ වෙතත් මේ වනවිට බණිජ අත්පොත මුද්‍රණය කිරීමට යොමු කර ඇත.

4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) කොළඹ වරාය නගරය ඉදිකිරීමට අදාලව නිකුත් කර තිබූ බලපත්‍රයට අදාලව කැණීම් කල මුහුදු වැලි සඳහා කාර්යාංශයට ලැබිය යුතු රාජ්‍ය භාග මුදල් පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබුනේ 2016 වර්ෂයේ ගිණුම් අවසන් කිරීමෙන් පසුව බැවින් මෙය සිදුව ඇත.

(ආ) කාර්යාංශය 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනතට පටහැනිව බලපත්‍ර අලුත් කර නොමැත. එහෙත් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයකට අනුව බලපත්‍ර අලුත්කිරීමක් සිදුකර ඇත. කෙසේ වෙතත් විගණනය දන්වා ඇති මෙම කරුණ සම්බන්ධව තවදුරටත් සොයා බැලීම සඳහා කටයුතු කරන්නෙමු.

(ඇ) පතල් හා බනිජ ද්‍රව්‍ය පනතට අනුව කාර්යාංශය ආරම්භක දිනයේ සිට මේ දක්වා සේවක අර්ථ සාධක අරමුදලට දායක කරනු ලැබුවේ සේවකයාගෙන් 10% හා සේව්‍යයාගෙන් 12% ක් ලෙසය. මෙහි නීතිමය තත්වය කම්කරු කොමසාරිස්ගෙන් විමසීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

(ඈ) මෙම ගෙවීම් සිදුකරනු ලැබුවේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම මත සහ කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මතය. මෙම සියළු කටයුතු පරිසර අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් කරුණු බව පෙනී යයි.

(ඉ) මේ වනවිට නීති විරෝධී කැණීම් පාලනය කිරීම සඳහා විශේෂ කාර්යය බලකායේ නිලධාරීන්ගෙන් සමන්විත වැටලීම් ඒකකයක් කාර්යාංශය තුළ ස්ථාපිත කර ඇත.

(ඊ) කාර්යාංශයේ සේවක සංඛ්‍යා ව්‍යුහය සංශෝධනය කිරීමෙන් පසු නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීමට නොහැකි වීම මත අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට නොහැකිවීම හේතුකොට ගෙන මෙම තත්වය උද්ගත වී ඇත. සේවක බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ පසු අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම තුළින් මෙම ගැටළු නිරාකරණය වනු ඇත.

(උ) අදාල ප්‍රතියාන්ත්‍රණය කිරීමේ මෘදුකාංග වර්තමානයේ තවදුරටත් සංවර්ධනය වී ඇති නිසාත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වූයේ වර්තමානයට ගැලපෙන ලෙස යොමු කිරීමේ අනුදේශ (TOR) නැවත සකසා නැවතත් ටෙන්ඩර් කැඳවීම යෝග්‍ය බවය. ඒ අනුව කාර්යාංශය මේ වනවිට කටයුතු සිදුකරමින් පවතී.

(උ) බනිජ ගවේෂණය යනු නිධියක ප්‍රමාණය නීර්ණය කිරීම සහ එහි වටිනාකම නීර්ණය කිරීම වේ. මේ සඳහා නිකුත් කරනු ලබන ගවේෂණ බලපත්‍ර යටතේ සිදුකරණ ගවේෂණ කටයුතු වලින් පසු වාණිජමය වශයෙන් වටිනාකමින් යුත් බණිජ නිධි හඳුනාගැනීමෙන් පසු එම බනිජ කැණීම සඳහා ඉල්ලුම් කරනු ලැබේ. ගවේෂණ බලපත්‍රලාභියා ඔහු විසින් අපේක්ෂිත නිෂ්පාදන ඉලක්කයන් සහ සෘජුවම කැනීමට අපේක්ෂිත බණිජ නිධියත් ගවේෂණයේදී හඳුනාගැනීමෙන් පසු පමණක් කැනීම් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබයි. එසේ නොමැති අවස්ථා වලදී ගවේෂණය අත්හරිනු ලබයි.

(ඒ) පනත හා රෙගුලාසි වල සඳහන් පරිදි අයදුම්පත් භාර ගැනීමට හා රාජ්‍ය භාග අත්තිකාරම් අයකිරීම සිදුවේ. පනතේ 34 වගන්තිය ප්‍රකාරව අයදුම්පත සමඟ බලපත්‍ර ගාස්තු අයකෙරේ. එහෙත් බලපත්‍ර නිකුත් කිරීම සිදුනොකරණ අවස්ථාවල බලපත්‍ර ගාස්තු හා රාජ්‍ය භාග අත්තිකාරම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇත.

(ඒ) බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසි වලට අනුව රාජ්‍ය භාග ගෙවීම පැහැර හැරීම තුළින් වන පාඩුව මගහැරීම සඳහා රාජ්‍ය භාග අත්තිකාරම් අයකරනු ලැබේ. තවද මේ වනවිට කාර්යාංශය පවත්වාගෙන යනු ලබන මුදල් අත්තිකාරම් ශේෂය අඩුකිරීමට ක්‍රමවේදයක් සැකසීම සඳහා අවධානය යොමු කර ඇත.

(ඔ) කූඨ ලේඛණ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධව විෂමාචාර ක්‍රියා

(i) - (v) දක්වා කරුණු වලට අදාලව නැවත පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා කමිටුවක් පත්කිරීමට කටයුතු කරමි.

(ඕ) මේ වනවිට බලපත්‍රලාභීන්ගේ බොහොමයක් කාර්යාංශය විසින් සෑහීමකට පත්වන ලෙස භූමිය පුනරුත්තාපන කටයුතු සිදුකර ඇත. එසේ පුනරුත්තාපනය කරන ලද වලවල් අධීක්ෂණය කිරීමෙන් අනතුරුව වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු බැංකු ඇපකර මුදාහරිනු ලැබේ. පුනරුත්තාපනය නොකරන ලද බලපත්‍රලාභීන්ට නීතිමය පියවර ගැනීමට මේ වනවිට කටයුතු සිදුකර ඇත.

(ක) උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා කැණීම් බලපත්‍ර නිකුත් කිරීම වෙඩි පිපිරවීමේදී සම්මතය ලෙස භාවිතා කරනු ලබන, පරිසර අධිකාරිය මඟින් නිකුත් කරන ලද තාවකාලික සම්මතයන් (Interim Standard)ට අදාලව නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. එහෙත් එහිදි භූගත කැණීම් හා පොළොව මතුපිට කැණීම් යන සියළුම කැණීම් සඳහා එකම පරාමිතින් ලබා දී ඇත. එකී පරාමිතින්හි පවතින තාක්ෂණික දෝෂකාරී තත්ත්වය පිළිබඳව කාර්යාංශය විසින් හඳුනාගැනීමෙන් අනතුරුව ඒ සඳහා සුදුසු පරාමිතින් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුව ඇත. තවද ජාත්‍යන්තර මට්ටමේ වෙඩි පිපිරවීමකදී භූකම්පනයට අදාල පරාමිතින් තීරණය කරනු ලබන්නේ අදාල අවස්ථාවේ පිපිරුම් සංඛ්‍යාතය මූලික කරගෙන වන අතර පරීක්ෂා කරනු ලබන අවස්ථාවේදී පිපිරුම් සංඛ්‍යාතය හා භූකම්පනය යන දෙකම එක සේ වැදගත් වුවත් පරිසර අධිකාරියේ පරාමිතින්ට අනුව එය එසේ මිනුම් සිදු කරන්නේ නැත. මේ සමඟ අමුණා ඇති ජාත්‍යන්තර සම්මතයන්ට අදාල තොරතුරු පරිශීලනයේදී සංඛ්‍යාතය හා කම්පනය අතර පවතින සබඳතාවය හඳුනාගත හැකිය.

අදාල ව්‍යාපෘතියේ භූගත පිපිරුම් සිදු කිරීමේදී දීර්ඝ ප්‍රමාද කිරීම් (Long Delay) ක්‍රමවේදය මඟින් පිපිරුම් සිදු කරන ලද අතර එහිදී එක් පිපිරුමකදී අනුයාත කම්පන එකට වඩා වැඩි ප්‍රමාණයක් එනම්, කම්පන දහයක් පමණ නිරීක්ෂණය වන අතර නිරීක්ෂණ වාර්තාවන්හි එයින් වඩා වැඩි අගයක් ගන්නා කම්පන හතරක් පමණක් සඳහන් කර ඇත. එහෙත් ඉදිකිරීමකට භූකම්පනයන් පිළිබඳව සන්නිවේදනය දැනෙනුයේ ඉහත කී සියළුම කම්පනයන් වල සම්ප්‍රයුක්තයක් ලෙස බැවින් එවිට අවසන් සංවේදීතාවය වඩා අඩු අගයක් ගනී.

පරීක්ෂණ පිපිරුමක් සිදු කිරීමේදී එහි අරමුණ වන්නේ වෙඩි පිපිරවීම් පරාමිතින් පිළිබඳව තීරණය කිරීමත් ආසන්නතම ඉදිකිරීම් සඳහා ඒවායින් වන හානිය මැනීමත් වන බැවින් එහිදී නව පරාමිතින් යොදා ගනිමින් පරීක්ෂා කිරීම සාමාන්‍ය තත්ත්වයකි. එම නව පරාමිතීන්ට අනුව වෙඩි පිපිරවීම් සිදු කිරීමට සුදුසු තත්ත්වයන් පවතින්නේ නම් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙනු ලැබේ.

මෙම පරීක්ෂණ දත්තවලට අනුව වඩා වැඩි වාර ගණනක් අනුමත සීමාව ඉක්මවා ඇත්තේ වාතයේ අධිපීඩන තත්ත්වය (Air Blast Over Pressure) වන අතර එය සෘජු ලෙසම ඉදිකිරීම් සඳහා හානිදායක තත්ත්වයක් පෙන්නුම් නොකරයි. වාතයේ අධිපීඩන තත්ත්වයේ බලපෑම ඇති වන්නේ නිවැසියන්ට වන අතර සෑම වෙඩි පිපිරවීමකදීම නිවැසියන් තම නිවෙස් වලින් ඉවත්ව ආරක්ෂාකාරී ස්ථාන කරා ගමන් කරවන බැවින් එහිදී සිදුවන හානිය අවම මට්ටමකට පත්වේ.

උමා ඔය ව්‍යාපෘතියට අදාලව සිදු කරන ලද පිපිරුම් වලින් උමගේ සිදුකල පිපිරුම් 2091 ක් පරීක්ෂා කර තොරතුරු වාර්තා කර ඇත. එයින් භූකම්පන 14 සිට 20 දක්වා පරාසය ඉක්වා ඇත්තේ එක් අවස්ථාවකදී පමණි. එය ප්‍රතිශතයක් ලෙස 0.05%කි. 10 සිට 14 දක්වා සීමාව තුල ඉක්මවීම් ගණන 17කි. එය ප්‍රතිශතයක් ලෙස 0.81% කි. වේල්ලක් ඉදිකිරීමට අදාලව සිදු කරන ලද පිපිරුම් පිළිබඳ කරන ලද තොරතුරු පරීක්ෂා කිරීමේදී සිදු කරනු ලැබූ පිපිරුම් 1827කින් භූකම්පන තුනක් පමණක් සම්මත සීමාවන් ඉක්මවා ගොස් ඇති අතර එය 0.16% කි. එහිදී වඩා වැඩි ප්‍රමාණයක් සම්මත සීමාවන් ඉක්මවා ගොස් ඇත්තේ වාතයේ අධි පීඩනයයි. එයද 7.17% කි.

වෙඩි පිපිරුම් ක්‍රියාවලියේදී සිදු කරනු ලබන වලවල් ප්‍රමාණය අඩු කිරීම මඟින් පමණක් භූකම්පන (Ground Vibration) හා වාතයේ අධිපීඩන තත්ත්වය (Air Blast Over Pressure) අඩු කල නොහැකිය. එසේ අඩු කිරීම සමහර අවස්ථාවලදී භූකම්පන (Ground Vibration) හා වාතයේ අධිපීඩන තත්ත්වය (Air Blast Over Pressure) වැඩි වීමට බලපානු ඇත. එබැවින් එවැනි තත්ත්වයන් සැලකිල්ලට ගෙන අදාල කටයුතු සිදු කර ඇති බවද, ඔබ වෙත සඳහන් කරමි. එහිදී විශේෂයෙන් Cut Hole වෙඩි පිපිරවීමකදී වලවල් ගණන අඩු කිරීම පැහැදිලිව භූකම්පන (Ground Vibration) වැඩි වීමට හේතු වේ.

තවද, වෙඩි පිපිරුම් ක්‍රියාවලියේ භූ කම්පන මට්ටම හා වාතයේ අවපීඩනය වෙනස් වීම සඳහා පිපිරුම් කරණු ලබන වලවල් ගණන මෙන්ම, Powder Factor අගයද, අනෙකුත් තාක්ෂණික කාරණා බොහොමයක්ද බලපානු ලැබේ.

එසේම අප කාර්යාංශය මෙම ව්‍යාපෘතියේදී ඇති විය හැකි හානිය අවම කිරීම උදෙසා පුර්ණ කාලීනව කණ්ඩායමක් නිරීක්ෂණය කිරීමට යොදවා ඇති බැවින් ඉහත තොරතුරු වඩා වගකීමකින් යුතුව ලබා ගත හැකි වූ අතර සිදු විය යුතුව තිබූ හානිය අවම මට්ටමකට ගෙන ඒමට හැකි වීම, මෙම වාර්තා පදනම් කරගෙන දිනපතා වෙඩි පිපිරවීමේදී ලබා ගත් අගයන් සැලකිල්ලට භාජනය කල බැවින් ඒ අනුව සුදුසු තාක්ෂණික වෙනස්කම් කරමින් කටයුතු කිරීම නිසා තත්ත්වය වඩා යහපත් කර ගත හැකි වීය.

වෙඩි පිපිරවීමේදී නියමිත පරාමිතින් ඉක්මවා පිපිරුම් කටයුතු සිදු කරන බව මෙම කාර්යාලයට වාර්තා වූ පසු අදාල ආයතන වල නිලධාරීන් ගෙන්වා විශේෂ සාකච්ජාවක්ද සිදු කර පළමු පියවර ලෙස ඔවුන්ට උපදෙස් ලබා දී අවවාද කරන ලදී.

මේ වන විට උමා ඔය ව්‍යාපෘතියට අදාල කැණීම් ප්‍රදේශය ආශ්‍රිත ගම්මානයන්හි බොහෝ නිවාස ඉරි තැලීම් හා පිපිරුම් වලට ලක් වී ඇති අතර, ඒවා වෙඩි පිපිරවීම් වලින් සිදු වූ ඒවාද, එසේත් නැත්නම් උමගේ මේ වන විටත් සිදුවන ජල කාන්දුව හේතුවෙන් ද යන්න පිළිබඳව ඉතා විස්තරාත්මක පරීක්ෂණයක් සිදු කල තොරතුරු තහවුරු කර ගත යුතුය.

(ග) දිරි දීමනා ගෙවීම්.

(i) දිරි දීමනා ලබාදීම 1996 අගෝස්තු මස 02 දින භාණ්ඩාගාර ලිපි අංක PE1/000/6 (Incentive) ලබාදී ඇති අනුමැතියට අනුව කාර්යාංශය මෙම දිරි දීමනා ගෙවීම ක්‍රමවත්ව සිදුකර ඇත. තවද ගෙවීම් ක්‍රමවේදය කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකර ඇත.

(ii) දිරි දීමනා සඳහා අදල කරගනු ලබන ශුද්ධ ඉපයීම් මුදල රු. 144,326,648/- කි. එම මුදලින් 50% වන රු. 72,163,324 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලය තිරණයට අනුව දිරි දීමනා සඳහා ලබාදී ඇත.

(iii) පොදුවේ සේවක දිරි දීමනාවල විචලන මට්ටම අඩු කිරීම සඳහාත් යම් අවම මට්ටමකට ගෙන ඒම සිදුවේ. අංශ ප්‍රධානීන්ගේ අභිමතය එක් නිර්ණායකයක් පමණක් වන අතර, ඊට ඉහළ මට්ටමේදී ද ඇගයීම නැවත සංශෝධනය වේ. අංශ ප්‍රධානීන්ගෙන් වියහැකි දුර්වලතා මගහැරීමක් මෙමඟින් සිදුවේ.

(iv) විගණනය පෙන්වා දෙන කරුණ වඩාත් ප්‍රායෝගික වන්නේ කර්මාන්තශාලාවකට වන අතර, එහිදී නිෂ්පාදනය අනුව ඉලක්ක සම්පූර්ණ කිරීමේ හැකියාව පවතී. එහෙත් කාර්යාංශය පනත හා රෙගුලාසි අනුව කටයුතු කරනු ලබන ආයතනයක් වන බැවින්, පාරිභෝගිකයන් දෙනු ලබන සමහර වැඩ අනුව බෙදීයාමක් සිදුවේ. ඒ අනුව සමහර කාර්යයන්ට අදාලව ඉලක්ක ලබාදිය නොහැක. කෙසේ වෙතත් අංශ ප්‍රධානීන් මඟින් ඒ ඒ අංශ වල සේවකයින් ඇගයීමකට ලක්වන අතර, අදාල ඉලක්ක කරා ලගාවී ඇතිද යන්න ඒ ඒ අංශ ප්‍රධානීන් දැනුවත්වේ.

තවද සේවකයින්ට හිමි නිවාඩු ලබාගැනීම මත දිරි දීමනා අඩුකිරීම සාධාරණය නොවේ. එබැවින් නිවාඩු මත විශාල බර තැබීමක් සිදුකළ නොහැක. තවද එමගින් ක්ෂේත්‍ර වල සිටින නිලධාරීන්ට වඩාත් වාසිදායක තත්වයක්ද උදාවේ. කෙසේවුවද නිවාඩු සඳහා යම් බර තැබීමක් සිදුවේ.

(v) කාර්යාංශයේ සේවක මහත්ම මහත්මීන්ට ගෙවනු ලබන දිරිදීමනා මුදලින් මෙම මුදල් අඩුකර ආපදා රෝගී අරමුදලට ලබාදේ. මෙම අරමුදල පවත්වාගෙන යනු ලබනුයේ රජයේ අරමුදල් වලින් නොවේ. ඉතා අසාධ්‍ය තත්වයන්ට පත්ව අසරණ වන සේවකයින්ට අසාධ්‍ය රෝගී තත්වයන්හිදී පිහිටවීම මෙහි අරමුණ වේ. වකුගඩු බද්ධ කිරීමට ලක්වූ සේවකයින් දෙදෙනෙකුට මෑතකදී පිහිට වීමට අවස්ථාව ලැබුණි. මෙය රජයේ මුදල් යොදා සිදුනොකරන බැවින් භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු නොමැති අතර, මෙය ගිණුම් වල දැක්විය යුත්තක් ද නොවේ. ඉදිරියේදී එය සුභසාධන කටයුතු ලෙස වෙනම ගිණුම් වලට පරිභාහිරව කටයුතු කිරීමට පියවර ගන්නෙමු.

(vi) දිරි දීමනා ගෙවීමේ ආරම්භක වර්ෂයේ සිට පසුගිය වසර දක්වා සෘජු වියදම් හා පොදු කාර්ය වියදම් ලෙස ආදායමෙන් 15%ක් සළකනු ලැබීය. එහෙත් ඊට අදාල නිශ්චිත පදනමක් නොවූ බැවින් ඒ සම්බන්ධව නිර්දේශ කිරීමට කමිටුවක් පත්කරන ලදී. එම කමිටු තීරණය වී තිබුනේ සෘජු වියදම් හා පොදු කාර්ය වියදම් ලෙස ආදායමෙන් අවමය 10% ක් අඩුකරන ලෙසයි.

(ජ) අදාල විගණන විමසුම් සඳහා මේ වනවිට පිළිතුරු සපයා ඇත.

4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(i) 2009 අංක 66 දරණ පනිතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍ය පනත හා ඒ යටතේ සාදන ලද බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග වලට අනුව නිකුත් කරන ලද බනිජ ගවේෂණ බලපත්‍රය යටතේ බනිජ ගවේෂණ කටයුතු වලින් පසු අදාල සමාගම විසින් 2010 වර්ෂයේදී බනිජ කැනීම් බලපත්‍ර සඳහා අයදුම්කර ඇත. එහෙත් අදාල සමාගම විසින් ඉදිරිපත් කර තිබූ ගවේෂණ වාර්තාව බනිජ නිධි තක්සේරුව, ප්‍රතිසංස්කරණ සැලැස්ම, කැනීම් සැලැස්ම හා මූලික පාරිසරික පිරිවිතර වාර්තාවල සඳහන් කරුණු පදනම් කරගෙන පවතින බනිජ ප්‍රතිපත්තියට අනුව වටිනාකම එකතුකිරීම පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීමෙන් පසු ඒ සඳහා කැනීම් බලපත්‍ර නිකුත් කර ඇත.

(ii) 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍යය පනත හා ඒ යටතේ සාදන බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග වලට අනුව, බණිජ ගවේෂණ බලපත්‍ර නිකුත් කරනු ලැබේ. ගවේෂණයේදී ප්‍රමාණවත් නිධි හඳුනාගැනීමක් සිදුකරන හෝ තවදුරටත් ගවේෂණ මඟින් බනිජ නිධි හඳුනාගත යුතු බැවින් ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසි වලට අනුව දීර්ඝ කර ඇත. කැනීම් සඳහා බලපත්‍ර ඉදිරිපත් කළ යුත්තේ කැනීම් කිරීමට ප්‍රමාණවත් නිධි බනිජ ගවේෂණයේදී හඳුනාගැනීමෙන් පසු පමණි.

(iii) 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා බනිජ ද්‍රව්‍යය පනතේ 28 1 යටතේ සාදන ලද බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග වලට අනුව අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කැනීම්

සැලැස්ම, ප්‍රතිසංස්කරණ සැලැස්ම හා ගවේෂණ වාර්තාව පදනම් කරගෙන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාට කාර්මික කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සහ තීරණ ගැනීමේ බලතල පවතී. ඒ අනුව බලපත්‍රය වර්ෂ කිහිපයකට වලංගු වන පරිදි නිකුත් කර ඇත.

(iv) කැනීම් බලපත්‍ර නිකුත් කිරීම තුලින් පමණක් කැනීම් ආරම්භ කිරීම සිදුකල නොහැකි අතර, කැනීම් කටයුතු වලට අවශ්‍ය පිරිවිතර හා කැනීම් භූමිය සැලසුම් කිරීමට කාලයක් ගතවේ. කෙසේ වෙතත් කාර්යාංශය විසින් කැනීම් කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය පිළිබඳ වාර්තා ලබාගෙන ඇත.

(iv) මෙම පෞද්ගලික සමාගම ලංකා ඛනිජ වැලි සමාගම විසින් සිදුකරන පිරිසැකසුම් කටයුතු වලින් ඉවත් කරන වැලි ටෙන්ඩර් මඟින් ලබාගැනීමෙන් පසු ඔවුන්ගේ කර්මාන්තශාලා තුල නැවත සිදුකරන පිරිපහදු වලින් පසු ඛනිජ අපනයනය කරනු ලැබේ. 1992 අංක 33 දරන පනතේ 2 ආ වගන්තිය ප්‍රකාරව ඛනිජවල අපනයනය රජය සතු වීම මත අයකරන රාජ්‍ය භාගය ඛනිජයේ වටිනාකමට පමණක් අයකරනු ලැබේ. ලංකා ඛනිජ වැලි සමාගම විසින් මෙම පෞද්ගලික සමාගම වෙත ඛනිජ අලෙවිකරන අවස්ථාවේ එම දේශීය වටිනාකමින් පනත හා රෙගුලසි වලට අනුගතව 6% රාජ්‍ය භාගය ගෙවනු ලැබේ. ඉන්පසු ගැනුම්කරුවන් පෞද්ගලික සමාගම විසින් පිරිසැකසුම් කිරීමෙන් පසු අපනයනයේදී නැව් ගාස්තු හැර වටිනාකමින් රාජ්‍ය භාගය 7% කාර්යාංශය විසින් අයකරනු ලැබේ. විගණනය පෙන්වා දී ඇති පරිදි ත්‍රඩී අගය සාවද්‍ය ලෙස පෙන්වා ඇතිද යන්න පරීක්ෂාකර බැලීම සඳහා අදාල වාර්තා එම සමාගමෙන් ලබා ගැනීමට දැනටමත් ලිපි යවා ඇත.

(vi) ලංකා ඛනිජ වැලි සමාගම සතුව ඛනිජ වැලි කැනීම් බලපත්‍ර 03 ක් පවතී. එනම් පුල්මුඩේ, තෙවික්කාලු හා පුදුවනක්කු වේ. මෙම කැනීම් බලපත්‍ර යටතේ මනිනු ලබන සියලුම ඛනිජ වැලි පිරිසැකසුම් කරනු ලබන්නේ පුල්මුඩේ පිරිසැකසුම් ස්ථානයේය. ලංකා ඛනිජ වැලි සමාගම විසින් ඛනිජ වැලි ටෙන්ඩර් දැමීමේදී එක් එක් කැනිම් ස්ථානයේ ඒවා වෙන වෙනම ටෙන්ඩර් නොදමයි. මෙම කරුණ මත එම සමාගම සතු බලපත්‍ර 3 සඳහා වෙළඳ බලපත්‍ර ඇතුළත් කළ යුතුය. ඒ සම්බන්ධව අතපසු වීමක් සිදුවි නම් ඒ සඳහා නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. තවද තෙවික්කාලු ස්ථානයේ සුළු කැනීමක් සිදුකර ඇති මුත් මාර්ගයේ පැවති ගැටළු නිසා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු කැනීම් ආරම්භ කිරීමට නොහැකි වී ඇති බවට කාර්යය නියුතු තාක්ෂණික නිලධාරියකු වාර්තා කර ඇත.

(ආ) සිලිකා වැලි කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම

(i) පුත්තලම දිස්ත්‍රික්කයේ සිලිකා වැලි නිධි ගවේෂණය සම්බන්ධව කාර්යාංශය විසින් සිදු කරන ලද වාර්තාව කාර්යාංශයේ පුත්තකාලයේ පවතී. ඊට අමතරව කාර්යාංශයේ භූ විද්‍යා අංශය විසින් අදාල සමාගම් විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව සිලිකා වැලි නිධි හඳුනා ගැනීම් සිදුකර ඇත.

(ii) කැනීම් බලපතු යටතේ ගවේෂණ හා කැනීම් යන තත්කාර්යයන් සඳහා බලය හිමිවන බැවින් හා යාබද ඇති මනිණු ලබන වලවල් පරීක්ෂා කිරීමෙන් අනතුරුව භූගත ඛනිජ ව්‍යාපෘතිය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී පැහැදිළි අවබෝධයක් ලැබෙන බැවින් හඳුනාගත් ඛනිජ භූමියේ ඇති ඛනිජ ගැඹුර පිළිබඳ ගවේෂණයක් කිරීම අවශ්‍ය නොවේ.

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ලේකම් වෙත කර ඇති ඉල්ලීමක් මත බලශක්ති හා පරිසර නීතිය පිළිබඳව වන ජ්‍යෙෂ්ඨතර සමුළුව සඳහා ශ්‍රී ලංකා අධිකරණයේ විනිශ්චයකාරවරුන් දෙදෙනෙකු පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ඉල්ලීම මත පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යාංශයෙන් කරන ලද ඉල්ලීමක් මත මෙම ගෙවීම් සිදුකර ඇත.

4.4 හඳුනාගන්නා ලද පාඩු

(අ) මේ කරුණ සම්බන්ධව සොයා බැලීම සඳහා 2015 ඔක්තෝබර් 13 දින තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවකට වෙත යොමු කල අතර, එහිදී අනාවරණය වූයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙම භාණ්ඩ ලබාගෙන නොමැති බවයි. මෙය අංකනය කිරීම සඳහා විදේශයකට යවන ලද භාණ්ඩයක් නැවත පැමිණීමේදී ගබඩා ලේඛණවල නැවත සඳහන් වීමක්වේ.

(ආ) 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා බනිජ ද්‍රව්‍ය පනතේ 35 හා 44 වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු හා රාජ්‍ය භාගය සෑම බලපත්‍රලාභියකු විසින්ම ගෙවිය යුතුය. එහෙත් කාර්යාංශයට ඉදිරිපත් කර තිබූ ගැසට් පත්‍රයට අනුව කාර්යාංශය විසින් ගාස්තු අයකිරීමකින් තොරව ශ්‍රී ලංකා වරාය අධිකාරියට මෙම බලපත්‍රය නිකුත් කර ඇත. මේ පිළිබඳව යම් අයකිරීමක් සිදුකරගත යුතු නම් ඒ සම්බන්ධව ගතයුතු නීතිමය තත්වය පිළිබඳ කාර්යාංශය අවධානය යොමු කරනු ඇත.

(ඇ) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

(i) 1992 අංක 33 දරණ පතල් හා බනිජ ද්‍රව්‍ය පනතට අනුව රාජ්‍ය භාග මුදල් අයකර ගත යුත්තේ කැනීම් කරනු ලබන ප්‍රමාණයටය. කැනීම් බලපත්‍ර ලබාදුන් නමුදු කැනීම් නොකරන ලද ප්‍රමාණය සඳහා රාජ්‍ය භාගය අයකර ගත නොහැක.

(ii) යාන් ඔය ව්‍යාපෘතිය යටතේ ජලයෙන් යටවීමට නියමිත භූමියේ තිබූ වැලි නිධිය ජලය පිරවීමට පෙර ඉවත් කරගත යුතු බවට කාර්යාංශයට උපදෙස් ලබාදී තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතියට අදාල භූමියේ පැවති වැලි නිධිය වෙළඳ පොලේ පැවති ගංගා වැලි වල හිඟය පියවීම සඳහා සහ වැලි මිල අඩුකිරීම සඳහා යොදා ගැනීමක් වේ. එමෙන්ම යාන් ඔයට ජලය පිරවීමට පෙර වැලි ඉවත් කිරීමට සිදුවීමත් නිසා වැලි නිධිය ගවේෂණය කර තක්සේරු කිරීමට සෑහෙන කාලය ගතවන බැවින්, සෙසු ආයතනවලද අවසරය මත තක්සේරු කිරීමකින් තොරව වැලි කැණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදු කරන ලදි.

(iii) මෙම වැලි නිධිය යාන් ඔය ව්‍යාපෘතියේ අතුරුඵලයක් ලෙස ඉවත් කිරීමට සිදුවිය. මෙය ව්‍යාපෘති භූමියේ අදාල ව්‍යාපෘතියට අවහිර වන වැලි තට්ටුව ඉවත් කිරීමක් වන බැවින්ද මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඉදිවන්නක් බැවින්ද භූමියේ හිමිකාරිත්වය වාර්මාර්ග දෙපාර්තමේන්තුව සතු බව තහවුරු වුනි. ඒ අනුව වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ අවසරය මත බලපත්‍රය නිකුත් කිරීම නිවැරදි වේ.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) (i) 2013 ජූනි 28 වන දින නිකුත් කළ අංක DM/G3/30/3 දරණ ලිපිය අනුව පුරප්පාඩු පිරවිය නොහැකි වුවද අප විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන එම තනතුරු වල පුරප්පාඩු පුරවා ඇත. අප විසින් 2016 වර්ෂය තුළ කැණීම් ඉංජිනේරුවන් තුන්දෙනෙකු, රසායනාගාර උපස්ථායකවරු දෙදෙනෙකු හා කණිෂ්ඨ සේවකයන් හත්දෙනෙකු ස්ථිර සේවයට බඳවා ගෙන ඇත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් මෙම අනුමැතිය සහිතවය.

(ii) අධ්‍යක්ෂ (මූල්‍ය) අධ්‍යක්ෂ (පරිපාලන)තනතුරු මධ්‍යම මට්ටමේ නොව HM ඛාණ්ඩයේ ඇත.

(ආ) දැනට අනුමත වී ඇති ලිපිකරු තනතුරු සංඛ්‍යාව ප්‍රාදේශීය කාර්යාල 16ක්, උප කාර්යාල 03ක් සහ ප්‍රධාන කාර්යාලය සඳහා යෙදවීමේ දී ප්‍රමාණවත් නොවේ. අපගේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී නොමැති බැවින් තනතුරු සංඛ්‍යාව වැඩි කර ගැනීමට ද හැකියාවක් නොමැති බැවින් ඒ සඳහා බාහිර සේවා සපයන ආයතනයක් මඟින් සේවකයින් ලබා ගෙන ඇත.

(i) එම තනතුරු සඳහා බාහිර සේවා සපයන සමාගමක් මඟින් සේවකයින් ලබාගෙන ඇත. අදාල සේවකයින් කාර්යාංශයේ එක් එක් අංශ වල සේවය කරයි. අදාල සමාගමට ගෙවීමේදී ඔවුන් ඉටුකල කාර්යය එම අංශ වලින් තහවුරු කර ගනී.

(ii) මෙලෙස අදාල නිලධාරියාට රු. 53,000/- ක් ගෙවීමක් සිදුව නැත. මෙය වෙනත් සේවා සපයන ආයතනයකින් ලබාගන්නා සේවාවකි. එම ආයතනයට ගෙවිය යුතු අදාල මුදල වේ.

(iii) බාහිර සේවා සපයන ආයතන සිය සේවා සැපයීමේදී ඊට අදාල ඔවුන්ගේ පිරිවැය සහ ලාභාංශ අඩංගු වේ. මෙය වැටුප් ප්‍රතිපූර්ණයක් නොව සේවා වල ගෙවීමක් වේ. කාර්යාංශයේ බඳවා ගැනීමේ පටියාටිය අනුමතව නැති බැවින් සෘජු බඳවා ගැනීම් සිදුකළ නොහැක.

(ඇ) කාර්යාංශය පවත්වාගෙන යාම කළ යුතු බැවින් ඒ සඳහා මෙලෙස පුහුණුවන්නන් මඟින් අදාල කාර්යයන් සිදුකර ගත යුතුව ඇත. එහෙත් ස්ථිර සේවකයින් ගත් විටද මෙම පිරිවැය දැරීමට වනු ඇත.

(ඈ) මූල්‍ය අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු පිරවීම සඳහා මේ වනවිට ජාතික පුවත්පත් වල දැන්වීම් ඵලකර අයදුම්පත් කැඳවා ඇත.

(ඉ) මෙය අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සිදුව ඇත. අමාත්‍ය මණ්ඩල තීරණවලට එරෙහිව කටයුතු කළ නොහැක. අදාල මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස විදේශ කටයුතු අමාත්‍යාංශයට දන්වා ඇත.

(ඊ) අදාල නිලධාරීන්ට අයකර ගත යුතු දණ්ඩන මුදල සම්බන්ධව දැනුවත් කර ලිපියවා ඇති අතර, ඔවුන් නොගෙවුවහොත් ඇපකරුවන්ගෙන් අයකරණු ඇත.

4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

(අ) බදු කාලය තුළ ගිවිසුමේ 04 වගන්තියට අනුකූලව ඉඩම සංවර්ධනය කිරීම සඳහා අදාළ රජයේ ආයතනයන්ගේ අනුමැතිය යටතේ බදු ගැනුම්කරුට හැකි වේ. ගිවිසුම් කාලය අවසානයේදී හෝ ගිවිසුමේ 17 වන හා 18 වගන්ති ප්‍රකාරව බද්ද කලින් අවසාන වීමකදී එම ඉඩමෙහි කරන ලද සංවර්ධන කටයුතු බදු දීමනාකරුට හිමි වේ.

කෙසේ වුවද රජයේ අවශ්‍යතාවයන් සඳහා ඉඩම හෝ කොටසක් පවරා ගැනීමට තීරණය කරන අවස්ථාවකදී 16 (i) වගන්තියට අනුව රජයට ගනු ලබන කොටසට අදාළව, ගෙවන ලද බදු මුදල් හා සිදු කරන ලද සංවර්ධන කටයුතු වලට සරිලන වන්දියක් ලබා ගැනීමට බදු ගැණුම්කරුට හැකියාවක් ඇත.

(ආ) කාර්යාංශයේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් එම ප්‍රදේශයෙන් ලබාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකල නමුදු නගර සීමාවතුල ගොඩනැගිල්ලක් ලබාගැනීමට කාර්යාංශයට නොහැකි විය. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගෙන් කාර්යාංශයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් විමසීමෙන් අනතුරුව ඔහු දන්වා ඇත්තේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටි භූමිය වෙනත් රාජ්‍ය ආයතන වලටද ඔවුන්ගේ ආයතන ඉදිකිරීමට ලබාදී තිබෙන බැවින් කාර්යාංශයටත් ඉඩකොටසක් ලබාදීමට හැකියාවක් ඇති බවය. ඒ අනුව දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ මෙම ප්‍රාදේශීය කාර්යාලය අදාල භූමියෙහි ඉදිකරණා ලදී.

තවද කාර්යාංශය විසින් යල් පැන ගිය ලිපිගොනු ගම්පහ ගබඩා පරිශ්‍රයට ගෙන ගොස් ඇති අතර, එදිනෙදා කටයුතු වලට අවශ්‍ය ලිපිගොනු පමණක් එහි තබා ඇත. හදිසි අවශ්‍යතාවලට අවශ්‍ය වන පැරණි ලිපි ගොනු කිහිපයක් පමණක් ගොඩ ගසා ඇත. එසේ වුවද අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය අදාල ලිපිගොනු ආරක්ෂා සහිතව ගොඩ ගසා ඇති බව මේ වනවිට වාර්තා කර ඇත. මෙම ගොඩනැගිල්ල කාර්යාංශයට භාවිතා කළ හැකිමුත් අදාල පරිශ්‍රය කර්යාංශයට අත්පත් කර ගත නොහැක.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2018 - 2021 අදාල සංයුක්ත සැලැස්ම සකස් කිරීම මේ වනවිට සිදුවේ.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ - ආ) කාර්යාංශය පනත හා රෙගුලාසි වලට අනුකූලව පැවරී ඇති කාර්යයන් ඉටුකර ගැනීම සඳහා ඊට අදාල සෑම අංශයක්ම සහ ප්‍රාදේශීය කාර්යාලයක් සඳහාම එක් එක් වර්ෂයක් සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදුවේ.

(ඇ) 2018 වසර සිට ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී භෞතික ඉලක්ක සහ අදාල ඉලක්ක ගත මුල්‍ය ආදායම දැක්වීමට කටයුතු කර ඇත.

5.3 අභ්‍යන්තර විගණනය

(අ) විගණන මතය හා එකඟවේ. මෙය නියෝජ්‍ය අධ්‍යක්ෂ නොව අධ්‍යක්ෂ මට්ටමේ විය යුතු බව අපගේ මතය වේ. දැනට අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ අභ්‍යන්තර විගණක තබා ඇත්තේ නියේජ්‍ය අධ්‍යක්ෂක තබා තිබෙන (MM) මට්ටමේ වේ. මෙය නාමකරණයේ ගැටළුවක් පමණක් වන අතර, මෙය වෙනස් කිරීමට ඉදිරියේදී යෝජනා කළ හැක.

(ආ) කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට දැනට අනුයුක්තව රාජකාරි කරන නිලධාරීන් අ.පො.ස. (උ.පෙළ) වාණිජ අංශයෙන් සමත්ව ඇති අතර බාහිර උපාධි සමත්, වරලත් ගණකාධිකාරී විභාග සඳහා පෙනී සිටින සහ වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලිපිකරුවන්ද සිටී. මෙම ලිපිකරුවන් වසර 10 කට වැඩි කාලයක් අඛණ්ඩව විගණන අංශයේ රාජකාරි කිරීම් තුළින් ලබා ගත් ප්‍රායෝගික පුහුණුවට අමතරව බාහිර ආයතනවල පුහුණු වැඩ සටහන් වලට සහභාගි වීමෙන් න්‍යායික පුහුණුවද ලබා ඇත. විගණනය දක්වා ඇති පරිදි ඉදිරියේදී ක්‍රමවත් පුහුණු වැඩ සටහනක් සකස් කර අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කරනු ඇත.

(ඇ) කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම කළමණාකරණ දෙපාර්තමේන්තුවේ DMA/IML/2008 73-11 දරණ චක්‍ර ලේඛණය පදනම් කරගෙන එහි සඳහන් ආකෘතියට අනුව සකස් කරනු ලැබේ. ඒ අනුව කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සියළු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි විගණන සැලැස්ම සකස් කර ඇත. විගණනය පෙන්වා දී ඇති පරිදි එම කරුණුද සැළකිල්ලට ගෙන විගණන සැලැස්ම නැවත සංශෝධනය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඈ) භූ විද්‍යා අංශයේ 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් අනුව අභ්‍යන්තර විගණන වැඩ සටහනේ කාලය වෙන් කිරීම සිදුකර ඇත. නමුත් ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වී නොමැති බැවින් එම ක්‍රියාකාරකම්වල ඉදිරි ක්‍රියාකාරීත්වයට අනුව විගණන කාර්යයන් සිදු කිරීමට සැලසුම කර ඇත.

5. 4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 වාර්ෂික වාර්තාව 2016.06.16 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2015 වාර්ෂික වාර්තාව ද 2017.04.04 දින අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

5.5 අයවැය ලේඛනමය පාලනය

ක්ෂේත්‍ර අධීක්ෂණ - මේ සඳහා අයවැය ගත කරන ලද මුදල වෙනත් ආදායම් තුල ඇතුළත්වේ. භූ විද්‍යා අපනයන නිදර්ශක ආදායම - අපනයන ආදායම් අයිතම තුල මේ සඳහා ද මුදල් වෙන් කර ඇත. බැංකු ඇපකර සඳහා කාර්යාලීය ගාස්තු - මේ සඳහා මුදල් කැනීම් සම්බන්ධ මුදල් ආපසු ගෙවීමේ කාර්යාලීය ගාස්තු වල දැක්වෙන රු.586,000 තුල ඇතුළත්වේ. ප්‍රවාහන බලපත්‍ර මත සේවා ගාස්තු (ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව) - විගණනය පෙන්වා ඇති පරිදි මෙම ආදායම් අයිතමය සඳහා 2016 වර්ෂය සඳහා මුදල් වෙන් කර නොතිබෙන අතර, එයට හේතුවී ඇත්තේ මේ ආදායම් අයිතමය සඳහා පළමුවෙන් මුදල් උත්පාදනයවීම ආරම්භවී ඇත්තේ 2015 වර්ෂයේ අවසාන කාලයේදීය. එම අවස්ථාව වන විට 2016 වර්ෂය සඳහා අයවැය ලේඛනය සකස්කර අවසන් බැවින් ප්‍රවාහන බලපත්‍ර මත සේවාගාස්තු යන ආදායම් අයතමය සඳහා මුදල් වෙන් කිරීමක් සිදුකර නොමැත. විගණනය පෙන්වා ඇති පරිදි, කුලී ආදායම සඳහා ඇස්තමේන්තු ගත මුදල වන රු.500,000 ක උපයා ගැනීමට නොහැකිවූයේ, අප ආයතනයේ එක්කොටසක ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම පිහිටුවා තිබූ අතර, එය 2015 වර්ෂය අවසානයේදි වෙනත් ස්ථානයකට රැගෙන යාම නිසාය.

2016 අයවැය ලේඛණයට අනුව වියදම් අයිතමයන් කිහිපයක් සඳහා සත්‍ය ලෙස ගිය වියදම වැඩි වීමක් දක්නට ඇත. එනම් ආදායම් බදු 2016 අයවැය සකස් කිරීමේදී අදායම් බදු සඳහා තිබූ ප්‍රතිශතය 15% කි. නමුත් 2016 වර්ෂයේදී එම ආදායම් බදු ප්‍රතිශතය 28% දක්වා වැඩිවී ඇත. තවද අපේක්ෂා කල පොළී ආදායමට වඩා වැඩි පොළී ආදායමක් ලැබීම මතද ආදායම් බදු සත්‍ය වියදම වැඩිවී ඇත.යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම යන යන්ත්‍රෝපකරණ බොහොමයක් භාවිතා කරනු ලබන්නේ ව්‍යාපෘති සහ සිතියම් ගත කිරීමේ කටයුතු වල ක්ෂේත්‍ර කටයුතු සඳහාය. 2016 වර්ෂය තුලදී ව්‍යාපෘති සහ සිතියම් ගත කිරීමේ කටයුතු වැඩි ප්‍රමාණයක් සිදු කර ඇත. ඒ අනුව මෙම උපකරණ වල අලුත් වැඩියා කටයුතු වැඩි වශයෙන් කිරීමට සිදුව ඇත. අනෙකුත් වියදම් කාර්යාංශයේ කාර්යයන් කරගෙන යාමේදී දැරීමට සිදුවන වියදම් වන අතර කාර්යාංශය වැඩි ආදායමක් උපයා ගෙන තිබීමත් එයට සාපේක්ෂව වියදම්ද වැඩි වී ඇත.

(ආ) මේ සම්බන්ධව බලපත්‍රලාභීන් දැනටමත් දැනුවත් කර ඇත. පස් දමා වැසීමේදී පවතින භූගත ජල සංසරණයට හානි නොවන පරිදි පුනරුත්තාපන කටයුතු කළ යුතු බවට බලපත්‍රලාභීන්ට උපදෙස් ලබාදී ඇත.

(ඇ) බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවේදී එසේ උල්ලංඝනය සිදු නොකරන ලෙස අවවාධාත්මක ලිපි යොමු කරන අතර, බලපත්‍ර තාවකාලිකව අත්හිටුවීමක් සිදුකරනු ලබයි. ඉන්පසු නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව බලපත්‍රලාභීන්ට දැඩි අවවාධාත්මක ලිපි නිකුත් කර බලපත්‍රය බලසහිත කරනු ලැබේ. එසේ නොවන අවස්ථාවලදී බලපත්‍රය අවලංගු කිරීමට කටයුතු කර ඇත.

6. පද්ධති හා පාලනයන්

විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි පද්ධති හා පාලන ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට විශේෂ අවධානය යොමුකිරීමට සටහන් කර ගනිමු.

සභාපති

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

පිටපත් :- ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
ලේකම් - මුදල් අමාත්‍යාංශය

විගණන කමිටු වාර්තාව



"ස්වාභාවික සම්පත් සහ පරිසරය සුරැකීමේ කාර්යය තුළ නිරන්තරවම නිරත වී සිටිනා ජනතාවට විශ්වාසය තැබිය හැකි යහපාලන කාර්යරාමුවක් මත ක්‍රියාත්මක වන රජයට අයත් නියාමන ආයතනයක් බිහි කිරීම උදෙසා"

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ තුළ අන්තර්ගත මෙහෙයුම් මූලධර්ම මත පදනම්ව සකස් කරන ලද විගණනහා කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුවේ නීති හා රෙගුලාසි පැහැදිලිව විස්තර කර ඇත.

කළමනාකාරිත්ව මණ්ඩලය වෙත කමිටුව වගකිව යුතු වන අතර එහි රැස්වීම් කටයුතු පිළිබඳව කළමනාකාරිත්ව මණ්ඩලය වෙත නිරන්තරවම වාර්තා ලබා දෙනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ විගණන කමිටුව කළමනාකාරිත්ව මණ්ඩලයේ සාමාජිකාවන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, භාණ්ඩාගාර නියෝජිතයා විසින් එහි මුලසුන දරනු ලැබේ. එහි සාමාජිකයන් තිදෙනා පහත සඳහන් වේ.

1. සභාපති - පී.අල්ගම මහතා - (අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව)
2. සාමාජික - එන්. කේ. පී. කේ. නෙම්මවත්ත මහතා - (අතිරේක ලේකම් - පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය)
3. සාමාජික - රොහාන් ජයතිලක මහතා - (අධ්‍යක්ෂ - කර්මාන්ත හා වාණිජඅමාත්‍යාංශය)

විගණන හා කළමනාකරණ කමිටුවේ නීතිරීති හා වගකීම්

ආයතනයෙහි මූල්‍ය හා අනිකුත් කටයුතු හාසම්බන්ධ තම වගකීම් සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමට විගණන කළමනාකරණ කමිටුව කටයුතු කරයි. පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට කමිටුවට බලතල ලබා දී ඇත.

1. වාර්ෂික විගණන සැලැස්ම, වැඩසටහන, ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රාග්ධන අයවැය සමාලෝචනය කිරීම.

2. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය හා ගුණාත්මකභාවය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් තුළ සිදුවන යම් යම් වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාල ව්‍යවස්ථාපිත හා නියාමන අනුකූලතාවය වෙත ඒවායේ ඇති පිළිගැනීම සමාලෝචනය කිරීම

3. විගණන වාර්තා සහ අධ්‍යක්ෂ මන්ඩලයේ කළමනාකරණ තීරණ මත පදනම්ව ගිණුම්කරණ මූල්‍ය හා මෙහෙයුම් අංශ ආවරණය කරනු ලබන අභ්‍යන්තර මෙහෙයුම් පද්ධතිය සමාලෝචනය කිරීම හා ඇගයීමට ලක් කිරීම.

4. ප්‍රඥප්ති, නීති, රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛන හා නියෝගවල අනුකූලතාවය සමාලෝචනයට ලක් කිරීම

5. කමිටුවේ නිර්දේශ කළමනාකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

6. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පිරිවැය කෙරෙහි හා ඵලදායිත්වය කෙරෙහි සවිඥාණික ආයතනයක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව ආයතනයේ කාර්ය මණ්ඩලයේ විනය,කාර්යසාධනය සහ අනවශ්‍ය වියදම් සහ දූෂණ දුරලීම යන කරුණු සමාලෝචනය කිරීම

7. වංචාවන් පිළිබඳ අවදානම අඩුකිරීම සඳහා යෝග්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම කමිටුවේ රැස්වීම් 2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළදී කමිටුවේ රැස්වීම්4 ක් පවත්වන ලදී. කමිටුවේ රැස්වීම් කටයුතු පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු සටහන් කර නිරන්තරවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඒවා වාර්තා කරනු ලැබේ. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ සහභාගිත්වය පහත දැක්වේ. කමිටුවේ ආරාධනය මත විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ද වර්ෂය තුළදී රැස්වීම් සඳහා සහභාගි විය.

2016 දෙසැම්බර් මස 31 දින විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය

2016 වර්ෂය තුලදී පවත්වන ලද සම්පූර්ණ රැස්වීම් සංඛ්‍යාවෙන් සහභාගිත්වය දරන ලද රැස්වීම් සංඛ්‍යාව

පී.අල්ගම මහතා	4
එන්. කේ. ජී. කේ. නෙම්මවත්ත මහතා	4
රොහාන් ජයතිලක මහතා	4

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණකවරයකු විසින් ප්‍රධානත්වය දරනු ලබන ස්වකීයම වූ අභ්‍යන්තර විගණන අංශයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතුව ඇත. විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන වැඩසටහන් ඉදිරිපත් කර සම්මත කරනු ලැබූ අතර කමිටුව විසින් නිරන්තරවම අභ්‍යන්තර විගණනය සමාලෝචනය කිරීම හා අධීක්ෂණය කිරීම සහ එහි කටයුතු පරීක්ෂා කිරීම සිදුකරනු ලැබේ.

බාහිර විගණනය

වාර්තාවන අනනුකූල සිද්ධීන් සහ අක්‍රමවත් ගිණුම්කරණ හා වාර්තාකරණ ගැටළු නිසි කලට විසඳුනු ලබන බවට තහවුරු කිරීම සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තා විගණන හා කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ.

සමාප්තිය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අභ්‍යන්තර පාලනයන් කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කරනු ලබන බවට සහ ආයතනයේ සම්පත් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කරනු ලබන බවට විගණන කළමනාකරණ කමිටුව සෑහීමට පත්වෙයි. වර්ෂය පුරාම අභ්‍යන්තර හා විගණන අංශය ඵලදායී ලෙස සහ ස්වාධීන ලෙස කටයුතු කර ඇති බවට ද කමිටුව සෑහීමට පත්වෙයි. මීට අමතරව ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයේ යෝග්‍යතාවය පිළිබඳව ද කමිටුව සෑහීමට පත් වන අතර ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මුල්‍ය ප්‍රකාශන විශ්වාසනීය බවට සාධාරණ තහවුරුකිරීමක් ලබාදෙනු ලැබේ. තවද සමාලෝචිත වර්ෂයට අදාල අනනුකූල සිද්ධීන් පිළිබඳව ගන්නා ලද විශෝධන හා නිවාරණ ක්‍රියාමාර්ග සහ සියලුම අදාල නීති, රීති හා රෙගුලාසි හා අනුකූලව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය කටයුතු කරනු ලබන බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනුකූලතා කාර්යරාමුව විසින් වග බලා ගනු ලබන බවටද කමිටුව සෑහීමට පත්වෙයි.විගණන හා කළමනාකරණ කමිටුව විසින් 2017.03.06 දින මෙම වාර්තාව සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

පී.අල්ගම මහතා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික සමාජ වගකීම්

අධ්‍යාපනික වැඩසටහන්

(a) කාර්මික ගල්පර පිපිරවීම් සහතික පත්‍ර පාඨමාලාව :

ශ්‍රී ලංකාවේ ගල්පර පිපිරවීමේ කර්මාන්තයෙහි තාක්ෂණික හා අධීක්ෂණ මට්ටමේ සේවකයන් සඳහා තුන් මාසික සහතික පත්‍ර පාඨමාලාවක් ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගය ඇතිව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පතල් අංශය විසින් සංවිධානය කරන ලද අතර මෙය දිගු කලක් තිස්සේ පැවති අවශ්‍යතාවයන් සපුරාලීමක් විය.

පිපිරවීම් සඳහා යොදාගනු ලබන ද්‍රව්‍ය සහ ක්‍රමවේදයන් පිළිබඳව සහ ගල්පර පිපිරවීම් කටයුතුවලට අදාල සමාජ හා පාරිසරික බලපෑම් පිලිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ලබා දීම මෙම පිපිරවීම් පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ.

වාර්ෂිකව පැවැත්වීමට සැලසුම් කර ඇති මෙම වැඩසටහන මගින් ආරක්ෂක ප්‍රමිතින් හා පිපිරවීම්

ඵලදායිතාවය ඉහළ නැංවීම සිදු කරනු ඇත. 2016 වර්ෂය තුලදී මෙවැනි එක් වැඩසටහනක් සාර්ථකව නිම කරන ලදී.





(b) පතල් අංශය විසින් සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ

කැනීම් කටයුතු හා සම්බන්ධ ප්‍රධාන කාර්මික ගැටළුව නිරාකරණය කිරීම සහ පතල් හා බනිජ පනත ප්‍රකාරව කාර්යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන නියාමන කාර්යයන් පිළිබඳව රාජ්‍ය ආයතන, බලපත්‍රහිමියන් සහ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා පතල් අංශය විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. පතල් හා බනිජ පනත ක්‍රියාත්මක කිරීමේදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි අනිකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ පරිසරයට අදාල නීති හා කාර්යයන් පිලිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම මෙම වැඩමුළුවල ප්‍රධාන අරමුණු විය.

වැඩමුළුව / දැනුවත් කිරීමේ වැඩසටහන	දිනය	තේමාව
1. මාතලේ දිස්ත්‍රික්කයේ පාසල් තුනක පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	24.05.2016	පරිසරය සහ පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම් තුළින ඇතිවන ගැටළු
2. මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ ග්‍රාම නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	25.05.2016	කැනීම් බලපත්‍රවලට අදාල නීතිමය ක්‍රියා පටිපාටිය සහ ප්‍රායෝගික ගැටළු
3. ගල් කැඩීම සඳහා බලපත්‍රනිම් පුද්ගලයන් සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	26.05.2016	කැනීම් කටයුතු මගින් පරිසරයට ඇති කරනු ලබන ගැටළු
4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ බලපත්‍රලාභීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	03.06.2016	කැනීම් කටයුතු මගින් පරිසරයට ඇති කරනු ලබන ගැටළු
5. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	26.03.2016	පතල් හා බනිජ පනතෙහි නීතිමය පැතිකඩ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම
6. ගාල්ල දිස්ත්‍රික්කයේ පොලිස් පුහුණු විද්‍යාලයේදී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	25.08.2016	පතල් හා බනිජ පනතෙහි නීතිමය පැතිකඩ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම
7. මාතර දිස්ත්‍රික්කයේ යටියන හමුදා පවත්වන වැඩසටහන කඳවුරේ නිලධාරීන් සඳහා ලද දැනුවත් කිරීමේ	26.07.2016	පතල් හා බනිජ පනතෙහි නීතිමය පැතිකඩ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම
8. මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	අගෝස්තු 2016	කැනීම් බලපත්‍ර හා සම්බන්ධ නීතිමය ක්‍රියාපටිපාටිය සහ ප්‍රායෝගික ගැටළු
9. මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	අගෝස්තු 2016	කැනීම් බලපත්‍ර හා සම්බන්ධ නීතිමය ක්‍රියාපටිපාටිය සහ ප්‍රායෝගික ගැටළු
10. මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාන්ඩුව ප්‍රදේශයේ බලපත්‍රලාභීන් සඳහා පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන	03.06.2016	කැනීම් කටයුතු හේතුවෙන් පරිසරය තුළ ඇතිවන ගැටළු

ජාතික පාරිසරික දින වැඩසටහන්

a. ජාතික පාරිසරික දින වැඩසටහන - මාතලේ දිස්ත්‍රික්කය

2016 වර්ෂයේ ජාතික පාරිසරික දින වැඩසටහනට සමාන්තරව මාතලේ දිස්ත්‍රික්කය තුළ වැඩකටයුතු කිහිපයක් සිදු කරන ලදී.

(i) පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ චිත්‍ර තරඟ තෝරා ගත් පාසල් තුළ පවත්වන ලදී.













(ii) තෝරාගත් පාසල් තුළ මූලික අවශ්‍යතා සපුරාලන ලදී.











(iii) අඹන් ගඟ ඉවුරෙහි රුක් රෝපණ වැඩසටහන







b. 'වන රෝපණ'රුක් රෝපණ වැඩසටහන - බදුල්ල දිස්ත්‍රික්කය

බදුල්ල දිස්ත්‍රික්කයේ ගල් කඩන ස්ථානයන් අවට රජයේ නිලධාරීන්, කැනීම් බලපත්‍ර හිමියන් සහ ගම්වැසියන්ගේ සහභාගිත්වයෙන් රුක් රෝපණ වැඩසටහනක් 2016.11.29 දින පවත්වන ලදී.






නීති විරෝධී කැනීම් කටයුතු අවම කිරීම

පානදුර - වලාන පොලිස් ස්ථානයේ දූෂණ මර්දන ඒකකයේ සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අනුබද්ධ විදේශ කාර්ය බලකා නිලධාරීන්ගේ සහයෝගය ඇතිව නීති විරෝධී කැනීම් කටයුතු සිදු කරනු ලබන ස්ථාන වැටලීම් ගණනාවක් සාර්ථකව සිදු කරන ලදී.




කොළඹ ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීම

කොළඹ දිස්ත්‍රික්කයට අදාල කැනීම් බලපත්‍ර නිකුත් කිරීම ආශ්‍රිත කටයුතු නිසි ආකාරයකින් ඉටු කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන කාර්යාලයෙහි පාදස්ථ මහල තුළ ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී.





GSMB

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
වාර්ෂික වාර්තාව

www.gsmb.gov.lk